## සිව්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම් වලට අදාල 1991 ප්‍රධාන නීති අණපනත්


| | පිටුව |
|---|---|
| 1. 1991 අංක 4 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත. | I |
| 2. 1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත. | XXIX |
| 3. 1991 අංක 13 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත. | XXIX |
| 4. 1991 අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත. | XXX |
| 5. 1991 අංක 23 දරන මුදල් සමාගම් (සංශෝධන) පනත. | XXXII |
| 6. 1991 අංක 24 දරන රේගු (සංශෝධන) පනත. | XXXVII |
| 7. 1991 අංක 26 දරන සුරැකුම්පත් සභා (සංශෝධන) පනත. | XXXIX |
| 8. 1991 අංක 27 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත. | LXI |
| 9. 1991 අංක 33 දරන සමාගම් (සංශෝධන) පනත. | LXV |
| 10. 1991 අංක 49 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත. | LXVII |
| 11. 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත. | LXXXIV |
| 12. 1991 අංක 53 දරන විසර්ජන පනත. | LXXXVIII |


**නියෝග**


| | |
|---|---|
| 1. 1991 අංක 2 දරන හදිසි අවස්ථා (බැංකු විශේෂ විධිවිධාන) නියෝග | XCII |

## (1991 අංක 4 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 පෙබරවාරි මස 23 වන දින]

**1979 අංක 58 දරන ගොවිජන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1991 අංක 4 දරන ගොවිජන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 2 වන වගන්තිය එහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (3) අවසර පත්‍රය දරන්නා විසින්ම වගාකරනු ලැබිය යුතුය. යන කොන්දේසියට යටත්ව ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් දරන යම් තැනැත්තෙකු විසින් දෙන ලද බද්දක් මත ඒ කුඹුරු ප්‍රමාණය වගා කරන යම් තැනැත්තෙකු මේ පනතේ අර්ථානුකූලව අඳ ගොවියෙකු නොවන බව සැලකිය යුතුය.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි (1) වන උප වගන්තිය අගට මෙහි පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"මේ වගන්තියේ කාර්ය සඳහා අඳ ගොවියෙකුගේ කලත්‍රයකු විසින් හෝ වයස අවුරුදු දහ අටට අඩු බාල වයස්කාර දරුවෙකු විසින් වගාකරනු ලබන කුඹුරක් වන බව සැලකිය යුතුය.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) ඒ වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

" (3) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු, තමන් ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කරනු ලැබ ඇතැයි කොමසාරිස් වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙන අවස්ථාවක, ඒ තැනැත්තා අස් කරනු ලැබීද යන ප්‍රශ්නය තීරණය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් පරීක්ෂණ නිලධරයකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට සැලැස්විය යුතුය."

(ආ) ඒ වගන්තියේ (5) වන උප වගන්තියෙහි "කොමසාරිස්වරයා යන වචනය වෙනුවට "පරීක්ෂණ නිලධරයා" යන වචන ආදේශ කිරීමෙන්

(ඇ) ඒ වගන්තියේ (6) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(6) ඒ කඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ අස්කරනු ලැබූ තැනැත්තාට, පෞද්ගලිකව හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් ඒ පරීක්ෂණයේදී කරුනු දක්වා සිටීමේ අවස්ථාවක් ලබාදිය යුතුය ඒ පරක්ෂණයෙන් පසුව පරීක්ෂණ නිලධරයාගේ තීරණය, කොමසාරිස්වරයා වෙත ද ඉඩම් හිමියා වෙත ද අස්කරනු ලැබූ තැනැත්තා වෙතද ලියවිල්ලකින් දැනුම් දිය යුතුය ඒ තීරනයෙන් ඉඩම් හිමියා හෝ අස්කරනු ලැබූ තැනැත්තා අතෘප්තියට පත්වූවේ නම්, තමා වෙත ඒ නිවේදනය කරනු ලැබීමෙන් පසු තිස් දවසක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අනෙක් තැනැත්තා වගඋත්තරකරු ලෙස සඳහන්කොට ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින්, ඒ කඹුරු ප්‍රමාණය පිහිටා ඇති පළාත සඳහා

IV අ කොටස යටතේ පත්කර ඇති සමාලෝචනය මණ්ඩලය වෙත, ඔහු විසින් නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනය කළ හැකිය. ඒ පෙත්සමේ පිටපතක්, එම අභියාචනය කරන අවස්ථාවේදීම කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය. ඉඩ දෙනු ලැබූ කාලය ඇතුළත ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් කරනු නොලැබූ අවස්ථාවක, ඒ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර, එය කිසිම අධිකරණයක දී ප්‍රශ්නයට භාජනය නොකළ යුතුය." ;

(ඇ) ඒ වගන්තියේ (7) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

(7) (3) වන උප වගන්තියේ සඳහන් යම් පරීක්ෂණයකදී :-

(අ) අස් කිරීම තහවුරු වී ඇති බව පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කරනු ලදුව, ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් කිරීමට ඉඩ දී ඇති කාලසීමාව ඇතුළත අභියාචනයක් කර නොමැති අවස්ථාවක හෝ අස් කිරීම තහවුරු වී ඇති බවට වූ පරීක්ෂණ නිලධරයාගේ තීරණය සමාලෝචන මණ්ඩලය විසින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවකත හෝ

(ආ) අස් කිරීම තහවුරු වී නොමැති බව පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කරනු ලදුව අභියාචනයේදී සමාලෝචන මණ්ඩලය විසින් පරීක්ෂණ නිලධරයාගේ තීරණය වෙනස් කොට අස් කිරීම තහවුරු වී ඇතැයි තීරණය කළ අවස්ථාවක :-

(i) අස් කරනු ලැබූ තැනැත්තාට, ඒ කුඹුරු ප්‍රමාණයෙහි ප්‍රයෝජනය සහ බුක්තිය ආපසු ලැබීමට හිමිකම් තිබිය යුතුය.;

(ii) අවස්ථාවෝචිත පරිදි පරීක්ෂණ නිලධරයාගේ හෝ සමාලෝචන මණ්ඩලයේ හෝ තීරණය තමාට ලැබුනු විට, කොමසාරිස්වරයා විසින් ලිඛිත නියමයක් මගින් එහි නිශ්චිතව සඳහන් දිනයක හෝ ඉන් පෙර, ඒ කුඹුරු ප්‍රමාණය බුක්තියට ගෙන සිටින සෑම තැනැත්තෙකුම එයින් ඉවත් විය යුතු යයි නියම කළ යුතුය. ඒ තැනැත්තා ඒ නියමය පිළිපැදීම පැහැර හැරියහොත්, 6 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කරනු ලැබිය යුතුය. තවද

(iii) (i) වන අනුඡේදයේ සඳහන් තැනැත්තා අස් කරන ලද්දේ ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාගේ දැනුම, කැමැත්ත හෝ ගුප්තානුකූලතාව නොමැතිව බව පරීක්ෂණ නිලධරයා විසින් හෝ සමාලෝචන මණ්ඩලය විසින් හෝ තීරණය කර ඇත්නම් මිස, ඒ තැනැත්තා අස් කරනු ලැබූ දිනයෙන් ආරම්භව, ඔහුට සන්තකය ආපසු ලබාදෙන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත එක් එක් දවස සඳහා, නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයන් අනුව, ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින්, ඒ තැනැත්තාට අලාභ ගෙවිය යුතුය;

එසේ වුවද මේ මේ අනුඡේදයේ සඳහන් කර ඇති කාලසීමාවෙන් එම කුඹුරු ප්‍රමාණය 38අ වගන්තිය යටතේ වගා කරනු ලැබ තිබිය හැකි යම් කොටසක් වෙනුවෙන් කිසි අලාභයක් නොගෙවිය යුතුය.";

(ඉ) ඒ වගන්තියේ (9) වන උප වගන්තියේ දෙවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :-

"එසේම තවදුරටත්, යම් කුඹුරු ප්‍රමාණයක් බදු ගැනුම්කරුවෙකු විසින්, ඒ කුඹුරු ප්‍රමාණයේ
අයිතිකරුගෙන් ලිඛිත කැමැත්ත ලබා නොගෙන, අතුරු අඳ ගොවියෙකුට බදු දෙනු

ලැබ ඇති අවස්ථාවක :-

(අ) ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් කිසි අඳ ගොවි අයිතිවාසිකමක් ලැබීමට අතුරු අඳ ගොවියාට හිමිකම නොමැති විය යුතුය.

(ආ) කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන දිනයක දී හෝ දිනයකට පෙර ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්වන ලෙස අතුරු අඳ ගොවියාට නියම කළ යුතු අතර, ඒ නියමය අනුව ක්‍රියා කිරීම අතුරු අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුව හොත්, 6 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කළ යුතුය;

(ඇ) 4 වගන්තියේ (5) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ කුඹුරු ප්‍රමාණය වගාකිරීමට කුඹුරු හිමියා හිමිකම් ලැබිය යුතුය"

(ඊ) ඒ වගන්තියේ (11) වන වගන්තියට ඉක්බිතිවම, ඒ වගන්තියේ (11අ) උපවගන්තිය ලෙස බල පැවැත්විය යුතු මෙහි පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන්

"(11අ) 1988 අංක 79 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත මගින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ LXVI වන පරිච්ඡේදයට ඇතුළත් කරන ලද කිසිවක් මගින් මේ පනතේ අර්ථානුකූලව කුඹුරු ඉඩමක් කෙරෙහි බලපාන්නා වූ ආරවුලක් සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් පැවැත්වීමට හෝ ආඥාවක් කිරීමට හෝ වුලාය වන අධිකරණයක විනිශ්චයකාරවරයෙකුට බලය ලබා දෙතැයි තේරුම් නොගත යුතුය".

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය සහ 5ආ වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය. :-

5අ. (1) විහාරස්ථානයක් කෝවිලක් හෝ පල්ලියක් හෝ මුස්ලිම් දේවස්ථානයක් සතු අක්කර දෙකක් නොයික්ම වන ඉඩම් ප්‍රමාණයක්, මේ පනතේ 2වන වගන්තිය අදාළවීමෙන් නිදහස් කරවා ගැනීම පිණිස, යම් විහාරස්ථානයක, කොවිලක හෝ පල්ලියක, විහාරාධිපතිවරයා හෝ නායක පූජකවරයා විසින්, නැතහොත් මුස්ලිම් දේවස්ථානයක භාරකරු විසින්, මේ වගන්තිය පනවනු ලැබීමෙන් පසු මාස දොළහක් ඇතුළත කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කළ හැකිය.

(2) කොමසාරිස්වරයා විසින් ඒ ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර ඒ කුඹුරු ප්‍රමාණයේ යම් අඳ ගොවියෙකු සිටීනම්, ඒ පරීක්ෂණයේදී කරුණු කියා සිටීමට ඔහුට අවස්ථාවක් ලබාදිය යුතුය. ඉන් පසුව එම විහාරස්ථානය, කෝවිල පල්ලිය හෝ මුස්ලිම් දේවස්ථානය පිළිබඳ නඩත්තුව සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි අක්කර දෙකක් නොයික්මවන බිම් ප්‍රමාණයක්, 2 වන වගන්තියේ විධිවිධානවල බලපෑමෙන් නිදහස්කිරීමේ තීරණය කොමසාරිස්වරයා විසින් ගත යුතුය. තවද ඉල්ලුම් කරු විසින් එක් එක් අඳ ගොවියාට ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය සහ එය ගෙවිය යුත්තේ කිනම් දිනකට පෙරද යන වගද කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය.

(3) කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව සමාලෝචන මණ්ඩලයට අභියාචන කළ හැකි අතර, කොමසාරිස්වරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ වෙනස් කිරීම සමාලෝචන මණ්ඩලය විසින් කළ හැකිය. ඒ අභියාචනය පිළිබඳ සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

(4) සමාලෝචන මණ්ඩලයට අභියාචනයක් කරනු ලැබූ තැනැත්තා වූ හෝ අභියාචනයක් කරන ලදුව සමාලෝචන මණ්ඩලය කොමසාරිස්වරයාගේ තීරණය

ස්ථිර කරනු ලැබ ඇත්තා වූ හෝ අවස්ථාවක නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චය කොටදැක්වෙන දිනයකදී හෝ ඊට පෙර ඉඩමෙන් ඉවත්වන ලෙස කොමසාරිස්වරයා විසින් අඳ ගොවියාට නියම කළ යුතුය.

(5) ඒ නියමය අනුව ඉඩම් ප්‍රමාණයෙන් ඉවත්වීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ඔහු ඉවත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කොමසාරිස්වරයා විසින් එවැනි අඳ ගොවියෙකු ඉවත් කිරීම සඳහා කටයුතු කළ යුත්තේ මේ වගන්තිය යටතේ ඔහුට අයවිය යුතු යම් වන්දි මුදලක්, ඉල්ලුම්කරු විසින් සම්පූර්ණයෙන් ගෙවා ඇත්නම් පමණකි.

5ආ. (1) යම් කුඹුරුහිමියෙකුගේ එකම ආදායම් මාර්ගය ඔහුගේ අඳ ගොවියන් විසින් ගෙවනු ලබන අඳය වන්නේ ද, ඒ කුඹුරු හිමියා විසින් මේ පනතේ 2වන වගන්තිය අදාළ වීමෙන් නිදහස්කර ගැනීමක් සඳහා, මේ වගන්තිය පනවනු ලැබීමෙන් පසු මාස දොළහක් ඇතුළත, කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කළ හැකිය. මේ වගන්තියේ කාර්ය සඳහා කුඹුරු හිමියකුගේ කලත්‍රයාට හෝ වයසින් අවුරුදු දහ අටට අඩු බාල වයස්කාර දරුවකුට අයත් යම් කුඹුරු ප්‍රමාණයක් ඒ කඹුරු හිමියාට අයත් කුඹුරු ලෙස සලකනු ලැබිය යුතුය.

(2) කොමසාරිස්වරයා විසින්, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂනයක් පැවැත්විය යුතු අතර, ඒ කුඹුරු ඉඩමේ යම් අඳ ගොවියකු සිටී නම් ඒ පරීක්ෂණයේදී කරුණු කියා සිටීමට ඔහුට අවස්ථාවක් ලබා දිය යුතුය. (1) වන උප වගන්තියේ නියමයන් සපුරා ඇත්නම්, ඒ ඉඩමෙන් අක්කර එකක් නොඉක්මවන ප්‍රමාණයක්, 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරන තීරණයක්, කොමසාරිස්වරයා විසින් කළ යුතුය. තවද, ඉල්ලුම්කරු විසින් එක් එක් අඳ ගොවියාට ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය සහ එහි ගෙවිය යුත්තේ කිනම් දිනයකට පෙර ද යන වග ද කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතුය.

(3) කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තකු විසින්, ඒ තීරණයට විරුද්ධව සමලෝචන මණ්ඩලයට අභියාවන කළ හැකි අතර, කොමසාරිස්වරයාගේ තීරණය ස්ථිර කිරීම හෝ වෙනස් කිරීම, සමාලෝචන මණ්ඩලය විසින් කළ හැකිය. ඒ අභියාවනය පිළිබඳ සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

(4) සමාලෝචන මණ්ඩලයට අභායාවනයක් කරනු ලැබූ තැනැත්තා වූ හෝ අභියාවනයක් කරන ලදුව සමාලෝචන මණ්ඩලය කොමසාරිස්වරයාගේ තීරණය ස්ථිර කර ඇත්තා වූ හෝ අවස්ථාවක, නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන දිනයකදී හෝ ඊට පෙර, ඉඩමෙන් ඉවත්වන ලෙස, කොමසාරිස්වරයා විසින් අඳ ගොවියාට හෝ අඳගොවියන්ට නියම කළ යුතුය.

(5) ඒ නයමය අනුව ඉඩම් ප්‍රමාණයෙන් ඉවත්වීම යම් අඳ ගොවියකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, 6 වගන්තියේ විධිවිධාන යටතේ ඔහු ඉවත් කරනු ලැබිය හැකිය. එසේ වුවද කොමසාරිස් වරයා විසින් එවැනි අඳ ගොවියකු ඉවත් කිරීම සඳහා කටයුතු කළ යුත්තේ, මේ වගන්තිය යටතේ ඔහුට අයවිය යුතු යම් වන්දි මුදලක්, ඉල්ලුම්කරු විසින් සම්පූර්ණයෙන් ගෙවා ඇත්නම් පමණකි.";

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) යම් කුඹුරු ප්‍රමාණයක් වෙනත් යම් අඳ ගොවියකු සමග හවුලේ හෝ තට්ටු මාරුවට හෝ ගොවිතැන් කරන අඳ ගොවියකු නොවන අඳ ගොවියකු මිය ගිය අවස්ථාවක, ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳව මේ පනත යටතේ ඒ අඳ ගොවියාගේ අයිතිවාසිකම්, ඒ අඳ ගොවියාගේ ජීවත්ව සිටින කලත්‍රයා වෙතද එවැන්නකු නොමැති විට දරුවන් එක්කෙනෙකුට වඩා වැඩියෙන් සිටිත් නම් ඔවුන් අතුරෙන් වැඩිමලාට ප්‍රමුඛතාව ලැබෙන සේ, ඒ අඳ ගොවියාගේ එක් දරුවකු පමණක් වෙතද උරුම විය යුතුය. එසේ වුව ද, ඒ මිය ගිය අඳ ගොවියා ගේ අයිතිවාසිකම්වලට හිමිකම් ලබන අනුප්‍රාප්තිකයා ස්ථිර සේවා නියුක්තියක නොයෙදුනු සහ තම ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන් කිරීම වන තැනැත්තකු විය යුතුය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) අවශ්‍ය යැයි කොමසාරිස්වරයා සලකන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව සහ එවැනිම නියමයන් මත ඔහු විසින් දෙනු ලබන ලිඛිත අනුමතය ඇතිව යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ ඔහුගේ අයිතිවාසිකම් ඔහුගේ ඉඩම් හිමියා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරුද වේ නම්, ඒ ඉඩම් හිමියාට පවරා දිය හැකිය. ඒ පැවරීම මේ උප වගන්තියේ මින් ඉදිරියට ඇති විධිවිධානවලට අනුකූල විය යුතුය.:-

(අ) කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ ඔහුගේ සම්බන්ධතාව පවරාදීමට අදහස් කරන අවස්ථාවක, ඔහු එසේ අදහස් කරන බව සහ ඔහු ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ තමාගේ සම්බන්ධතාව පැවරීමට අදහස් කරන මිළ, ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරුට ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. ඒ කුඹුරු ප්‍රමාණය පිහිටා ඇත්තේ යම් ගොවිජන සේවා කාරක සභාවක බල ප්‍රදේශය ඇතුළත ඒ ගොවිජන සේවා කාරක සභාව වෙත, ඒ දැන්වීමේ පිටපතක් අඳ ගොවියා විසින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

(ආ) ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ අඳ ගොවියාගේ සම්බන්ධතාව, අඳ ගොවියා විසින් නම් කරන ලද මිළට මිළදී ගැනීමට අයිතිකරු කැමති නම්, අයිතිකරු විසින් ඔහුගේ කැමැත්ත ගොවිජන සේවා කාරක සභාව වෙත ප්‍රකාශ කළයුතු අතර ඒ පැවරීම සම්පූර්ණ කළ යුතු කාලසීමාවක් එම කාරක සභාව විසින් නියම කළ යුතුය.

(ඇ) ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ අඳ ගොවියාගේ සම්බන්ධතාව මිළදී ගැනීමට අයිතිකරු කැමති නම්. එහෙත් අඳ ගොවියා විසින් නම් කර ඇති මිළ අධික බව අයිතිකරු ප්‍රකාශ කරන්නේ නම්, ගොවිජන සේවා කාරක සභාව විසින් අඳ ගොවියා විමසා, කාරක සභාවේ මතය අනුව සාධාරණ වන්නාවූ මිළක් නියම කර, ඒ පැවරීම සම්පූර්ණ කළ යුතු කාලසීමාවක් නියම කළ හැකිය.

(ඈ) ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ අඳ ගොවියාගේ සම්බන්ධතාව මිළදී ගැනීමට අයිතිකරු අකමැති වන්නා වූ හෝ ගොවිජන සේවා කාරක සභාව විසින් නිශ්චය කරන ලද මිළට එය මිළදී ගැනීමට අකමැති වන්නා වූ හෝ අවස්ථාවෝචිත පරිදි අඳ ගොවියා විසින් නම් කරන ලද මිළට හෝ ගොවිජන

සේවා කාරක සභාව විසින් නිශ්චය කරන ලද මිළට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිළදී ගැනීමට එකී අයිතිකරු එකඟවීමෙන් පසුව, පැවරීම සම්පූර්ණ කිරීම සඳහා නියම කර තිබෙන කාලසීමාව ඇතුළත පැවරීම සම්පූර්ණ නොකරන්නා වූ හෝ අවස්ථාවක, ගොවිජන සේවා කාරක සභාව විසින් ඒ බවට සහතිකයක් නිකුත් කළ යුතුය.";

(ආ) ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙහි "යම් පැවරීමක් හෝ ආපසු දීමක්" යන වචන වෙනුවට "යම් පැවරීමක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ වගන්තියේ (4) වන උප වගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(ඈ) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "පැවරීම හෝ ආපසු දීම" යන වචන වෙනුවට "පැවරීම" යන වචනය ආදේශ කිරීමෙන්.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එහි 12අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය. :-

12අ. (1) අඳ ගොවියකු සිටින යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක ඉඩම් හිමියා ඒ ඉඩම් ප්‍රමාණය විකිණීමට අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් පළමුකොට ඔහුගේ එම අදහස සහ ඒ ඉඩම් ප්‍රමාණය විකිණීමට ඔහු අදහස් කරන මිළ අඳ ගොවියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය පිහිටා ඇත්තේ යම් ගොවිජන සේවා කාරක සභාවක බල ප්‍රදේශය ඇතුළත ද ඒ කාරක සභාව වෙත ඒ දැන්වීමේ පිටපතක් ඉඩම් හිමියා විසින් ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.

(2) ඉඩම් හිමියා විසින් නම් කරන ලද මිළට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිළදී ගැනීමට අඳ ගොවියා කැමති නම්, ඔහු විසින්, තම කැමැත්ත ගොවිජන සේවා කාරක සභාවට දැන්විය යුතු අතර, පැවරීම සම්පූර්ණ කළ යුතු කාලසීමාවක් ඒ කාරක සභාව විසින් නියම කළ යුතුය.

(3) ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිළදී ගැනීමට අඳ ගොවියා කැමති නම්, එහෙත් ඉඩම් හිමියා විසින් නම්කරන ලද මිළ අධික බව අඳ ගොවියා ප්‍රකාශ කරන්නේ නම්, ගොවිජන සේවා කාරක සභාව විසින් ඉඩම් හිමියා විමසා, කාරක සභාවේ මතය අනුව සාධාරණ වන්නා වූ මිළක් නිශ්චය කර, ඒ පැවරීම සම්පූර්ණ කළ යුතු කාලසීමාවක් නියම කළ හැකිය.

(4) ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිළදී ගැනිමට අඳ ගෙවියා අකමැති වන්නා වූ හෝ ගොවිජන සේවා කාරක සභාව විසින් නිශ්චය කරන ලද මිළට, එය මිලදී ගැනීමට අකමැතිවන්නා වූ හෝ අවස්ථාවෝචිත පරිදි ඉඩම් හිමියා විසින් නම් කරන ලද මිලට හෝ ගොවිජන සේවා කාරක සභාව විසින් නිශ්චය කරන ලද මිලට ඒ කුඹුරු ඉඩම් ප්‍රමාණය මිළදී ගැනීමට එකී අඳ ගොවියා එකඟ වීමෙන් පසුව, පැවරීම සම්පූර්ණ කිරීම සඳහා, නියම කර තිබෙන කාලසීමාව ඇතුළත පැවරීම සම්පූර්ණ නොකරන්නා වූ හෝ.අවස්ථාවක, ගොවිජන සේවා කාරක සභාව විසින් ඒ බවට සහතිකයක් නිකුත් කළ යුතු අතර, එවිට එම කුඹුරු ඉඩම් ප්‍රමාණය වෙනත් කවර හෝ තැනැත්තෙකුට විකිණීමට ඉඩම් හිමියා විසින් කටයුතු කළහැකිය.

(5) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක අයිතිකරු විසින් කරනු ලබන පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන අතර ඒ කුඹුරු ඉඩම් ප්‍රමානයෙහි බුක්තිය දරණ තැනැත්තා 6 වන වගන්තියට අනුකූලව ඉවත් කරනු ලැබීමට යටත් වන්නේය තවද එවැනි ඉවත් කිරීමකදී 4වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන අදාල විය යුතුය.";

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, එහි "නාමයෝජිත අනුප්‍රාප්තිකයකු හෝ" යන වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි "තමා ඒ කුඹුරු ප්‍රමාණය වගාකිරීමට අපොහොසත් බව" යන වචන වෙනුවට "තමා නිවේදනයේ නිශ්චය කොටදක්වා ඇති හේතු නිසා, ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අපොහොසත් බව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**12**. මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 16 වන වගන්තියට ඉක්බිතිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 16අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.-

16අ. (1) යම් වී වගා කන්නයකදී වගා කළ හැකිව තිබියදී යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි යම් බෝගයක් වගාකිරීම, හිතාමතාම පැහැර හැර තිබෙන බව ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින් අඳ ගොවියාට පිටපතක් සහිතව කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබූ අවස්ථාවක, පරීක්ෂණ නිලධරයෙකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස් වරයා විසින් සලස්වනු ලැබිය හැකි අතර, එම කුඹුරු ප්‍රමානයෙහි යම් භෝගයක් වගා කිරීම අඳ ගොවියා විසින් හිතාමතාම පැහැර හැර තිබෙන බව පරීක්ෂණයෙන් පසුව පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කරනු ලැබුව හොත් 17 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ කන්නය සඳහා ඒ කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් ඉඩම් හිමියාට බදු කුලිය ගෙවීමට ඒ අඳ ගොවියා යටත් විය යුතුය

(2) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා විසින් ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීම, වගා කළ හැකිව තිබුණු අනුක්‍රමික වී වගා කන්න දෙකකදී හෝ ඊට වැඩි සංඛ්‍යාවකදී හිතාමතාම පැහැර හැර තිබෙන බව, ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින් අඳ ගොවියාට පිටපතක් සහිතව, කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබූ අවස්ථාවක, පරීක්ෂණ නිලධරයෙකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් සලස්වනු ලැබිය යුතු අතර, අඳ ගොවියා විසින් එම කුඹුරු ප්‍රමාණය වගා කිරීම අනුක්‍රමික වී වගා කන්න දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් එසේ පැහැර හැර තිබෙන බව ඒ පරීක්ෂණයෙන් පසුව පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කරනු ලැබුව හොත්, එම අඳ ගොවියාට ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්වන ලෙස කොමසාරිස්වරයා විසින් නියම කළ යුතු අතර, ඒ නියමය අනුව ක්‍රියා කිරීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත්, 6 වන වගන්තියට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් කරනු ලැබිය යුතුය. එසේ ඉවත් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් පසුව, 4 වන වගන්තියේ (5) වන උප වගන්තියේ විධිවිධාන අදාල විය යුතුය

(3) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා විසින් ඒ කුඹුරු ප්‍රමාණය වගාකිරීම, ඒ කුඹුරු ප්‍රමාණයෙහි අස්වැන්න, දිස්ත්‍රික්කයේ ඒ හා සමාන කුඹුරු ප්‍රමාණයක සාමාන්‍ය අස්වැන්නට වඩා පහත වැටෙන පරිදි අනුක්‍රමික වගා කන්න දෙකක් හෝ ඊට වැඩි ගණනක් තුල නොසලකා හැර තිබෙන බව, ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින්, අඳ ගොවියාට පිටපතක් ඇතිව කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබූ අවස්ථාවක, පරීක්ෂණ නිලධරයෙකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් සලස්වනු ලැබිය යුතු අතර, අඳ ගොවියා විසින් එම කුඹුරු ප්‍රමාණය වගාකිරීම එසේ නොසලකා හැර තිබෙන බව ඒ පරීක්ෂණයෙන් පසුව පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කරනු ලැබුවහොත් එම අඳ ගොවියාට, ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්වන ලෙස කොමසාරිස්වරයා විසින් නියම

කළ යුතු අතර, ඒ නියමය අනුව ක්‍රියාකිරීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත්, 6 වන වගන්තියට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් කරනු ලැබිය යුතුය. එසේ ඉවත් වීමෙන් හෝ ඉවත්කරනු ලැබීමෙන් පසුව, 4 වන වගන්තියේ (5) වන උප වගන්තියේ විධිවිධාන අදාල විය යුතුය

4. විහාරස්ථානයකට, කෝවිලකට, පල්ලියකට, දළදා මාලිගාවට, දේවාලවලට සහ විහාරස්ථානවලට හෝ මුස්ලිම් දේවස්ථානයකට අයත් යම් කුඹුරු ප්‍රමානයක අඳ ගොවියා ඒ කුඹුරු බිම් ප්‍රමාණය ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් හුවමාරු වශයෙන් ඔහු විසින් ඒ විහාරස්ථානයට, කෝවිලට, පල්ලියට, දලදා මාලිගාවට, දේවාල වලට හෝ විහාරස්ථානවලට හෝ මුස්ලිම් දේවස්ථානයට ඉටු කිරීමට නියමිත සේවාවන් ඉටු කිරීම හෝ ඒ සේවාවන් වෙනුවට, යුක්තිසහගතයයි කොමසාරිස්වරයා විසින් තීරණය කරන මුදල් ප්‍රමාණයක් ඒ විහාරස්ථානයට, කෝවිලට, පල්ලියට, දළදා මාලිගාවට, දේවාලවලට සහ විහාරස්ථානවලට හෝ මුස්ලිම් දේවස්ථානයට ගෙවීම හෝ පැහැර හැර ඇති බව ඒ විහාරස්ථානයේ හෝ කෝවිලේ හෝ පල්ලියේ විහාරාධිපතිවරයා හෝ නායක පූජකවරයා, විසින් හෝ දළදා මාලිගාවේ දියවඩන නිළමේතුමා විසින් හෝ දේවාලවල සහ විහාරස්ථානවල බස්නායක නිළමේවරුන් සහ භාරකරුවන් විසින් නැතහොත් මුස්ලිම් දේවස්ථානයේ භාරකරු විසින් ඒ අඳ ගොවියාට පිටපතක් සහිතව කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබූ අවස්ථාවක පරීක්ෂණ නිලධරයකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් සලස්වනු ලැබිය යුතු අතර, එම සේවාවන් ඉටු කිරීම හෝ එම සේවාවන් වෙනුවට ඒ මුදල් ප්‍රමාණය ගෙවීම, අඳ ගොවියා විසින් පැහැර හැර තිබෙන බව, ඒ විභාගයෙන් පසුව, පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කරනු ලැබුවහොත්, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත්වන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ අඳ ගොවියාට නියම කළ යුතු අතර, ඒ නියමය අනුව ක්‍රියා කිරීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත්, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, 6 වන වගන්තියට අනුකූලව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් කරනු ලැබිය යුතුය. එසේ ඉවත් වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් පසුව 4 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.,

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, එහි (2) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උප වගන්තිය යටතේ කරන ලද නිශ්චයක් අදාළ වන යම් ප්‍රදේශයක පිහිටි යම් කුඹුරු ප්‍රමාණයකින් උපද වන මුළු අස්වැන්නෙන් මේ පහත යටතේ නියමිත යම් අය කිරීමක ප්‍රමාණය අඩු කළ විට ඉතිරි කොටසෙන් හතරෙන් එක් පංගුවකට නොවැඩි කොටසක් ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කරන එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද වශයෙන් ඒ නිශ්චය මගින් සඳහන් කළ යුතුය.,

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, එහි (1) උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

"(1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීම අඳ ගොවියා විසින් හිඟ තබා ඇතිබව ඉඩම් හිමියා කොමසාරිස්වරයාට දන්වා සිටි විට, පරීක්ෂණ නිලධරයකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් සැලැස්විය යුතු අතර, බද්ද හිඟ තබා ඇති බව පරීක්ෂණ නිලධරයා විසින් තීරණය කර එම තීරණය කොමසාරිස්වරයා, වෙත දන්වනු ලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා අඳ ගොවියාට ලිඛිත දැනුම් දීමක් කරමින්, එම දැන්වීමෙහි නිශ්චය කොට දැක්වෙන කාලය ඇතුළත

එම හිඟ මුදල් ගෙවීම පැහැර හැරියහොත් එම කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් ඔහුගේ අඳය අවසන් කරන බව දැනුම් දිය යුතුය.,

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි තිස්වන, යන වචන යෙදෙන සෑම තැනකම ඒ නුවට "පසලොස්වන" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) ඒ වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියාගෙන් හිඟ බවට පැමිණි බදු වශයෙන් හෝ ඒ බද්ද වෙනුවෙන් වූ පොලී වශයෙන් හෝ ඒ දෙවිධියෙන්ම හෝ ඔහුගේ ඉඩම් හිමියාට යම් මුදලක් අයවිය යුතුව ඇති විට, මේ වගන්තිය යටතේ නියමයක් සඳහා ඉඩම් හිමියා විසින් ලිඛිත ඉල්ලීමක් කළ හැකි අතර. එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධරයකු ලවා පරීක්ෂණයක් පැවැත්වීමට කොමසාරිස්වරයා විසින් සැලැස්විය යුතුය. ඒ මුදල අඳ ගොවියාගෙන් ඉඩම් හිමියාට අයවිය යුතුව ඇති බව පරීක්ෂණ නිලධරයා තීරණය කලහොත් ඒ මුදල., නියමයෙහි නිශ්චය කොට දැක්වෙන යම් ආකාරයකට සහ කාලසීමාවක් ඇතුළත, වී වලින් හෝ මුදලින් හෝ වී සහ මුදල් යන දෙකින්ම හෝ ගෙවීම සඳහා කොමසාරිස්වරයා විසින් නියමයක් කළ යුතුය. "; තවද

(ආ) ඒ වගන්තියේ (2) වන උප වගන්තියෙහි "(1) වන උප වගන්තිය යටතේ වූ නියමයෙන් දෙන ලද කාලය තුල ඒ මුදල ගෙවීම ඒ අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත්" යන වචන වෙනුවට "(1) වන උප වගන්තියේ සඳහන් නියමය අනුව ක්‍රියා කිරීම අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත්" යන වචන ආදේශ කිරීමෙන්

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ.) එහි (1) වන උප වගන්තියෙහි "එම ඉඩමේ අයිතිකරුට ඇති අයිතිවාසිකම" යන වචන වෙනුවට "එම ඉඩමේ අයිතිකරුට හෝ බුක්තිකරුට ඇති අයිතිවාසිකම" යන වචන ආදේශ කිරීමෙන් සහ

(ආ) එහි (2) වන උප වගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(3) ඉහත කී පරිදි වූ යම් අසන්තක කිරීමේ නියමයකින් අතෘප්තියට පත් කවර හෝ තැනැත්තෙකු විසින්, ඒ නියමයට විරුද්ධව ඒ නියමයේ දින සිට දවස් තිහක් ඇතුළත අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකිය එවැනි අභියාචනයක් කරනු ලැබූ විට, ලේකම්වරයා විසින් ඒ නියමහ ස්ථිර කිරීම හෝ ඉයවකලීම හෝ කළ හැකි අතර, ඔහු විසින් තම තීරණය කොමසාරිස්වරයා වෙත සහ අභියාචක වෙත දැනුම් දිය යුතුය. ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරනාත්මක වන අතර එහ කිසිම අධිකරනයකදී හෝ විනිශ්වය අධිකාරයකදී හෝ ප්‍රශ්න නොකළ යුතුය.";

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) අසන්තක කිරීමේ නියමයට විරුද්ධව අභියාචනයක් කරනු නොලැබූ අවස්ථාවක නියමයේ දින සිට දවස් තිහක කාලයක් ඉකුත්වූ විටද අසන්තක කිරීමේ නියමයකට විරුද්ධව අභියාචනයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමය සථිර කරනු ලැබූ විට ද ඒ නියමය බාර දෙන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව ඇතුළත ඒ නියමයෙහි සඳහන් ඉඩමෙන් ඉවත් වී, ඒ ඉඩම පිහිටා ඇත්තේ යම් ගොවිජන සේවා කාරක සභාවක බලප්‍රදේශය ඇතුළතද ඒ ගොවිජන සේවා කාරක සභාවට එහි සන්තකය භාර දිය යුතුය.";

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි "භාර දෙනු ලැබූ තැනැත්තකු" යන වචන වෙනුවට භාර දෙනු ලැබූ 37 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙවන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20.** මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය 38 වන වගන්තිය ඉක්බිතිවම ඇතුලත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.:-

38අ. (1) යම් කෘෂිකාර්මික ඉඩමක් සම්පන්ධව යම් ආරවුලක් පැවතීමේ හේතුවෙන්, ඒ ඉඩම වගා නොකරන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ අවස්ථාවක, කොමසාරිස්වරයා වෙත කරුණු කියා සිටීමට ඒ කෘෂිකාර්මික ඉඩමේ ඉඩම් හිමි ගොවියාට හෝ බුක්තිකරුට අවස්ථාවක් දීමෙන් පසු නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චය කොට දැක්වෙන කාළසීමාව ඇතුළත, ඒ ඉඩමෙන් ඉවත් වී, එහි සන්තකය කොමසාරිස්වරයාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට හෝ භාර දෙන ලෙස, ඒ නියමය භාර දෙනු ලැබූ තැනැත්තාට කොමසාරිස්වරයා විසින් නියම කළ හැකිය.

(2) 35 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ නියමයක් භාර දීම කෙරෙහි අදාල විය යුතුය.

(3) මේ වගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ තැනැත්තකු විසින්, නියමයේ නිශ්චය කොට දැක්වෙන කාලසීමාව ඇතුළත ඉඩමෙන් ඉවත්වීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ඉවත් කළයුතුය.

(4) ඒ ඉඩම හා සම්බන්ධ ආරවුල සමතයට පත් කරන තෙක් හෝ ඒ පිළිබඳ තීරණයක් කරන තෙක් කොමසාරිස්වරයා විසින් නිසි ගොවිජන සේවා කාරක සභාව හෝ වෙනත් යම් තැනැත්තකු ලවා, කොමසාරිස්වරයා විසින් දෙනු ලැබිය හැකි විධානවලට අනුකූලව, ඒ ඉඩම වගා කිරීමට සැලැස්විය යුතුය.

(5) මේ වගන්තියේ විධිවිධාන යටතේ ඉඩම වගා කරනු ලබන කාලසීමාව ඇතුළත ඒ ඉඩමෙන් ලැබෙන ආදායම කෘෂිකාර්මික නිශ්පාදනය වැඩිකිරීමේ අවශ්‍යතාව ගැන සැලකිලිමත් වෙමින් කොමසාරිස්වරයා විසින් විධාන කරනු ලබන ආකාරයට ප්‍රයෝජනයට ගත යුතුය." ත

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සහ සහකාර කොමසාරිස්වරයන්" යන වචන වෙනුවට "සහකාර ගොවිජන සේවා කොමසාරිස්වරයන්, ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධරයන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු සහ "සෑම සහකාර කොමසාරිස්වරයකුම" යන වචන වෙනුවට "සෑම නියෝජ්‍ය

කොමසාරිස් වරයකු, සෑම සහකාර කොමසාරිස්වරයකු සහ සෑම ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධරයකුම" යන වචන ආදේශ කිරීමෙන්.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියට ඉක්බිතිවම. මෙහි පහත දැක්වෙන වගන්තිය ඇතුලත් කරනු ලබන අතර, එය ප්‍රදාන ප්‍රඥප්තියේ 41අ වගන්තිය ලෙස බලපැවැත් විය යුතුය :-

41අ. කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු හෝ ඉඩම කෙරෙහි සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තකු සන්තකය දරන කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය ඔහු විසින් එකී කෘෂිකාර්මික ඉඩමේ කරගෙන යන වගාවේ ස්වභාවය සහ මේ පනත නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සහ ඒ දැන්වීමේ සඳහන් කරනු ලැබිය හැකි වෙනත් කරුණු සම්බන්ධ වූ තොරතුරු ඒ දැන්වීමේ නිශ්වය කොට දැක්වෙන දිනයකදී හෝ ඊට පෙර තමා වෙත සපයන ලෙස ඒ ඉඩමේ ඉඩම්හිමි ගොවියාට හෝ බුක්තිකරුට හෝ එකී වෙනත් තැනැත්තාට නියම කළ හැකිය."

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) ඒ වගන්තියේ (1) වන වගන්තියෙහි (ස) (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

" (අ) වී වගාව හෝ වෙනත් යම් ආකාරයක වගාවක් දිරිගැන්වීම, ව්‍යාප්ත කිරීම, විධිමත් කිරීම හෝ කළමනාකරණය;";

(ii) (ඊ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

" (ඊ) කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම,ඵලදාව වැඩිදියුණු කිරීම , සුළු වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම සහ ඒවායින්

සපයන ජලය සංරක්ෂණය කිරීම සඳහා එම ඉඩම්වල අයිතිකරුවන් සහ බුක්තිකරුවන් මත පැවරෙන වෙනත් යම් සාමූහික වගකීම්.";

(ආ) එම වගන්තියේ (5) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

" (5) මේ වගන්තියේ විධිවිධාන යටතේ කැඳවනු ලැබූ රැස්වීමක්, (1) වන උප වගන්තියේ සඳහන් කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන්ගේ හෝ බුක්තිකරුවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් හතරෙන් එකක් හෝ ඒ ඉඩම් හිමි ගොවීන් හෝ බුක්තිකරුවන් විසිපස් දෙනකු හෝ එහි පැමින සිටින්නේ නම් මිස. වලංගු ලෙස සංස්ථාපනය කරනු ලැබ ඇතැයි සලකන් නොලැබිය යුතුය. අනුගාමී රැස්වීම් දෙකකදීම එවැනි ගණපූර්ණයක් පැමිණ නොසිටියේ නම් මූලාසනයේ සිටින නිලධරයා විසින් දෙවන රැස්වීම අඩාලව කල්තබන තුන්වන රැස්වීම සඳහා දිනයක් නියම කළ යුතුය. එකී තුන්වන රැස්වීමට ගණපූරණයක් පැමිණ නොසිටියද එය වලංගු ලෙස සංස්ථාපනය කරනු ලැබූ රැස්වීමක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.";

(ඇ) එම වගනිතියේ (10) වන වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

" (10) (අ) මේ වගන්තියේ විධිවිධාන යටතේ කැඳවනු ලැබූ රැස්වීමකදී කෘෂිකාර්මික

ඉඩම් හිමි ගොවින් හෝ බුක්තිකරුවන් විසින් තමන් අතුරින්ම තියම කරනු ලබන කාර්ය ඉටුකිරීමටද සුළු වාරි කර්මාන්ත ආරක්‍ෂා කිරීමටද ඒවායින් සපයනු ලබන ජලය සංරක්‍ෂණය කිරීමටද කලින් කල උද්ගතවිය හැකි ගොවිතැන් කිරීමට අදාළ වන වෙනත් කටයුතුවල දී වගා නිලධරයාට සහයවීමටද ( මෙහි මින් මතු "යාය නියෝජිත" යනුවෙන් සඳහන් කනු ලබන ) තැනැත්තකු තියම කරනු ලබන ආකාරයට තෝරා පත් කර ගත හැකිය.

(අ) යාය නියෝජිතයකු විසින් :-

(i) කොමසාරිස්වරයා අමතන ලිපියක් මගින් කලින් ඉල්ලා අස්වුවහොත් මිස හෝ

(ii) කොමසාරිස්වරයා විසින් කලින් ඉවත්කරනු ලැබුව හොත් මිස,

තමන් තෝරාපත් කර ගනු ලැබූ දිනයේ සිට තුන් අවුරුදු කාල පරච්ඡේදයක් එම තත්වයේ සේවය කළ හැකිය. කාර්ය අතපසු කිරීම හෝ විෂමාචාරය හෝ මේ වගන්තියෙන් යාය නියෝජිතයෙකු වෙත නියමවූ යම් කාර්යයක් ඉටු කිරීම පැහැර හැරීම හේතු කොට ගෙන, කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයෙකු විසින් පවත්නවන ලද නිසි පරීක්‍ෂණයකින් පසුව යම් යාය නියෝජිතයකු ඉවත්කිරීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතුය.

(ආ) යාය නියෝජිතයාගේ පාරිශ්‍රමිකය වශයෙන් තියම කරනු ලබන මුදලක් සෑම කෘෂිකාර්මික ඉඩම් හිමියෙකුම සහ බුක්තිකරුවෙකුම විසින් යාය නියෝජිතයාටගෙවයිය යුතු අතර එම මුදල ගෙවීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරද කරු විය යුතුය.

(ඇ) මේ වගන්තිය යටතේ යාය නියෝජිතයාගේ පාරිශ්‍රමික අයකර ගැනීම සම්බන්ධයෙන්, 47 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල විය යුතුය

(ඈ) ඒ වගන්තියේ (11) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් :-

"(11) යාය නියෝජිතයකුට, කොමසාරිස්වරයාගේ පාලනයට හා විධානයට යටත්ව, වාරිමාර්ග සහ වගා පරිචය පිළිබඳව සහ සුළු වාරි කර්මාන්ත ආරක්‍ෂා කිරීම සහ ඒවායින් සපයනු ලබන ජලය සංරක්‍ෂණය කිරීම පිළිබඳව එම ඉඩම් හිමි ගොවියන්ගේ හෝ බුක්තිකරුවන්ගේ සාමූහික වගකීම් ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි යාය නියෝජිතයා විසින් සලකනු ලබන පියවර ගන්නා ලෙස යම් කෘෂිකාර්මික ඉඩම් හිමියකුට හෝ බුක්තිකරුවකුට විධාන කිරීමේ බලය තිබිය යුතුය.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ IV අ වන කොටස වශයෙන් බලපැවැත්විය යුතුය:-

## "IV අ වන කොටස

### පරීක්ෂණ නිලධරයන් සහ සමාලෝචන මණ්ඩලය පත්කිරීම සහ එම නිලධරයන්ගේ සහ මණ්ඩලවල බලතල හා කාර්ය

42අ. (1) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වන පරීක්ෂණ නිලධරයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය.

(2) පරීක්ෂණ නිලධරයකු විසින් පරීක්ෂණයක් පැවැත්වීමට සැලැස්වීමට මේ පනතේ යම් විධිවිධානයකින් කොමසාරිස්වරයාට නියමිතව ඇති අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් එම කාර්යය පරීක්ෂණ නිලධරයකුට යොමු කළ යුතුය. තීරණය කිරීමට ඇතැයි කොමසාරිස්වරයාගේ දැනීම අනුව අදහස් කරන ප්‍රශ්නය දක්වමින් කොමසාරිස්වරයා විසින් පිළියෙළ කරන ලද ප්‍රකාශයක් එම යොමු කිරීම සමග යැවිය යුතුය.

(3). එම කාරණය තීරණය කිරීම සඳහා අවශ්‍ය යැයි පරීක්ෂණ නිලධරයා සලකන සියළු පරීක්ෂණ පැවැත්වීමද එසේ අවශ්‍ය යයි සලකන සියලූ සාක්ෂි ලබාගැනීමද පරීක්ෂන නිලධරයා විසින් කළ යුතුය. ඔහු තමාගේ තීරණය කොමසාරිස්වරයාට ද අදාළ පාර්ශවකරුවන්ට ද ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(4) පරීක්ෂණයක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳ නියෝග සාදනු ලැබිය හැකි අතර එවැනි යම් නියෝගවලට යටත්ව පරීක්ෂණයක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පරීක්ෂණ නිලධරයකු විසින් විධිමත් කරගත හැකිය.

(5) 65 වන වගන්තියේ සඳහන් කොමසාරිස්වරයා සතු සියළු සියලූ පරීක්ෂණ නිලධරයකුට තිබිය යුතුය.

(6) පරීක්ෂණ නිලධරයකු විසින් සිතාසියක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු–

(අ) සිතාසියේ සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී එම පරීක්ෂණ නිලධරයා ඉදිරියේ පෙනී සිටීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින්නේ නම් ; හෝ

සාධාරණ හේතුවක් නොමැතිව, දිවුරුම්දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ නිසි ලෙස දිවුරුම් දීමෙන් පසු ඔහුගෙන්, එම පරීක්ෂණ නිලධරයා අසන යම් ප්‍රශ්නයකට පිළිතුරුදීම සාධාරන හේතුවක් නොමැතිව පහැර හරින්නේ නම් හෝ එවැනි යම් ප්‍රශ්නයකට වුවමනාවෙන්ම අසත්‍ය පිළිතුරක් දෙන්නේ නම් ; හෝ

(ඇ) තමා සන්තකයේ ඇත්තා වූ ද ඉදිරිපත් කිරීමට තමාට නියම කරනු ලැබූද යම් ලේඛන එම නිලධරයා වෙත ඉදිරිපත් කිරීම, සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම්,

එම තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතුය.

42ආ. (1) මේ පනතින් සමාලෝචන මණ්ඩලයක් වෙත පැවරුණු බලතල, ඒපළාත ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචන මණඩල තෝරා ගැනීම පිණිස දොලොස් දෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකගෙන් යුක්ත මූල මණ්ඩලයක් එක් එක් පළාත වෙනුවෙන් මේ පනතේ කාර්ය සඳහා පත් කරනු ලැබිය යුතුය.

(2) මරණය, ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත් කරනු ලැබීම, පිටරට ගොස් සිටීම, හෝ අසනීප වීම නිසා මූල මණ්ඩලයේ සමාජිකයකුගේ ධූරය හිස්වන අවස්ථාවක, ඒ සමාජිකයා වෙනුවට හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතුය.

(3) මූල මණ්ඩලයකට පත් කරනලද සෑම තැනැත්තකුම කලින් ධූරය හිස්කළහොත් මිස, අවුරුදු තුනක් තුළ ධූරය දැරිය යුතුය. එසේ වුවද-

(අ) මියගිය, ඉල්ලා අස්වූ හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තකු වෙනුවට පත්කරනු ලබනතැනැත්කතකු කලින් කී තැනැත්තාගේ ධූරකාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දැරිය යුතුය.;

(ආ) පිටරට ගොස් සිටින හෝ අසනීප වී සිටින තැනැත්තකු වෙනුවෙන් ක්‍රියාකිරීමට පත් කරන ලද තැනැත්තකු කලින් කී තැනැත්තා පිටරට සිටින හෝ අසනීපව සිටින කාලය තුළ ධූරය දැරිය යුතුය.

(4) කාලය ඉකුත්වීම නිසා ධූරය හිස්කරන සාමාජිකයෙක් නැවත පත්කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේය.

(5) මූල මණ්ඩලයක සාමාජිකයන්ගෙන් එක් සමාජිකයකු, මූල මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතුය.

(6) සමාලෝචන මණ්ඩලයක් සංයුක්ත කිරීම සඳහා මූල මණ්ඩලයෙන් තිදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් මූලමණ්ඩලයේ සභාපතිවරයා විසින් තෝරාගත යුතුය. සමාලෝචන මණ්ඩලයේ සාමාඩිකයකු වශයෙන් සභාපත්වරයා විසින් තමාම තෝරාගත හැකිය.

(7) මූල මණ්ඩලයක සභාපතිවරයා මේ වගන්තිය යටතේ සංයුක්ත වූ සමාලෝචන මණ්ඩලයක සමාජිකයකු වන අවස්ථාවක එම සභාපතිවරයා හෝ, ඔහු මණ්ඩලයේ සමාජිකයකු නොවන අවස්ථාවක නම් එම සභාපතිවරයා විසින් නම්කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතුය.

(8) එක් එක් සමාලෝචන මණ්ඩලයකට ලේකම්වරයකු පත්කරනු ලැබිය යුතුය.

(9) මණ්ඩලය විසින් විභාග කරනු ලබන සෑම අභියාචනයක්ම සම්බන්ධයෙන්, එම අභියාචනයට අදාළව මණ්ඩලය ඉදිරියේ වූ සියලු කටයුතු පිළිබඳ වාර්ථාවක් සමාලෝචන මණ්ඩලයේ ලේකම්කරයා විසින් තබාගත යුතුය.

(10) යම් සාක්ෂිකරුවෙකුගෙන් දිවුරුම් පිට සාක්ෂි ගැනීම සුදුසු හැයි සමාලෝචන මණ්ඩලයක් විසින් අදහස් කරන්නේ නම් එම මණ්ඩලය විසින් එසේ සාක්ෂි ලබා ගත හැකි අතර, මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීමට හෝ මණ්ඩලයේ මතය අනුව අදාල වන යම් ලේඛන ඉදිරිපත් කිරීමට යම් තැනැත්තකු කැඳවිය හැකිය.

(11) සමාලෝචන මණ්ඩලයක සභාපතිවරයගේ හෝ ලේකම්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද ලේඛන, දැන්වීම් හෝ සිතාසි සමාලෝචන මණ්ඩලය විසින් නිකුත් කරන ලද ඒවා ලෙස සලකනු ලැබිය යුතුය.

(12) සමාලෝචන මණ්ඩලය විසින් නිකුත් කරන ලද හෝ නිකුත් කරන ලදැයි සැලකෙන සිතාසියක් භාරදෙනු ලැබූ යම් තැනැත්තකු :-

(අ) සිතාසියේ සඳහන් වේලාවේදී සහ ස්ථානයේදී සමාලෝචන මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම, සාධාරන හේතුවක් නොමැතිව පැහැර හරින්නේ නම්; හෝ

(ආ) සාධාරන හේතුවක් නොමැතිව, දිවුරුම්දීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ නිසි ලෙස දිවුරුම් දීමෙන් පසු ඔහුගෙන්, එම මණ්ඩලය විසින් විභාග කර තීරණය කිරීමට ඇති කාරණාවලට අදාලව සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයකු විසින් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරුදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් හෝ එවැනි යම් ප්‍රශ්නයකට වුවමනාවෙන්ම අසත්‍ය පිළිතුරක් දෙන්නේ නම් ; හෝ

(ඇ) තමාගේ සන්තකයේ හෝ බලය යටතේ ඇත්තාවූ ඉදිරිපත් කිරීමටතමාට නියම කරනු ලැබූ ද යම් ලේඛන සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සාධාරන හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් ඔහු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත්විය යුතුය.

(13) සමාලෝචන මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(14) මේ පනත යටතේ සමාලෝචන මණ්ඩලයක් වෙත කරනු ලැබූ යම් අභියාචනයක් මත, එම අභියාචනයට විෂය වූ නිශ්චය කිරීම හෝ තීරණය සමාලෝචන මණ්ඩලය විසින් අනුමත කිරීම හෝ වෙනස් කිරීම කළ හැකිය. එම මණ්ඩලයේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එය කිසියම් අධිකරණයක් ඉදිරියේ ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.";

**25**. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) (අ) ගොවිජන සේවා කාරක සභාවක් කොමසාරිස්වරයා විසින් පහත දැක්වෙන ආකාරයට පත් කරන ලද සාමාජිකයන් පසලොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.-

(i) එම කාරක සභාවේ බල ප්‍රදේශය ඇතුළත වූ කෘෂිකාර්මික ඉඩම්හිමි ගොවීන් සහ බුක්තිකරුවන් විසින් තෝරාපත් කරනු ලබන තැනැත්තන් දහදෙනකු එසේ වුවද එම තැනැත්තන්ගෙන් යටත් පිරිසෙයින් තුන් දෙනෙකු වත් කුඹුරු බුක්තිකරුවන් ද තවත් තැනැත්තන් තුන් දෙනකු කුඹුරු ඉඩම්වල අඳ ගොවීන් ද විය යුතුය;

(ii) රජයේ නිලධරයන් හෝ රාජ්‍ය සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවා නියුක්තයන් වන තැනැත්තන් පස්දෙනකු;

(අ) අවශ්‍යයයි කාරක සභාව සලකන අවස්ථාවක, යම් රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් ආයතනයක නිලධරයකු කාරක සභාවට සහභාගී කරවා ගැනීම හෝ එහි යම් රැස්වීමකට පැමිණෙන ලෙස යම් තැනැත්තකුට ආරාධනා

කිරීම හෝ කළ හැකිය. මේ ඡේදය යටතේ සහභාගී කරවනු ලැබූ හෝ ආරාධනා කරනු ලැබූ යම් තැනැත්තකු කාරක සභාවේ යම් රැස්වීමක දී ඡන්දය දීමට සුදුස්සෙකු නොවිය යුතුය.";

(ආ) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

" (7) ගොවිජන සේවා කාරක සභාවක යම් සාමාජිකයකු

(අ) මානසික හෝ ශාරීරික අබලතාවක් නිසා ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකළ නොහැකි බවට හෝ එම කාර්ය ඉටු කිරීම නොකඩවා කරගෙන යාමට වෙනත් ආකාරයකින් නුසුදුසු බවට ; හෝ

(ආ) සාධාරන හේතුවක් නොමැතිව කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැර ඇති බවට කොමසාරිස්වරයා විසින් ඒ සාමාජිකයාගේ පත්වීම අවසන් කර ඒ කාරක සභාවට වෙනත් සමාජිකයකු පත් කළ හැකි ය;

එසේ වුවද ධූරයෙන් ඉවත් කරනු ලබන හෝ වෙනත් ක්‍රමයකින් ධූරය හිස්කරන සාමාජිකයකු වෙනුවට පත්කරනු ලබන සමාජිකයකු ඔහු කලින් ධූරයෙන් ඉවත්කරනු ලැබුවහොත් හෝ වෙනත් ආකාරයකින් ධූරය හිස් කළහොත් මිස ඔහුගේ අනුප්‍රාප්තවන සමාජිකයාගේ ඉකුත් නොවූ ධූර කාලය තුළ ධූරය දැරිය යුතුය."

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2අ) (අ) කෘෂිකාර්මික ඉඩම් ලේඛනය

(i) සංශෝධනය කිරීමට අවශ්‍ය වන ආකාරයට සහ අවශ්‍ය වන විට සංශෝධනය කළ යුතුය.

(ii) 1991 වර්ෂයේ සිට ආරම්භ වන සෑම අවුරුදු තුනකටම වරක් ප්‍රතිශෝධනය කළ යුතුය.

(iii) සෑම වර්ගයකම ජනවාරි සහ ජූලි මාසවලදී මහජන පරීක්ෂණය සඳහා විවෘතව තබනු ලැබිය යුතුය.

(ආ) යම් කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වෙනුවෙන් අළුත් අඳ ගොවියකුගේ නම ඇතුළත් කිරීමෙන් කෘෂිකාර්මික ඉඩම් ලේඛනය සංශෝධනය කිරීම සඳහා වූ යම් ඉල්ලීමක් ලියවිල්ලකින් කළ යුතු අතර, එම ඉඩම් ප්‍රමාණයේ අඳ ගොවියා ලෙස ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීමට කැමැත්ත ප්‍රකාශ කෙරෙන, ඉඩම් හිමියාගෙන් ලබාගත් ලිපියක් ඒ සමග විය යුතුය.;

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ අවසානයට පහත දැක්වෙන අළුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර, පිලිවෙලින් ඒවා එම ප්‍රඥප්තියේ 45අ සහ 45ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතුය.

45අ. (1) සෑම ගොවිජන සේවා කාරක සභාවක්ම කොමසාරිස්වරයාගේ විධිවිධානවලට අනුව එහි බල ප්‍රදේශය ඇතුළත ඇති කෘෂිකාර්මික ඉඩම් මැනීමක් කිරීමට සැලැස්විය යුතු අතර එම ඉඩම්වලට අදාළ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතුය.

(2) ගොවිජන සේවා කාරක සභාව විසින් එම ඉඩම් මැනීමේ හා වාර්ථා පවත්වා ගැනීමේ අනුපාතික වියදම කෘෂිකාර්මික ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ බුක්තිකරුවන්ගෙන් අයකර ගත හැකිය.

45ආ. සෑම ගොවිජන සේවා කාරක සභාවක්ම, එහි බල ප්‍රදේශය ඇතුලත අඳ ගොවි ලේඛනයක් , නියමිත ආකාරයට පිළියෙල කිරීම, එය ප්‍රතිශෝධනය කිරීම සහ පවත්වාගෙන යාම කළ යුතුය.";

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් පසංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (2) වන උප වගන්තියේ -

(1) (ආ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) (2අ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා ගෙන් හෝ බුක්තිකරුගෙන් එම ඉඩමේ එක් අක්කරයකට රුපියල් හයකට නොවැඩි වාර්ෂික බද්දක් නියම කර අය කර ගැනීම සහ මේ පනත යටතේ සපයනු ලබන සේවා සඳහා අය කරනු ලබන වෙනත් ගාස්තු අයකර ගැනීම;";

(ii) (ඇ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :-

(ඇ) කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන බැංකුවක ගිණුමක් පවත්වා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට;

(ඉ) ඉඩම්හිමි ගොවියන්ට සහ බුක්තිකරුවන්ට කෘෂිකාර්මික කටයුතු සඳහා එහි මුදල් වලින් ණය දීමට සහ එම ණය ආපසු අයකර ගැනීමට;

(ඊ) අවශ්‍ය අවස්ථාවලදී සුළු වාරි කර්මාන්ත අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා එහි මුදල් ප්‍රයෝජනයට ගැනීමට;

(උ) කෘෂිකර්මය සහ කාරක සභාවේ කළමනාකරණය දියුණු කිරීමේ අදහසින් නිලධරයන් සහ ගොවියන් පුහුණු කිරීම සඳහා කොමසාරිස්වරයාගේ ඉල්ලීම පිට මුදල් ආධාර සැපයීම.";

(ආ) එම වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

" (2අ) පහත දැක්වෙන පුද්ගලයන් (2) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ නියම කරන ලද අක්කර බද්දෙන් නිදහස් විය යුතුය.:-

(i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාවත

(ii) ගෙවත්තක ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරු.

මේ වගන්තියේ කාර්ය සඳහා

"ගෙවත්ත, යත්නෙන්, සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන්, තනිකරම ගෘහ පරිභෝජනය සඳහා එළවුළු හෝ පළතුරු වගාකර ඇති හෝ අයිතිකරු හෝ බුක්තිකරු විසින් එම වගාවන් සඳහා හෝ සතුන් ඇති කිරීම සඳහා යොදාගනු ලබන අක්කර භාගයකට නොවැඩි ප්‍රමාණයක ඉඩමක් අදහස් වේ.

(2ආ) යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් ගොවිජන සේවා කාරක සභාවකට පොදු කමතක් සඳහා හෝ කෘෂිකාර්මික පාරක් සඳහා හෝ අවශ්‍ය වී ඇති අවස්ථාවක, ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ආණ්ඩුව විසින් ඒ කාරක සභාව සඳහා අත්කර ගතහැකි අතර, එම ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාව අත්කර ගැනීමේ කාර්යය සඳහා එම පනතේ විධිවිධාන අදාළ විය යුතුය.";

(2ආ) යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතා දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

(3අ) ගොවිජන සේවා කාරක සභාවක් විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් කාරක සභාවේ බල ප්‍රදේශය ඇතුළත යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා හෝ බුක්තිකරුට හෝ එහි යම් සම්බන්ධතාවක් ඇති වෙනත් තැනැත්තකුට හෝ ඔහුගේ බුක්තියේ ඇති ඉඩම් ප්‍රමාණය, ඔහු විසින් කරනු ලබන ගොවිතැනේ ස්වභාවය, සහ මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවූද දැන්වීමේ සඳහන් කරනු ලබන්නා වූද වෙනත් කාරණා පිළිබඳ විස්තර එම දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයකට පෙර සපයන ලෙස නියම කළ හැකිය";

(ඇ) (4) වන උප වගන්තියේ "කොමසාරිස්වරයා විසින්" යන වචන වෙනුවට "කොමසාරිස්වරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව" යන වචන ආදේශ කිරීමෙන්

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත්කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

46අ. (1) ගොවිජන සේවා කාරක සභාවක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව රාජ්‍ය සංස්ථාවක් වූ විටෙක මෙන් සෑම ගොවිකාරක සභාවකම ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතුය.

(2) විගණකාධිපතිවරයාගේ මතය අනුව අක්‍රමික හෝ නීති විරෝධී වන සෑම ගිණුම් විෂයයක්ම ඉඩදීම විගණකාධිපතිවරයා විසත් ප්‍රතික්ෂේප කළ යුතු අතර එම ගෙවීම කරන හෝ සිදු කරන එම කාරක සභාවේ නිලධරයාට හෝ සේවා නියුක්තයාට කොමසාරිස්වරයා විසින් එය අධිභාර කළ යුතු බවද ඒ නිලධරයා හෝ සේවා නියුක්තයා විසින් ගිණුම් දක්වනු ලැබිය යුතුව තිබූ නමුදු, එසේ ගිණුම් දක්වනු නොලැබූ යම් මුදලක් එම නිලධරයාට හෝ සේවා නියුක්තයාට කොමසාරිස්වරයා විසින් වැය බැර කළ යුතු බවද විගණකාධිපතිවරයා විසින් නිර්දේශ කළ යුතුය. ඊට පසු කොමසාරිස්වරයා විසින් එම තැනැත්තාගෙන් අයවිය යුතු මුදල සහතික කළ යුතුය.

(3) යම් අධිභාරයක් හෝ ඉඩ නොදීමක් සහතික කිරීමට පෙර. යෝජිත අධිභාරය හෝ ඉඩ නොදීම ගැන කොමසාරිස්වරයා විසින් එම තැනැත්තාට දැන්විය යුතු අතර

එම අධිභාරයට හෝ ඉඩ නොදීමට විරුද්ධව නියෝජිත ඉදිරිපත් කිරීමට කරුණු කියා සිටීමට ඒ තැනැත්තාට අවස්ථාවක් දිය යුතුය. ඊට පසු කොමසාරිස්වරයා විසින් තම තීරණය ඊට පදනම් වූ හේතූන් සමග ඒ තැනැත්තාට දැන්විය යුතුය.

(4) යම් තැනැත්තකුට විරුද්ධව අධිභාරයක් හෝ ඉඩනොදීමක් කොමසාරිස්වරයා විසින් සහතික කර ඇති අවස්ථාව, එම සහතිකය එහි ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුතුය.

(5) යම් අධිභාරයකින් හෝ ඉඩ නොදීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, කොමසාරිස්වරයාගේ තීරණය ඔහුට දැනුම් දෙනු ලැබූ දිනයෙන් දින තිහක් ඇතුළත එම තීරණයට විරුද්ධව අභියාචනයක්, කොමසාරිස්වරයාට එහි පිටපතක් යවමින්, අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ හැකි අතර, එවැනි යම් අභියාචනයක් මත කාරණයේ කුශලතා අනුව ලේකම්වරයා විසින් තීරණය කිරීම නීත්‍යානුකූල විය යුතුය.

(6) අධිභාර කරනු ලැබූ හෝ ඉඩ නොදෙනු ලැබූ මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් හෝ එවැනි අභියාචනයක් කරන තැනැත්තා ගෙන් අයකර ගැනීම සඳහා හේතු ඇති බව අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා අදහස්කරන්නේ නම්, ලේකම්වරයා විසින් නියමයක් මගින් එකී තැනැත්තාගෙන් ඒ මුදල අයකර ගැනීමට විධාන කරනු ලැබිය හැකි අතර, අධිභාරය හෝ ඉඩ නොදීම නීත්‍යානුකූලව කරන ලද්දක් වුවද ඒ කාරණයේ විශේෂ අවස්ථාගත කරුණු යටතේ ඒ අධිභාරය හෝ ඉඩ නොදීම ඉවත්කිරීම සාධාරණ හා යුක්තිසහගත බව ලේකම්වරයා අදහස් කරන්නේ නම්. ඔහු විසින් නියමයක් මගින්, එය ඉවත්කළ යුතු යයිද එහෙත් ඒ අධිභාරය හෝ ඉඩනොදීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා විසින් දරන ලද වියදම් සහ පිරිවැය මුදල් ප්‍රමාණය නැතහොත් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ඉන් යම් කොටසක් ඒ තැනැත්තාගෙන් අයකරගනු ලැබිය යුතු යයිද නියමයක් කළ හැකිය.

(7) අධිභාරයක් හෝ ඉඩ නොදීම පිළිබඳ සහතිකයක් හෝ යම් අභියාචනයක් මත ලේකම්වරයාගේ නියමය හෝ ලැබුණු විට කොමසාරිස්වරයා විසින්, ලියාපදිංචි තැපැලෙන් යවනු ලබන දැන්වීමක් මගින්, සහතිකයේ දැක්වෙන ගණන, කොමසාරිස්වරයාගේ තීරණයේ දිනයෙන් මාස තුනකට නොඅඩු දිනයක් වි යුතු එම දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයේ හෝ ඊට පෙර ගෙවන ලෙස එම තැනැත්තාට නියම කළ යුතුය.

(8) (7) වන වගන්තිය යටතේ වූ දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරින ලද අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් ඒ අයවිය යුතු මුදල පිළිබඳ විස්තර, එම තැනැත්තාගේ නම හා අන්තිමට දැන සිටි පදිංචි ස්ථානය අඩංගු සහතිකයක් එම පදිංචි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත නිකුත්කළ යුතු අතර, එම අධිකරණය විසින් එම මුදල, එම අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අයකර ගන්නා ආකාරයෙන් අයකර ගත යුතුය.

(9) යම් ඉඩ නොදීමක් හෝ අධිභාරයක් බලාත්මක කිරීමේ පිරිවැය සහ වියදම් වශයෙන් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද මුදලක් හැර, මේ වගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකර ගන්නා ලද සැම මුදලක්ම ගොවිජන සේවා අරමුදලට බැර කරනු ලැබිය යුතුය.";

**30**. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) ගොවිජන සේවා කාරක සභාවක් විසින් " එම කාරක සභාවට අක්කර බද්ධ ගෙවිය යුතු සෑම කෘෂිකාර්මික ඉඩම් අයිතිකරුවකුට හෝ බුක්තිකරුවකුට නැතහොත් එම කාරක සභාව විසින් දෙන ලද යම් ණය මුදලක් ආපසු ගෙවීමට අපොහොසත් වී ඇති යම් තැනැත්තාට ලිඛිතව කරන දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු කිළසීමාව තුලදී අවස්ථාවෝචිත පරිදි එම බද්ද ගෙවන ලෙස හෝ එම ණය මුදල ආපසු ගෙවන ලෙස විධාන කරනු ලැබිය හැකිය.";

(ආ) එම වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) (1) වන උපවගන්තිය යටතේ ලිඛිත දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු, එම දැන්වීමේ සඳහන් මුදල් ප්‍රමාණය, ඒ සඳහා දෙනු ලැබූ කාලසීමාව තුලදී ගෙවීමට අපොහොසත් වී ඇති බවට, නිසිපරීක්ෂණයකින් පසුව ගොවිජන සේවා කාරක සභාව සෑහීමකට පත්වන අවස්ථාවකදී, එම කාරක සභාව විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු විසින්, ඒ බද්ද ගෙවිය යුතු කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය හෝ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තා අයිතිකරුවන හෝ බුක්තිකරුවන කෘෂිකාර්මික ඉඩම හෝ පිහිටා ඇති ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට කරනු ලබන ඉල්ලීමක් මත, ඒ මුදල, එම අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක් වූ පරිද්දෙන් අයකරගනු ලැබිය යුතුය.";

(ඇ) එම වගන්තියේ පාර්ශ්ව සටහනෙහි ඇති "අක්කර බද්ද" යන වචන වෙනුවට "අක්කර බද්ද හෝ ණය මුදල" යන වචන ආදේශ කිරීමෙන්

**31**. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනයකරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති "වගා නිලධරයන් යම් ගණනක් පත්කරනු ලැබිය හැකි අතර" යන වචන වෙනුවට "වගා නිලධරයන් යම් ගණනක් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි අතර" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඇ) කොමසාරිස්වරයා විසින් විධාන කරනු ලබන පරිදි, 56 වන වගන්තියේ සඳහන් යම් වරදක් කරන යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරීම.".

**32**. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(ඉ) කොමසාරිස්වරයාගෙන් ලබාගත්තා ලද ලිඛිත පූර්ව අවසරය නොමැතිව, සුළු වාරිමාර්ග වැවක ජලාධාර ප්‍රදේශයෙහි, ඇලක ආරක්ෂිත ප්‍රදේශයක හෝ පතුලෙහි වගා කරන සහ

(ආ) එම වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය" ඇතුලත් කිරීමෙන් :-

"(3) කොමසාරිස්වරයා විසින් හෝ ගොවිජන සේවා කාරක සභාවක් විසින් මේ පනත යටතේ දෙන ලද යම් විධානයකට හෝ කරන ලද යම් නියමයකට, නීත්‍යානුකූල නිදහසට කරුණක් නොමැතිව අනුකූලතාව දැක්වීමට අපොහොසත් වන හෝ තමාගේ දැනුම අනුව සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් හෝ ලේඛනයක් මේ පනතේ කාර්ය සඳහා සපයන හෝ ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතුය.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අළුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 56අ වගන්තිය සහ 56 ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය.:-

56අ. (1) තත් කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන එක් එක් ප්‍රදේශයෙහි කුඹුරු හිමි ගොවීන්ගේ සහ බුක්තිකරුවන්ගේ ගොවිසංවිධාන එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකිය..

(2) එක් එක් ගොවි සංවිධානයක්, අවම වශයෙන් කුඹුරු හිමි ගොවියන් හෝ බුක්තිකරුවන් විසිපස් දෙනෙකුගෙන් හෝ එක් එක් ප්‍රදේශයේ කුඹුරු හිමි ගොවියන්ගේ හා බුක්තිකරුවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් හතරෙන් එකකින් හෝ සමන්විත විය යුතුය.

(3) ලියාපදිංචි කිරීම සඳහා යම් ගොවි සංවිධානයක් විසින් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, ඔහු විසින් එම සංවිධානය ලියාපදිංචි කරනු ලැබිය හැකිය;

එසේ වුවද ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයක් යටතේ ඇති යම් ප්‍රදේශයක ඇති ගොවි සංවිධානයක්, වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය හැකිය

(4) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන යම් ගොවි සංවිධානයක කාර්යවලට පහත සඳහන් කාර්යඇතුළත් විය යුතුය:-

(අ) ප්‍රදේශය සඳහා වන කෘෂිකාර්මික වැඩ සටහන සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ආ) ගම් මට්ටමේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාවේ යෙදීම සහ සුළු වාරිමාර්ග වැඩ අළුත්වැඩියා කිරීම;

(ඇ) නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම සහ බීජ පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය බෙදා හැරීම;

(ඈ) ආණ්ඩුවේ ආයතනවල සහ ප්‍රදේශයේ ගොවියන්ගේ සහයෝගය වැඩිදියුණු කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධීකරණය කිරීම ; සහ

(ඉ) ගොවි ජනතාවට වැඩදායක වෙතැයි කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් කටයුත්තක යෙදීම.

(5) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන ගොවි සංවිධානවල නිලධරයන් තෝරා පත්කර ගැනීම, එම සංවිධානවල වැඩ කටයුතු කිරීම සඳහා වූ කාර්ය

පරිපාටිය, එම සංවිධානවල බල තල, එම සංවිධාන මගින් පවත්වාගෙන යා යුතු ගිණුම් සහ එම ගිණුම් කොමසාරිස්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධරයකු විසින් හෝ විගණනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

56ආ. (1) 56අ වගන්තියෙහි කුමක් සඳහන් වුවද යම් ප්‍රදේශයක යම් ගොවි සංවිධානයක් විසින් තත් කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, ඒ ගොවි සංවිධානය–

(අ) ස්වකීය ප්‍රදේශයෙහි කෘෂිකාර්මික කටයුතු ක්‍රියාශීලී ලෙස ප්‍රවර්ධනය කර ඇතිබවට හෝ එම ප්‍රදේශයේ එම කටයුතු ප්‍රවර්ධනය කිරීමට එම සංවිධානයට හකියාව ඇති බවට;

(ආ) එම ප්‍රදේශයේ ගොවි ජනතාවගේ විස්වාසය හා විශ්වාසනීයත්වය දිනා ඇතිබවට ; සහ

(ඇ) වාරිමාර්ග වැඩ අලුත්වැඩියා කිරීම් භාර ගැනීම සඳහා මූල්‍ය ශක්තිය සහ සම්පත් ඇති බවට

කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත් ඔහු විසින් එම සංවිධානය මේ වගන්තිය යටතේ ලියාපදිංචිකරනු ලැබිය හැකිය;

එසේ වුවද ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රමයක් යටතේ ඇති යම් ප්‍රදේශයක ඇති ගොවි සංවිධානයක්, වාරිමාර්ග විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකගත්වය ඇතිව කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගොවි සංවිධානයක් ලියාපදිංචි කිරීමේ දින සිට සහ එදිනටපසු එම සංවිධානය අවිච්ඡින්නපැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එය ලියාපදිංචි කරනු ලැබුවේ යම් නමකින්ද එම නමින් සංස්ථාව විසින් නඩු පැවරීමද එයට විරුද්ධවනඩු පවරනු ලැබීමද, කළ හැකි විය යුතුය

(3) මේ වගන්තිය යටතේ සිදු කරනු ලබන සෑම ගොවි සංවිධානයකලියාපදිංචි කිරීමක් පිළිබඳව නිවේදනය කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතුය.

(4) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන සෑම ගොවි සංවිධානයකම කාර්ය, 56අ වගන්තියේ (4) වන උපවගන්තියේ දක්වා ඇති කාර්ය විය යුතුය.

(5) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ගොවි සංවිධානවල නිලදධරයන් තෝරා පත් කර ගැනීම, එම සංවිධානවල කටයුතු ඉටුකිරීම සඳහා වූ කාර්ය පටිපාටිය, එම සංවිධානවල බල තල, එම සංවිධාන මගින් පැවැත්විය යුතු ගිණුම් සහ කොමසාරිස්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු විසින් එම ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(6) මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ගොවි සංවිධානයක් අවුරුදු දෙකක කාලයක් තුළ අක්‍රියව පැවති බවට හෝ මහජන යහපත උදෙසා එම සංවිධානය පිළිබඳ මේ වගන්තිය යටතේ වූ ලියාපදිංචිය අවලංගු කළයුතු වන පරිදි එම සංවිධානය ක්‍රියා කර ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් එම සංවිධානයේ

ඒ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකිය.

(7) කොමසාරිස්වරයා විසින් මේ වගන්තිය යටතේ ගොවි සංවිධානයක ලියාපදිංචිය අවලංගු කරන අවස්ථාවක සංස්ථාවේ ඇවරකරු ලෙස තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර ඔහුට–

(ඇ) සංස්ථාවේ ණය හිමියන් අතර ප්‍රමුඛතාව පිළිබඳ යම් ප්‍රශ්ණයක් තීරණය කිරීමට;

(ආ) සංස්ථාවේ දේපළ විකිණීමට;

(ඇ) සංස්ථාවේ ණය හිමියන් අතර ප්‍රමුඛතාව පිළිබඳ යම් ප්‍රශ්නයක් තීරණය කිරීමට;

(ඈ) කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සංස්ථාව විසින් හෝ සංස්ථාවට එරෙහිව කරනු ලබන හිමිකම් පෑම් සමතයකට පත් කිරීමට;

(ඉ) නියමිත ආකාරයට සංස්ථාවේ වත්කම් බෙදාහැරීම පිණිස කටයුතු සැලැස්වීමට බලය තිබිය යුතුය.

(8) සංස්ථාව ඇවරකිරීමේ දී එහි අරමුදල් පළමුවෙන් ඇවරකිරීමේ ගාස්තු සඳහා ද, ඊට පසු සංස්ථාවේ බැරකම් ගෙවා අවසන් කිරීම සඳහාද යොදාගත යුතුය. ඇවර කිරීම අවසන් කිරීමෙන් පසු ඉතිරිවන යම් අතිරික්තයක් ඇත්නම් එය 60 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ගොවිජන සේවා අරමුදලට බැර කළ යුතුය."

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වචන එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:–

මේ වගන්තියේ කාර්ය සඳහා "වගා අයිතිවාසිකම්" යන්නට ගොයම් පෑගීමේ අයිතිවාසිකම, කුඹුර වෙත යාමේ අයිතිවාසිකම සහ කෘෂිකාර්මික නිශ්පාදන ද්‍රව්‍ය ඉවත් කරගෙන යාමේ අයිතිවාසිකමද ඇතුළත් වේ."

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය පහතදැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:–

(අ) එම වගන්තියේ (2) වන උප වගන්තියෙහි ඇති(ඊ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

" (ඊ) 46 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අක්කර බද්ද වශයෙන් අයකර ගනු ලබන මුදල් ප්‍රමානවල නියම කරනු ලැබිය හැකි ප්‍රතිශතයක්."; සහ

(ආ) (3) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

" (3) ඒ අරමුදලෙහි මුදල්, ගොවිජන සේවා කාරක සභාවලගොඩනැගිලි, වාහන සහ උපකරණ නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම සඳහාද, ගෘහභාණ්ඩ මිලදී ගැනීම, පුහුණු කිරීම. ප්‍රචාරක කටයුතු, පර්යේෂණ කටයුතු, සමීක්ෂණ, ණය යෝජනා ක්‍රම, නිලධරයන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීම සහ සාමාන්‍යයෙන් ගොවිජන සේවා කාරක සභාවල පරිපාලනය සහ සංවර්ධනය සඳහා ගොවිජන සේවා කාරක සභාවලට මූල්‍ය ආධාර සැපයීම සඳහා ද ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පලදාවර්ධනය දියුණු කිරීම සඳහා ද පාවිච්චි කරනු ලැබිය හැකිය. අරමුදලේ පරිපාලනය පිළිබඳව කොමසාරිස්වරයා වගකිව යුතුය.".

**36**. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වනවගන්තියේ ඇති "අත් කර ගනු ලැබිය හැකිය" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "අත්කරගනු ලැබිය හැකිය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**37**. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වනවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

(අ) (1) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන වචන ඇතුලත් කිරීමෙන් :-

"කෘෂිකාර්මික නිශ්පාදනය වැඩිකිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන" කොමසාරිස්වරයා විසින් ඕනෑම අවස්ථාවකදී එම තැනැත්තා වෙත භාර දෙනු ලබන දැන්වීමක් මගින් එම අවසරය අස් කරගනු ලැබිය හැකිය.";

(ආ) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුජේදය ආදේශ කිරීමෙන්:-

" (ඇ) වෙනත් යම් කෘෂිකාර්මික භෝගයක්";

(ඇ) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උලවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(4) යම් කුඹුරු ප්‍රමාණයක්-

(අ) (1) වන උප වගන්තියේ විධිවිධාන කඩකරමින් යම් තැනැත්තකු විසින් ප්‍රයෝජනයට ගනු ලබන්නේ නම්, හෝ

(ආ) (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව මිස අන්‍යාකාරයට ගොවියා විසින් වගා කරනු ලබන්නේ නම්, හෝ

අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ ඒ ගොවියා වරදකට වරදකරුවන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේදී රුපියල් විසිපන්දහසකට වැඩි නොවන දඩයකටද ඒ දඩය ගෙවීම පැහැර හැරීමේදී මාස තුනකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට ඔහු යටත් විය යුතු අතර එසේ වරදකරු වීමෙන් පසුවද එම වරද දිගටම සිදුකරනු ලබන අවස්ථාවකදී අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා හෝ ඒ ගොවියා එසේ වරදකරු කරනු ලැබූ දිනයෙන් පසුව ඒ වරද සිදු කරන සෑම දිනයක් සඳහාම එක් දිනකට රුපියල් සියය බැගින් වන දඩයකට යටත් විය යුතුය.";

(ඈ) එම වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

" (6) (අ) මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී වරද කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද මෙවලම්, උපකරණ, යන්ත්‍ර හෝ වාහන රාජ්‍ය සන්තක කළ යුතු බවට අධිකරණය විසින් ආඥාකළ හැකිය. මේ වගන්තිය යටතේ රාජ්‍ය සන්තක කිරීමේ දී රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වේ. එසේ සතුවීම බලාත්මක විය යුත්තේ-

(i) රාජ්‍ය සන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණයට හෝ

ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට හෝ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලය ඉකුත්වීමෙන් ; හෝ

(ii) රාජ්‍ය සන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, රාජ්‍ය සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් එම අබියාචනය පිළිපදව තිරණය කිරීමෙන් පසුවය.

(ඉ) මේ වගන්තිය යටතේ රජය වෙත සතු කරන ලද යම් මෙවලමක, උපකරණයක, යන්ත්‍රයක හෝ වාහනයක සන්තකය කොමසාරිස්වරයා විසින් භාර ගත යුතු අතර, ඔහු යෝග්‍යයයි සිතන පරිදි ඒවා විකිණීම හෝ ඒවා පිළිබඳ සුදුස්සක් කිරීම කළ හැකිය. එසේ විකිණීමෙන් ලැබෙන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය;.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 62අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය:–

62අ. (1) කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් යම් කුඹුරු ප්‍රමාණයක් ගොඩ කිරීම නොකළ යුතුය. ඉහතින් වූ විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන්නේ..

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය කඩ කරන බවට කොමසාරිස්වරයාට දැන්මී දෙනු ලැබූ අවස්ථාවක දී, කොමසාරිස්වරයා විසින් මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට අනුව ලිඛිත ඉල්ලීමක් මගින් –

(අ) තමා ගොවිජන සේවා කොමසාරිස්වරයා බව ද;

(ආ) ඉල්ලීමෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම කුඹුරක් බවද.;

(ඇ) ඉල්ලීමේ නම් කරනු ලැබ ඇති තැනැත්තා 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 62අ වගන්තියේ (1) වන උපවගන්තිය කඩ කරමින් ක්‍රියා කරන බවද

සඳහන් කරමින් ඉහත කී (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීමෙන් එම තනෙත්තා හෝ ඔහුගේ නියෝජිතයන් හෝ සෙවකයන් වළක්වන අඥාවක් නිකුත් කරන ලෙස එම කුඹුරු ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටි ස්ථානය පිළිබඳ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත අයැද සිටිය හැකිය.

(3) මේ වගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම එහි ඇති කරුණු සත්‍යායනය කරන දිවුරුම් පත්‍රයකින් සනාථ කරනු ලැබිය යුතුය.

(4) එම ඉල්ලීම ලැබුණු විට මහේස්ත්‍රාත්වරයා ඉල්ලීමෙහි නම් කරනු ලැබ ඇති තැනැත්තා වෙත වහාම සිතාසි නිකුත් කළ යුතු අතර (එම සිතාසි නිකුත් කරනු ලැබූ දින සිට සති දෙකක් නොඉක්මවන දිනයක් වන) සිතාසියෙහි සඳහන් කරනු ලබන දිනයේදී අධිකරණයට පැමිණ ඉල්ලීමෙන් අයැද සිටිනු ලබන ආකාරයට ඔහු

හෝ ඔහුගේ සේවකයන් හෝ නියෝජිතයන් වළක්වනු නොලැබිය යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස එම සිතාසියෙන් දැනුම් දෙනු ලැබිය යුතුය.

(5) එම සිතාසිය නිකුත් කරනු ලැබූ තැනැත්තා සිතාසියේ සඳහන් දිනයේදී අධිකරණයේ පෙනී සිටීමට අපොහොසත් වන්නේ නම්, හෝ එම ආඥාව නිකුත් කිරීමට එරෙහිව දැක්වීමට තමාට කිසිම හේතුවක් නැති බව ප්‍රකිශ කරන්නේ නම් ඉල්ලීමෙහි අයැද තිබෙන ආකාරයට අධිකරණය විසින් වහාම ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතුය.

(6) සිතාසිය නිකුත්කරනු ලැබූ තැනැත්තා යථා පරිදි අධිකරණයේ පෙනී සිට, එම ආඥාව නිකුත් කිරීමට එරෙහිව දැක්වීමට තමාට හේතු ඇති බව සඳහන් කරන්නේ නම්, මහේස්ත්‍රාත් අධිකරණය විසින් වහාම නඩුව පිළිබඳව කටයුතු කිරීම හෝ නඩුව පසු දිනයක විභාග කිරීමට නියම කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(7) ඉල්ලීම සනාථ කිරීම සඳහා යම් සාක්ෂියක් ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයාට දැනුම් දීමට මහේස්ත්‍රාත් අධිකරණයට බලයක් නැත්තේය.

(8) කුඹුරු ප්‍රමාණය ගොඩ කිරීමට ඒ හේතු දක්වන තැනැත්තාට නීත්‍යානුකූල බලයක් ඇති බවට නඩු විභාගයෙන් පසුව මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවන්නේ නම්, මේ වගන්තිය කඩ කරමින් යම් ක්‍රියාවක් කිරීමෙන් එම තැනැත්තා හෝ ඔහුගේ සේවකයන් හෝ නියෝජිතයන් වළක්වන ආඥාවක් මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතුය.

(9) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවකදී, වරදක් කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් හෝ පාවිච්චි කරන ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රයක්, හෝ වාහනයක් රාජ්‍ය සන්තක කළ යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කළ හැකිය. එවැනි රාජ්‍ය සන්තක කිරීමකට 62 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය".

**39**. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (උ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (උ) (1) ගොවිජන සේවා කොමසාරිස්වරයා ඉදිරිපිට හෝ 1958 අංක 1 දරන කුඹුරු පනතේ විධිවිධාන යටතේ සමාලෝචන මණ්ඩලය ඉදිරිපිට හෝ ;

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ විධිවිධාන යටතේ කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට හෝ ;

(iii) මේ පනතේ 63 වන වගන්තියේ විධිවිධාන යටතේ ආරම්භ කර අවසන් කර තිබුනු සහ ඒ සම්බන්ධයෙන් ඉහත කී ප්‍රඥප්තිවල විධිවිධාන යටතේ අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචන කර නැත්තා වූ හෝ අභියාචනය කරන ලදුව නිෂ්ප්‍රභ කරනු ලැබ ඇත්තා වූද එම නඩු කටයුතුවල දී කරන ලද ආඥා බලාත්මක කිරීම සඳහා පියවරවල් ඉහත කී ප්‍රඥප්තිවල විධිවිධාන යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් ගෙන නැත්තාවූද අවස්ථාවක එම නඩු කටයුතු වල ආඥා මේ පනතේ විධිවිධාන යටතේ වූ නඩු කටයුතුවල ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ අනුරූප විධිවිධාන අනුව බලාත්මක කරනු ලැබිය යුතුය.";

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) "කෘෂිකර්මය, යන්නෙහි අර්ථකථනයේ "ඇතුළත් වේ;" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

" (iv) මී මැසි පාලනය සහ මිරිදිය ධීවර කර්මාන්තය ඇතුළත් වේ;"

(ආ) "කෘෂිකාර්මික කටයුතු" යන්නෙහි අර්ථකථනය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :-

"කෘෂිකාර්මික කටයුතු" යන්නෙන් කෘෂිකර්මය සම්බන්ධ යම් කටයුත්තක් අදහස් වන අතර කෘෂිකාර්මික යෙදවීම් සැපයීම, එම කටයුත්තෙහි භාවිත කෙරෙන යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ භාවිතකිරීම හා සුළු වාරිමාර්ග සම්බන්ධ යම් කටයුත්තක් ඊට ඇතුළත් වේ";

**41.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(XXVIII)

## උපලේඛනය

### ආකෘතිය

(62අ වගන්තිය)

### වැලැක්වීමේ ආඥාවක් සඳහා වූ ඉල්ලීම

.................................................................................මහේස්ත්‍රාත් අධිකරණය වෙත

(මහේස්ත්‍රාත් අධිකරණයේ නම සඳහන් කරන්න.)

ගොවිජන සේවා කොමසාරිස් ................................................................(නම සඳහන් කරන්න) වන මම1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 62අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙම ඉල්ලීම මගින්-

(අ) පහත දැක්වෙන කරුණු අධිකරණය වෙත දැනුම් දෙමි; එනම් :-

(i) මම ඉහත නම් සඳහන් ගොවිජන සේවා කොමසාරිස්වරයා වෙමි;

(ii) මේ ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම කුඹුරකි;

(iii) ..........................................................පදිංචි..........................................................

නැමති තැනැත්තා 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ 62අ වගන්තියේ (1) වන උපවගන්තිය කඩ කරමින් ක්‍රියා කරයි ; තවද

(ආ) එකී ..........................................................හෝ ඔහුගේ නියෝජිතයන් හෝ සේවකයන් ගොවිජන සේවා පනතේ 62අ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියා කිරීම වළක්වන ආඥාවක් නිකුත් කරන ලෙස අයැද සිටිමි.

..........................................................................
(ගොවිජන සේවා කොමසාරිස්වරයාගේ අත්සන)

ඉහත සඳහන් කර ඇති උපලේඛනය :

(මෙහි දිස්ත්‍රික්කය ඇතුළු පිහිටීම සඳහන් කරමින් ඉඩම විස්තර කරන්න)

..........................................................................
(ගොවිජන සේවා කොමසාරිස්වරයාගේ අත්සන)

දිනය :..........................................................

## 1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 8 වන දින]

## 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1**. මේ පනත, 1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගෙන් ; සහ";

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියෙහි "ජාතික ආරක්ෂාව" යන වචන වෙනුවට "මුදල්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4**. 14 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 14 අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

> 14අ. මෙම අරමුදලළ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්යයන් සඳහා, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතුය";

**5**. මේ පනතේ 4 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1985 මාර්තු මස 21 වන දින සිට බලාත්මක වූ ලෙස, සියලු කාර්යයන් සඳහා සළකනු ලැබිය යුතුය

**6**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1991අංක 13 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 15 වන දින]

## 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1**. මේ පනත 1991 අංක 13 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2**. ( මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 50අ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු" යන වචන හා ඉලක්කම් වෙනුවට 1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1991 ජනවාරි මස 1 වනි දිනට කලින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ "බලයලත් නියෝජිතයා" යන්නෙහි

අර්ථකථනයේ (2.) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

"(2) බලය දීමේ ලියවිල්ලෙහි සඳහන් තක්සේරු වර්ෂයට අදාළකාරණා සම්බන්ධයෙන් මේ පනතේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස යම් තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබූ සහ–

(i) සමාගම් (විගණකවරයන්ගේ) නියෝග යටතේ විගණකවරයකු ලෙස ලියාපදිංචිව සිටින පුද්ගලයකු වන්නා වූ සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ; හෝ

(ii) තත්කාර්යය සඳහා 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතයටතේ සාදන ලද නියෝග යටතේ ඒ පනතේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබූ පුද්ගලයකු වන්නා වූ ; හෝ පුද්ගලයෙක් අදහස් වේ.";

**4**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

## 1991අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධිත) පනත

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 27 වන දින]

## 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**1**. මේ පනත 1991 අංක 17 දරන ආදායම් බදු අධිභාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනතේ දීර්ඝ නාමයේ "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පිළිවෙළින් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන්" 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "එහෙත් 1991 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එහෙත් 1992 මාර්තු මස 31 වන දින පසු නොවී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) ඡේදයේ "එහි ශේෂයද" යන වචන වෙනුවට "එහි ශේෂයද;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ii) ඡේදයේ "එහි ශේෂයද" යන වචන වෙනුවට "එහි ශේෂයද" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ii) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්

" (iii) 1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ මුදලින්-

(අ) සියයට 50 කට නොඅඩු ප්‍රමාණයක් 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර; ද;

(ආ) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර එහි ශේෂයද;.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ අග "සියයට 7 1/2 ක් ; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 7 1/2 ක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "සියයට 7 1/2 ක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියයට 7 1/2 ක් ; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

" (ඇ) 1991 අප්‍රේල් මස 1 වනදිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඒ සේවානියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් ඒ වර්ෂය වෙනුවෙන් අඩු කරනු ලැබිය යුතු සම්පූර්ණ ආදායම් බද්දෙන්-

(i) 1991 ජුලි මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සඳහා ඒ සේවානියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක් ; සහ

(ii) 1991 ඔක්තෝම්බර් මාසය සඳහා ඒ සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් සියයට 7 1/2 ක් ;".

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ii) මේ පනත යටතේ අදාළ වර්ෂයක් සඳහා අධිභාරයක් ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින්-

(අ) 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන්, 1988 අප්‍රෙල් මස 1 වනදිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1989 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1989 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ආ) අප්‍රේල් මස 1 වනදිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්-

(i) 1990 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ; සහ

(ii) 1990 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ඇ) 1991 අප්‍රෙල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්–

(i) 1991 අගෝස්තු මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක් ;

(ii) 1991 නොවැම්බර් මස 15 වන දින හෝ එදිනට පෙර සියයට 7 1/2 කට නොඅඩු ප්‍රමාණයක්

ඒ අධිභාරය වශයෙන් ගෙවනු ලබන අවස්ථාවක–

1989 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1990 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ;

1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1991 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර ; සහ

1991 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ වර්ෂය සම්බන්ධයෙන් වන විට, 1992 නොවැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර

ඔහු විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට වැඩියෙන් ඒ අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු අධිභාරයේ අතිරික්තය ඔහු විසින් ගෙවනු ලබන්නේ නම්, 3 වන වගන්තිය යටතේ කිරීමට ඔහුට නියම කරනු ලබන ගෙවීම් සම් බන්ධයෙන් මේ වගන්තිය යටතේ යම් දණ්ඩනයක් ගෙවීමට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය.";

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය

## 1991 අංක 23 දරන සමාගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 ජුනි මස 20 වන දින]

### 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**1.** මේ පනත 1991 අංක 23 දරන මුදල් සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 5 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 5අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතුය:–

5අ (1) තැන්පත් මුදලක් කල්පිරුණු දින හෝ ඉන් පසුව ඒ මුදල ගෙවන ලෙස තැන්පත්කරුවකු විසින් ඉල්ලා සිටි විට ඒ තැන්පත් මුදල සහ ඒ මත පොලිය ගෙවීමට යම් මුදල් සමාගමක් අපොහොසත් වන අවස්ථාවක" ඒ සමාගමේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකු හෝ ලේකම්වරයකුම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය ;

එසේ වුවද ඒ වරද සිදුකරන ලද්දේ තමගේ අනුදැනුම නොමැතිව සහ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා විසින් සියලු තිසි උද්‍යෝගයෙන් ක්‍රියා කර ඇති බව ඔහු විසින් ඔප්පු කළහොත්, ඒ අධ්‍යක්ෂවරයා, කළමනාකරු හෝ ලේකම්වරයා ඒ වරදට වරදකරු නොවිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ නියමයන් අනුව තමාගේ තැන්පත් මුදල සහ පොලිය කල්පිරුණු විට නොගෙවනු ලැබ ඇති යම් තැන්පත්කරුවකු විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ නියමයන් අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු පැවරිය හැකිය.".

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ණ) මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට හෝ සේවා නියුක්තයන්ට වැටුප්, දීමනා, අතිරේක ලාභ සහ වැය ප්‍රතිපූරණ වශයෙන් ගෙවන පාරිශ්‍රමික සහ වෙනත් ගෙවීම්.";

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 12ආ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

12ආ. (1) මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති සෑම මුදල් සමාගමකටම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එහි නියෝජිතයා වශයෙනක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු, එම සමාගමේ කටයුතු සමීක්ෂණය කිරීමේ කාර්යය සඳහා කර පත් කරනු ලැබිය හැකිය

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරුණු ලැබූ නියෝජිතයකු විසින්, 12 වන වගන්තියෙන් අධ්‍යක්ෂවරයා වෙත පැවරී ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීම හා මෙහි පහත සඳහන් කටයුතු කිරීමද නීත්‍යානුකූල වන්නේය:-

(අ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් වලට සහභාගී වීම සහ ඔහුගේ අදහසඅනුව සමාගමේ තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ සම්බන්ධතාවයන්ට හෝ ජාතික ආර්ථිකයට හෝ අවර්ථකාරී විය හැකි යම් කාරණයක් පිළිබඳ යම්

තීරණයකට එළඹීම පැය හතලිස් අටක් නොයික්මවන කාලයකට විලම්බනය කරන ලෙස ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට නියම කිරීම, එවැනි නියමයකට අනුව ක්‍රියා කිරීම ඒ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යය වන්නේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉන් පසුව මුදල් මණ්ඩලයේ සභාපතිවරයාගේ ලිඛිත එකඟත්වය ඇතිව පමණක්, එම කාරණය සම්බන්ධයෙන් තීරණයක් කළ හැකිය.

(ආ) ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම කැඳවීම අවශ්‍ය යැයි ඔහු සලකන අවස්ථාවල එම අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම කැඳවීම.

(ඇ) ඒ සමාගමේ කටයුතු සමීක්ෂණය කිරීමේදී සහ අධීක්ෂණය කිරීමේදී ඔහුට සහය වීම පිණිස වෘත්තීය හෝ විශේෂඥ කාර්ය මණ්ඩල සේවයේ නියුක්ත කර ගැනීම

(3) යම් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු සේවා නියුක්තයකු හෝ විගණකවරකු වෙත මේ වගන්තිය යටතේ පැවරෙන යම් නියමයක් අනුව ක්‍රියා කිරීම සහ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට

නියෝජිතයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් විගනකවරයකුට හෝ ඔහු විසින් (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සේවයේ නියුක්ත කර තිබෙන යම් තැනැත්තකුට ඒ මුදල් සමාගමේ මුදල් ශේෂය, වත්කම් සහ බැරකම් ඇතුළුව සියලු පොත්පත්වලට සහ වාර්තාවලට ප්‍රවේශය ලබාදීම ඒ සෑම අධ්‍යක්ෂවරයකුගේම කළමනාකරුවකුගේම, ලේකම්වරයකුගේම, සේවා නියුක්තයකුගේම හෝ විගනකවරයකුගේම කාර්යය වන්නේය.

(4) ඒ නියෝජිතයා සහ ඔහුගේ සහායක කාර්ය මණ්ඩලය සේවයේ නියුක්තකිරීමේ පිරිවැය මුදල් සමාගමෙන් අයකර ගත යුතුය.

(5) නියෝජිතයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීමේ නියමයන් හා කොන්දේසි, මණ්ඩලය විසින් නිශ්චය කළ යුතුය.

(6) නියෝජිතයා විසින් මේ වගන්තිය යටතේ ඔහුගේ බලතල ක්‍රියාතමක කිරීම, අධ්‍යක්ෂවරයාගේ විධානය සහ අධීක්ෂණය යටතේ කළ යුතුය.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1)එහි පළවන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) අධ්‍යක්ෂවරයාගේ වාර්තාවක දක්වා ඇති සිද්ධි සහ අවස්ථාගත කරුණු සමාලෝචනය කිරීමෙන් පසුව මුදල් සමාගමක ආදී හෝ වර්තමාන අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, සේවා නියුක්තයකුහෝ අනුයෝජිතයකු විසින්, සමාගමට අයිති යම් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයක අනිසි ලෙස උපයෝගී කිරීමෙන් වංචනික ලෙස, සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස තමාම පොහොසත් වී ඇති බව හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පොහොසත් කර ඇති බව නැතහොත් නොකර හැරීමේ යම් ක්‍රියාවකින් සමාගමට අයත් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයක අනිසි ලෙස, උපයෝගීකර ගැනීමෙන් හෝ වංචනික ලෙස සාද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස වෙනත් යම් තැනැත්තකුට පොහොසත්වීමට ශක්‍යතාව

ලබා දී ඇති බව මණ්ඩලයේ මතය වන්නේ නම්, 18 වන හෝ 20 වන වගන්තිය යටතේ පියවර ගනු ලැබ ඇත්තේ වුවද මුදල්

සමාගමට ආරෝපණය කරනු ලැබිය හැකි හෝ මුදල් සමාගමට අයත් යයි යුක්තිසහගත ලෙස සැක කරනු ලැබිය හැකි හෝ මුදල් සමාගමට අයත්ව තිබූ බවට යුක්තිසහගත ලෙස සැක කරනු ලැබිය හැකි වූ ද යම් වත්කමක් අත්කර ගැනීමට යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හෝ යම් ණයක් හෝ බැරකමක් නිදහස් කිරීමට උපයෝගී කරනු ලැබූ වියදම් කරනු ලැබූ මුදල් හෝ දේපළ, ඒ මුදල සහ දේපළ මත, සුදුසු යැයි මණ්ඩලය විසින් අදහස් කරනු ලබන පොලිය සමග මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාලපරිච්ඡේදයක් ඇතුළත ආපසු ගෙවන ලෙස හෝ පුනස්ථාපනය කරන ලෙස ඒ අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායකයාට, කළමනාකරුට, සේවා නියුක්තයාට, අනුයෝජිතයාට හෝ වෙනත් යම් තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) එහි (උ) ඡේදයේ-

(i) "ආරෝපණය කළ හැකි මුදල්වලින් මිලට ගත් දේපළ හෝ වත්කම්" සහ "දැන්වීමේ නිශ්චිතව සඳහන්, යන වචන වෙනුවට පිළිවෙළින් "ආරෝපණය කළ හැකි මුදල් අනිසි ලෙස උපයෝගී කිරීමෙන් හෝ අයථා ලෙස යෙදවීමෙන් මිලට ගන්නා ලද හෝ වෙනත් යම් ආකාරයකින් අත්කර ගන්නා ලද දේපළ හෝ වත්කම්, සහ "දැන්වීමේ නිශ්චිතව සඳහන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "මේ ඡේදය යටතේ නිකුත් කරන ලද" යන වචන සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"මේ ඡේදය යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්ම, දින අනූවක කාලයක් බලාත්මකව පැවතිය යුතු අතර, (උ) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් බලාත්මකව පවත්නා කාලය තුළ ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් යම් දේපළක හෝ වත්කම්වල අයිතිය, සන්තකය හෝ වෙනත් සම්බන්ධතා පිළිබඳව යම් පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේය.";

(ආ) එහි (ඒ) ඡේදයේ "නියම කළ හැකිය" යන වචන වෙනුවට "නියම කළ හැකිය තවද දැන්වීමක් බලාත්මකව පවත්නා කාලය තුළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා, මෝටර් වාහන කොමසාරිස්

වරයා සහ සමාගම රෙජිස්ට්‍රාර්වරයා සහ ඒ දැන්වීමේ පිටපතක් (ඌ) ඡේදය යටතේ භාර දෙනු ලැබූ වෙනත් අදාළ බලධරයකු විසින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දේපළට හෝ වත්කම්වලට අදාළ යම් පැවරීමේ ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් හෝ හිමිකම සම්බන්ධ වෙනත් ලේඛනයක් ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.;" තවද

(ඇ) එහි (ඔ) ඡේදයේ-

(i) (ii) වන අනුඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :-

" (ii) (1) වන අනුඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබීමෙන් පසුව සහ (1) වන උපවගන්තියෙහි සඳහන් මුදල් සමාගමක ආදී හෝ වර්තමාන

අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායකයකු, කළමනාකරුවකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් සමාගමට අයත් යම් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයකින් අනිසි ලෙස උපයෝගී කිරීමෙන් වංචනික ලෙස, සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස තමාම පොහොසත් වී ඇති බව හෝ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පොහොසත් කර ඇති බව, නැතහොත් නොකර හැරීමේ යම් ක්‍රියාවකින්, සමාගමට අයත් මුදලක් හෝ දේපළක් අයථා පරිදි යෙදවීමෙන් හෝ වෙනත් ආකාරයක අනිසි ආකාරයක උපයෝගී කිරීමෙන් වංචනික ලෙස, නීති විරෝධී ලෙස හෝ සාවද්‍ය ලෙස වෙනත් යම් තැනැත්තකුට පොහොසත් වීමට ශක්‍යතාවය ලබාදීම කර ඇති බව දිසා අධිකරණය සෑහීමට පත්වන්නේ නම්-(අ) මුදල් සමාගමේ ඒ අධ්‍යක්ෂවරයාට, ප්‍රධාන විධායක, කළමනාකරුට, සේවා නියුක්තයාට හෝ එසේ පොහොසත් වූ වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට අයත් යම් දේපළක් හෝ වත්කම් ; හෝ

(ආ) මුදල් සමාගමේ ඒ අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක, කළමනාකරු, සේවා නියුක්තයා හෝ අනුයෝජිතයා වෙනුවෙන් ඥාතියකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් භාරයක් වශයෙන් දරනු ලබන යම් දේපළක් හෝ වත්කම් ; හෝ

(ඇ) මුදල් සමාගමේ වත්කම්වල ආරෝපණය කළ හැකි මුදල් වලින් අත්කර ගනු ලැබූ හෝ මිලට ගනු ලැබූ යම් දේපළක් හෝ වත්කම් තහනමට ගෙන විකිණීමට පිස්කල්වරයාට බලය දෙන සහ ඔහු නියම කෙරෙන ක්‍රියාවේ යෙදවීමේ රිට් බලපත්‍රයක් නිකුත්කිරීමට විධාන කළ යුතුය.

(iii) (ඔ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ නිකුත් කරන ලද රිට් බලපත්‍රයක් අනුව යම් දේපළක් හෝ වත්කම් විකුණනු ලබන අවස්ථාවක, මුදල් සමාගමට ආරෝපණය කරනු ලැබිය හැකිවූ ද අධිකරණය විසින් දරනු ලබන මුදල් වලට වැඩිවූ ද විකිණීමෙන් ලත් මුදල්වල යම් අතිරික්තයක් වේනොත්, එය ඒ වත්කම්වල හෝ දේපළෙහි අයිතිකරුට ආපසු ගෙවනු ලැබිය යුතුය.";

(ii) එම ඡේදයේ (iii) වන සහ (iv) වන අනුඡේද (iv) වන සහ (v) වන අනුඡේද ලෙස නැවත අංක යෙදීමෙන්.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ඇ) මුදල් සමාගම් ව්‍යාපාරයේ කවර හෝ අංශයක් හා සම්බන්ධව ප්‍රකාශ පත්‍රයක් හෝ ප්‍රචාරක දැන්වීමක් යම් මුදල් සමාගමක් විසින් නිකුත් කිරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම සහ එවැනි යම් ප්‍රකාශ පත්‍රයක් හෝ ප්‍රචාරක දැන්වීමක් නිකුත් කළ හැක්කේ යම් කොන්දේසිවලට යටත්වද ඒ කොන්දේසි."

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කරන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

38. (1) මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ නඩු විභාගයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු අවුරුදු තුනකට වැඩි නොවූ කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත

කරනු ලැබීමට හෝ රුපියල් පණස් දහසකට අඩු නොවූ සහ රුපියල් එක් මිලියනයකට වැඩිනොවූ දඩයකට හෝ යටත් විය යුතුය.

(2) මේ පනත යටතේ වූ වරදකට වරදකරු බව තීරණය කරනු ලැබ දඩයක් ගෙවීමට ආඥා කරනු ලබන සංස්ථාවක අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්කරයකු විසින් හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක සාමාජිකයකු විසින් ඒ දඩය හෝ එහි යම් කොටසක් ගෙවීම සඳහා ඒ සංස්ථාවේ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයේ යම් අරමුදලක් යොදාගනු ලැබුවහොත් ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය

(3) මේ පනත යටතේ ලැබෙන සියලු දඩ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පත්කරුවන්ගේ සහන අරමුදලට බැර කරනු ලැබිය යුතුය.".

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ "මුදල් සමාගම" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"මුදල් සමාගම්" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනතේ අර්ථකථනය කරන ලද පරිදි වූ ද මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද සමාගමක් අදහස්වන අතර, මේ පනත යටතේ මණ්ඩලය විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් හෝ ගනු ලැබිය හැකි යම් පියවරක කාර්ය සඳහා 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලනය කිරීමේ පනතේ අර්ථානුකූල යම් ආයතනයක් ද, මේ පනත ක්‍රියාත්මකවන දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඒ ආයතනය විසින් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවසන් කරනු ලැබුව ද, ඇතුළත් වන්නේ යයි සලකනු ලැබිය යුතුය.

**9**. 1990 නොවැම්බර් මාසයේ 20 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත, හදිසි අවස්ථා (මුදල් සමාගම්) නියෝග සමග කියවිය යුතු 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ කරන ලද ක්‍රියාවක්, කරන ලද නියමයන් හෝ දෙන ලද විධානයක්, ඒ නියෝග සෑදීමට මහජන ආරක්ෂක ආඥාපනතින් බලය දී තිබුනාක් සේ, වලංගු හා බල සහිත විය යුතුය.

**10**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය

## 1991 අංක 24 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 ජුනි මස 20 වනදින.]

### රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**1**. මේ පනත 1991 අංක 24 දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රේගු ආඥා පනතේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම් ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යවහාර මුදල්වල වටිනාකම්වලට පරිවර්ථනය කිරීම, තීරු බද්ද

ගෙවිය යුතු බඩුවලට අදාළ රේගු සටහන්කරය ඉදිරිපත්කිරීමේදිනයෙහි පැවති පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද විනිමය අනුප්‍රමාණයන්ට අනුකූලව කරනු ලැබිය යුතුය.".

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය එහි (3) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

" (2) මෙහි මින් මතු විධිවිධාන සළස්වා ඇති පරිදි හැර ආනයනය කිරීමෙන් පසු පාවිච්චි කරනු ලැබ ඇත්තා වූ බඩුවලට මේ වගන්තිය අදාළ නොවිය යුතුය".

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ "රුපියල් දෙදහසක්" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තියේ "වෙන්දේසියේ විකුණනු ලැබිය යුතුය." යන වචන වෙනුවට "වෙන්දේසියේ හෝ ටෙන්ඩර් මගින් විකුණනු ලැබිය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 127 ආ වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 127ඇ වගන්තිය වශයෙන් බල සහිත විය යුතුය:-

127ඇ. වටිනාකම රුපියල් මිලියන එකක් ඉක්මවන්නා වූ බඩු කිසිවක් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සැක කරනු ලැබූ හෝ චෝදනා කරනු ලැබූ කිසිම තැනැත්තකු, විශේෂතම අවස්ථාවලදී මහාධිකරණය විසින් හැර, ඇප පිට මුදා නොහැරිය යුතුය. මේ වගන්තියෙන් මහාධිකරණය වෙත පවරා ඇති බලය, චූදිතයා පදිංචි කලාපයෙහි පවත්වනු ලබන මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් හෝ වරද සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන්නේ යම් කලාපයක දී ද ඒ කලාපයේ පවත්වනු ලබන මහාධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.";

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 145 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

145. (1) මේ ආඥාපනත යටතේ පමුණුවනු ලැබුවා වූ මුදල් ප්‍රමාණයකින් වූ සෑම දණ්ඩනයන් සහ රාජසන්තක කිරීම් මේ ආඥාපනත යටතේ පමුණුවනු ලැබුවා වූ සියළු දණ්ඩන සහ රාජ සන්තක කිරීම් සහ ඒ මත වූ යම් පොලී සඳහා ඒ දණ්ඩනය හෝ රාජ සන්තක කිරීමකට ඒ දණ්ඩනය හෝ රාජසන්තක කිරීම පමුණුවනු ලැබුවේ යම් දිනයක දිද ඒ දින සිට ගෙවීමේ දිනය දක්වා මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලබන යම් පොලී අනුපාතයක් ඇතුලත්ව තිබිය යුතුය. යටත් පාර්ශ්වකරු පදිංචිව සිටින්නේ යම් අධිකරණ බලසීමාවක් තුළ ද ඒ අධිකරණ බලසීමාවේ ප්‍රාදේශීය සීමාවන් ඇතුළත පිහිටි දිසා අධිකරණයෙහි නීතිපතිවරයාගේ නාමයෙන් නඩුවක් පවරා අයකර ගනු ලැබිය හැකිය. එවැනි සෑම නඩුවක් පැවරීම හා විභාග කිරීම සම්බන්ධයෙන් 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 12 වන,

13 වන, 14 වන, 15 වන, සහ 23 වන වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ දිසා අධිකරණයක නඩුවක් පවරා ඇති අවස්ථාවක, වෙනත් කටයුතු සම්බන්ධයෙන් කලින් සුදුස්සක් කිරීම අවස්ථාගත කරුණු අනුව අවශ්‍ය වන්නේ නම් මිස, ඒ නඩුව විභාග කොට සුදුස්සක් කිරීමට අධිකරණය විසින් ප්‍රමුඛත්වය දෙනු ලැබිය යුතුය.";

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (3) යම් නැව්, බෝට්ටු, බඩු හෝ වෙනත් දේ සම්බන්ධයෙන් තිසි අධිකරණයෙහි නඩු කටයුතු පැවරීමෙන් පසු අධිකරණය විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ඉල්ලීම මත සහ හිමිකම් පාන්නන් ඊට විරුද්ධ නොවන්නේ නම් ඒ නැව්, බෝට්ටු, බඩු හෝ වෙනත් දේ සම්බන්ධයෙන් සුදුස්සක් කොට විකිණීමෙන් ලත් මුදල් අධිකරණයෙහි තැන්පත් කිරීමට ඒ අධ්‍යක්ෂ ජනරාල් වරයාට බලය දෙනු ලැබිය හැකිය. ඒ නැව්, බෝට්ටු බඩු හෝ වෙනත් දේ සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට හිමිකම් පාන්නන් විරෝධය දක්වනඅවස්ථාවක, ඒ නැව්, බෝට්ටු, බඩු හෝ වෙනත් දේ සම්බන්ධයෙන් (ඒ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තක්සේරු කරනු ලබන පරිදි) ඒවායේ වෙළඳ වටිනාකම සමාන ඇප මුදලින් අධිකරණයෙහි තැන්පත් කිරීමට අධිකරණය විසින් හිමිකම්පාන්නන්ට නියම කරනු ලැබිය හැකිය.";

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය මෙයින් ඉවත්කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 166 වන වගන්තියේ (1) වන උප වගන්තියේ "රුපියල් එක්සියයක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් දසදහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වි යුතුය.

## 1991 අංක 26 දරන සුරාකුම්පත් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 5 වන දින.]

## 1987 අංක 36 දරන සුරාකුම්පත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1.** මේ පනත 1991. අංක 26 දරන, සුරකුම්පත් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1987 අංක 36 දරන සුරකුම්පත් සභා පනතේ දීර්ඝ නාමයෙහි "ශ්‍රී ලංකාවේ සුරාකුම්පත් වෙළඳපල විධිමත් කිරීමේ කාර්යය සඳහා සුරාකුම්පත් සභාව පිහිටුවීම සඳහාද සුරාකුම්පත් වෙළඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට" ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ සුරාකුම්පත් වෙළඳපොළ විධිමත් කිරීමේ

කාර්ය සඳහා සුරැකුම්පත් සභා විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද, සුරැකුම්පත් වෙළඳ ව්‍යාපාරයෙහි යෙදෙන ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට ඒකක භාරකරුවන්ට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තරව්කරුවන්ට, යන වචන ආදේශ කිරීමෙන්, එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3**. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක-

(අ) "සුරැකුම්පත් සභා පනත" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යන වචන

(ආ) සුරැකුම්පත් සභාව හඳුන්වන "සුරැකුම්පත් සභාව" සහ "සභාව" යන වචන වෙනුවට පිළිවෙලින් "ශ්‍රී ලංකා සුරැකුම්පත් සභා විනිමය කොමිෂන් සභාව සහ කොමිෂන් සභාව යන වචන ආදේශ විය යුතුය.

(2) කිසියම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, පණිවිඩ හුවමාරුවක හෝ වෙනත් ලේඛනයක "සුරැකුම්පත් සභා පනත" සහ සුරැකුම්පත් සභාව" පිළිබඳ වූ සෑම සඳහන් කිරීමක් ම පිළිවෙළින් "ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමයකොමිෂන් සභා පනත සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ ශ්‍රී ලංකා සුරැකුම් පත් සහ විනිමය කොමෂන් සභාව පිළිබඳ ව සටහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතුය.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන ආකාරයට මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම (5) වන උපවගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වීම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ අවසානයට, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :-

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "රැස්වීමේ මූලාසනයදැරීම" යන වචන වෙනුවට "එම රැස්වීමේ මූලාසනය දැරීම" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" (3) කොමිෂන් සභාවේ එක් සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා හෝ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා නොසිටින අවස්ථාවලකොමිෂන් සභාවේ ඕනෑම සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඉදිරිපිට දී මිස, සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් එසේ පැමිණ සිටිබවට සාක්ෂියක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි හෝ අත්සන් කළ යුතුය."

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියෙහි (ආ) ජේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ආ) ආයෝජකයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම ;"

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියපහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (ආ) ජේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ජේදය ඇතුළත්

කිරීමෙන් :-

"(ආආ) ඒකක භාරයක් පවත්වා ගෙන යාම සඳහා කළමනාකරණ සමාගමකට බලපත්‍රයක් ප්‍රදානය කිරීම සහ එම ඒකක භාරයෙහි ව්‍යාපාර කටයුතු තිසි ලෙස කරගෙන යන බවට වග බලා ගැනීම".

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්ත විනිමය ස්ථානයකට හෝ කළමනාකරණ සමාගමකට හෝ බලපත්‍රලත් ඒකක භාරයක භාරකරුට හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට හෝ කලින් කල විධාන තිකුත් කිරීම;";

(3) ඒ වගන්තියේ (උ) ඡේදය ඉවත් කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (ඌ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ඌ) යම් සුරැකුම්පත් ලැයිස්තුගත කිරීම හෝ ලැයිස්තු ගත කළ සුරැකුම්පත් කිසිවක් සම්බන්ධ වෙළඳාම් කිරීම ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා අවලංගු කිරීම හෝ අත්හිටුවීම නැතහොත් සියලුම ලැයිස්තුගත කළ සුරැකුම්පත් සම්බන්ධ වෙළඳාම් කිරීම් එක් වරකට දින තුනකට වැඩි නොවන කාල සීමාවකට අත්හිටුවීම;";

(5) ඒ වගන්තියේ (එ) ඡේදයෙහි "ව්‍යාපාර වස්තුවෙළෙන්දෙකු හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ පොදු සමාගම්වල ද" යන වචන වෙනුවට "ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ ඒකක භාරයක් සහ පොදු සමාගම්වල" යන වචන ආදේශ කිරීමෙන් ;

(6)ඒ වගන්තියේ (ඒ) ඡේදයෙහි "යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් හෝ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ" යන වචන වෙනුවට "යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු විසින් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් හෝ බලපත්‍ර ලත් ඒකක භාරයක භාරකරු නැතහොත් කළමනාකරණ සමාගම විස්න හෝ බලපත්‍රලත් අන්‍යොන්‍ය අරමුදලක රැකවරණකරු නැතහොත් කළමනාකරණ සමාගම විසින් හෝ වයාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කළ යන වචන ආදේශ කිරීමෙන්න

(7) ඒ වගන්තියේ (ග) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ග) 1982 අංක 17 දරන සමාගම් පනතේ 227 වන වගන්තියෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් සීමිත වගකීම් සහිත පෞද්ගලික සමාගමකට සීමිත වගකීම් සහිත පොදු සමාගමක් බවට පත්වන ලෙසට තියම කරන මෙන්, එම රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලා සිටීම ත සහ (ව) මෙම පනත යටතේ කොමිෂන් සභාවේ අරමුණු ඉෂ්ටකර ගැනීමට හෝ එහි බලතල ක්‍රියාවේ යෙදවීමට හෝ අනුශංගික වන්නා වූ නැතහොත් උපකාරී වන්නා වූ වෙනත් සියලු ක්‍රියා කිරීම;".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (අ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථාන, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, ව්‍යාපාර වස්තු වෙළෙන්දන් සහ ඒකක භාර විසින් මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද කිසියම් රීතිවලට හෝ නියෝගවලට හෝ අනුකූලව තම කටයුතු කරගෙන යත්දැයි තීරණය කිරීම සඳහා ඒවායේ ක්‍රියාකාරකම් පිළිබඳව සෝදිසි කිරීම්පැවැත්වීමට සහ එම සෝදිසිකිරීම් කරගෙන යාමේදී දරන ලද වියදම්, ක්‍රියාකාරකම් සෝදිසි කරනු ලැබූ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලින්, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගෙන්, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ගෙන් හෝ ඒකක භාරයේ කළමනාකරණසමාගමෙන් අයකර ගැනීම"; සහ

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට" යන වචන වෙනුවට "බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානවලට, ව්‍යාපාර වස්තුතැරැව්කරුවන්ට, ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ට සහ බලපත්‍රලත් ඒකක භාරවල කළමනාකරණ සමාගම්වලට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

" (ඇ) බලපත්‍රලත් ඒකක භාරයෙහි ඒ වර්ෂය සඳහා වූ ක්‍රියාකාරකම් පිළිබඳව යටත් පිරිසෙයින් වාර්ථා දෙකක් සෑම වර්ෂයක් වෙනුවෙන්ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස, බලපත්‍රලත් ඒකක භාරයෙහි කළමනාකරණ සමාගම වෙත නියම කිරීම. එවැනි සෑම වාර්ථාවකම, නියමිත විස්තර අඩංගු විය යුතුය. පළමුවන වාර්තාව ඒ වර්ෂයේ සැප්තැම්බර් මාසයේ තිස් එක්වන දිනයට පෙරාතුව ද, දෙවන වාර්තාව තදනන්තර වර්ෂයේ මාර්තු මස 31 වන දිනයට පෙරාතුව ද ඉදිරිපත් කරනු ලැබිය යුතුය.".

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "මෙහි උපලේඛනයේ II වන කොටසෙහි දක්වා ඇති, යන වචන වෙනුවට" "මෙහි උපලේඛණයේ III වන කොටසෙහි දක්වා ඇති" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. 18. වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුගත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

18අ. (1) ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ විසින් සපයනු ලැබූ විස්තර පදනම් කරගෙන ව්‍යවහාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යවහාර වස්තු වෙළෙන්දකු හෝ වෙත බලපත්‍රයක් ප්‍රධානය කරනු ලැබ බලපත්‍රයක් ප්‍රධානය කරනු ලැබතදනන්තරව ඒ විස්තර සාවද්‍ය හෝ අසත්‍ය බවට පෙනී ගොස් ඇති අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දා වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය, නිශ්චිත කාලයක් සඳහා අත්හිටුවනු ලැබිය යුතු අතර, එම අත්හිටුවීමේ කාලසීමාව අවසන් වීමට පෙර නිවැරදි විස්තර සපයන ලෙස, එම ව්‍යාපාර, කොටස් තැරැව්කරුගෙන් හෝ ව්‍යාපාර වස්තු කොටස් වෙළෙන්දාගෙන් හෝඉල්ලා සිටිනු ලැබිය යුතුය. එම විස්තර ලැබුනු විට, ඒවා සලකා බැලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් එහ අත්හිටුවීමේ නියමය ප්‍රත්‍යදිෂ්ට කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට අනුව, ඒ උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ කාලසීමාව ඇතුළත විස්තර සපයනු නොලබන්නා වූ හෝ සපයන ලද තොරතුරු සලකා බලා අත්හිටුවීමේ නියමය ප්‍රත්‍යාදිෂ්ට නොකළයුතු බවට කොමිෂන් සභාව තීරනය කරන්නා වූ හෝ අවස්ථාවක, කොමිෂන් සභාව විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතුය.".

**12** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වනඋප වගන්තිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් ස්වකීය බලපත්‍රය අලුත් කරවා ගැනීම සඳහා නියමිත ආකෘති පත්‍රයෙහි වූ ඉල්ලුම් පත්‍රයක්, නියමිත ගාස්තුව ද සමග එකී බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර වූ මාස හය ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය."

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "අවලංගු කිරීමට පෙර" සහ බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ, යන වචන වෙනුවට, පිළිවෙලින්, "අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට හෝ පෙර, සහ "බලපත්‍රය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ නොකළ යුත්තේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :-

" (4) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) හෝ (ඇ) හෝ (ඈ) ඡේදවල විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට සහ එම උල්ලංඝන කිරීම බරපතල ස්වභාවයේ උල්ලංඝනය කිරීමක් නොවන බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ක්‍රියා කරනු ලැබීම වෙනුවට:-

(අ) එම උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයෙන් ඇතිවූ තත්ත්වය නිවැරදි කිරීමට හෝ හරිගැස්සීමට ; හෝ

මේ පනතේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් රීතියක් හෝ නියෝගයක් අනුව ක්‍රියා කිරීමට නැතහොත්, එම උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යාමෙන් වැළකී සිටීමට සුදුසු යයි කොමිෂන් සභාව සලකන කිනම් හෝ ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට විධාන කරනු ලැබිය හැකි.ය.

(5) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ වෙත කොමිෂන් සභාව විසින් (4) වන වගන්තිය යටතේ විධානයක් කරනු ලැබීමෙන්, එම ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තුවෙළෙන්දාට හෝ එරෙහිව මේ පනත යටතේ වරදක් සඳහා නඩු පැවරීමක් හෝ නඩුවක් පවත්වාගෙන යාම හෝ කෙරෙහි බලපෑමක් හෝ ඊට අගතියක් නොවන්නේය

**14**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයෙහි "21 වන වගන්තිය යටතේ" යන වචන වෙනුවට "18අ වන සහ 21 වන වගන්තිය යටතේ" යන

වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියෙහි, "ඉතිරිව පවතින ගිවිසුම්" අවස්ථාවෝචිත පරිදි, යන වචන වෙනුවට "සුරැකුම්පත් පිළිබඳ ගනුදෙනුවලට අදාළව ඉතිරිව පවතින ගිවිසුම්" අවස්ථාවෝචිත පරිදි, යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**16.** 23 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

23අ. (1) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය පොදු යහපත උදෙසා අත්කර ගැනීම අවශ්‍ය යයි කොමිෂන් සභාවෙහි මතය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහාඑම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයෙහි පාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කරගනු ලැබිය හැකිය. ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබනතදනන්තර දැන්වීමක් මගින්, පළමු දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව කොමිෂන් සභාව විසින් දීර්ඝ කරනු ලැබිය හැකිය.එවැනි සෑම දැන්වීමක ම පිටපතක් කොමිෂන් සභාව විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීමට සලස්වනු ලැබිය යුතුය. එම රෙජිස්ට්‍රාර්වරයා, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වාගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාම පිණිස බලපත්‍ර ලබා ඇති සමාගමට අදාළ ලේඛනවල. ඒ පිළිබඳ සටහනක් කළ යුතුය

(2) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය සථානයක පරිපාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කර ගන්නා ලද අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ලැයිස්තු ගත සමාගම්වලආයෝජකයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි සැලකිලිමත්ව, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ කළමනාකරණය සඳහා යම් තැනැත්තකු සමග ගිවිසුමකට එළඹීම, කොමිෂන් සභාව සහ එම තැනැත්තා අතර එකඟත්වයට එළඹෙන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය හැකිය

(3) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කර ගනු ලබන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් හෝ, කොමිෂන් සභාව (2) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු සමග ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවකදී ඒ තැනැත්තා විසින් හෝ:-

(අ) කිසියම් ලිඛිත නීතියක් මගින් හෝ එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වාගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාම පිණිස බලපත්‍ර ලබා ඇති සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ ඒ යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන්කර දී ඇති සියලු බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට අදාළව ක්‍රියාවේ යෙදවීම, කිරීම, සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාව නැතහොත් ඒතැනැත්තා විසින් කරනු ලබන එවැනි සෑම ක්‍රියාවේ යෙදවීමක්, කිරීමක් සහ ඉටුකිරීමක් ම, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් කරනු ලැබූ ලෙස වලංගු සහ බලසහිතවිය යුතුය ; තව ද

(ආ) (1)) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයෙහි බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් පරිහරණය කරන ලද වංචල හෝ නිශ්චල දේපළ කිසිවක්, එකී බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වාගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාමේ කාර්ය සඳහා තම සන්තකයට ගැනීම සහ පරිහරණය කිරීම කරනු ලැබිය හැකිය.

(4) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක පරිපාලනය සහ කළමනාකරණය කොමිෂන් සභාව විසින් අත්කරගනු ලැබ ඇත්තේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාල සීමාව තුළදී, කිසියම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නැතහොත් එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය පවත්වා ගෙන යාමේ ව්‍යාපාරය කරගෙන යාම පිණිස බලපත්‍ර ලබා ඇති සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය මගින් හෝ එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට පවරා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කරදී ඇති බලතල, කර්තව්‍ය හෝ කාර්යයන් කිසිවක් ක්‍රියාවේ යෙදවීමට, කිරීමට හෝ ඉටු කිරීමට කොමිෂන් සභාව විසින්, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ අධ්‍යක්ෂවරයකුට හෝ නිලධරයකුට ප්‍රකාශිතව ම බලය පවරා දී ඇත්නම් මිස, ඒ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකුම, එකී බලතල ක්‍රියාවේ යෙදවීම, කර්තව්‍යයන් කිරීම හෝ කාර්යයන් ඉටු කිරීම නතර කළ යුතුය.

(5) (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි නිශ්චිත කාලසීමාව අවසන්වීමට පෙර ඕනෑම අවස්ථාවක දී, එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ රීතිවලට අනුකූලව එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංස්ථාපනය කරන ලෙස, කොමිෂන් සභාව විසින් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට දන්වා සිටිය හැකි අතර, එසේ නැවත සංස්ථාපනය කිරීමෙන් පසුව සහ එම කාල සීමාව අවසන්වූ විට, (3) වන උපවගන්තිය යටතේ සන්තකයට ගන්නා ලද දේපළ, නැවත සංස්ථාපනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාර දෙනු ලැබිය යුතුය.".

**17**. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "වෙනස් කිරීමෙන් හෝ එකතු කිරීමෙන්" යන වචන වෙනුවට "වෙනස් කිරීමෙන් හෝ එකතු කිරීමෙන්" යන වචන ආදේශකිරීමෙන්;

(2) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(5) මේ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල කුමක් සඳහන්ව ඇත ද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක රීතිවලට කරනු ලබන, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් නියමිත වර්ගවල සංශෝධන (2) වන උපවගන්තියෙහි සඳහන් ලියවිල්ලකින් වූ දැන්වීම ඉදිරිපත් කළ වහාම ක්‍රියාත්මක විය යුතුය. එසේ වුව ද, එම සංශෝධනය ක්‍රියාත්මක වීමෙන් දින විසි එහි ඇතුළත, එය යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, කොමිෂන් සභාව විසින්, එම සංශෝධනයට ඉඩ නොදී, මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කරන ලෙස ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට උපදෙස් දෙනු ලැබීමේ කොන්දේසියට මෙය යටත් වන්නේය."

**18**. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, එම වගන්තියෙහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්

(2) නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කිරීමෙන් :-

" (2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ අඩංගු විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා සාදන ලද රීති මගින් නිශ්චිතව නියම කරනු ලබන වර්ගවල යම් වෙනස් කිරීම්, ඒ වෙනස් කිරීම පිළිබඳව කොමිෂන් සභාව වෙත දැන්වූ වහාම ක්‍රියාත්මක විය යුතුය.".

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියෙහි "වරදකට වරදකරු වන අතර" යන වචන වෙනුවට "වරදකට වරදකරු වන අතර" මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

28. (1) (අ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද පොදු සමාගමක කොටස් දරන කිසිම තැනැත්තකු, එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් උපයෝගි කර ගනු ලබන වෙළඳ කාර්යපටිපාටියට අනුකූලව මිස, කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය නොමැතිව ඒ කොටස් මිලට ගැනීම, විකිණීම, තෑගි කිරීම හෝ ඒවා සම්බන්ධයෙන් අන් ආකාරයකින් ගනුදෙනු කිරීම නොකළ යුතුය;

එසේ වුව ද යෝජිත තෑගි කිරීම පිළිබඳ විස්තර යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත සහ බලයලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය වෙත කලින් දැනුම් දෙනු ලැබුවහොත්, එකී වෙළඳ කාර්ය පටිපාටියට වෙනස් ලෙස ඔහු විසින් එවැනි යම් කොටසක් ඥාතියකුට ත්‍යාග කරනු ලැබිය හැකිය

(ආ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද පොදු සමාගමක කොටස් දරන තැනැත්තකු මිය ගිය විට, කොමිෂන් සභාවේ අනුමතිය ඇතිව මිස, වෙනත් යම් තැනැත්තකුගේ නමින් ඒ කොටස් ලියාපදිංචි නොකරනු ලැබිය යුතුය.

මේ උපවගන්තියෙහි යම් තැනැත්තකුට අදාළව "ඥාතියකු" යන්නෙන් ඒ තැනැත්තාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු, භාර්යාව හෝ පුරුෂයා හෝ දරුවකු හෝ ඒ තැනැත්තාගේ දරුවකුගේ භාර්යාව හෝ පුරුෂයා අදහස් වේ.

(2) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමයස්ථානයක් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙක් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දෙක්, ලැයිස්තුගත කරන ලද සුරැකුම්පත් කිසිවක් මිල දී ගැනීම, විකිණීම හෝ ඒවා පිළිබඳව අන්දෙයක් කිරීම සම්බන්ධයෙන් කෙලින් ම හෝ අන්‍යාකාරයකින්-

(අ) යම් තැනැත්තකුට වංචා කිරීමේ අදහසින් කිසියම් උපක්‍රමයක් යෙදීම හෝ ප්‍රයෝගයක් කිරීම;

(ආ) යම් තැනැත්තකු කෙරෙහි වංචාවක් හෝ කපටකමක් වශයෙන් ක්‍රියාත්මක වන කිසියම් ව්‍යාපාරික පරිචයක හෝ ක්‍රියා මාර්ගයක හෝ නිරතවීම ; හෝ

(ඇ) වැදගත් කාරණයක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශයක් කිරීම හෝ කරන ලද ප්‍රකාශයන් අසත්‍ය හෝ නොමග යවන සුළු නොවීම සඳහා අවශ්‍ය වැදගත් කරුණක් ප්‍රකාශ කිරීම පැහැර හැරීම නොකළ යුතුය..".

**21**. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන ගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති මෙයින් ආදේශ කරනු ලැබේ:-

**29**. කිසිම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින්-

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමතිය නොමැතිව, තමා සාමාජිකයකුව සිටින බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයෙන් බාහිරව, ලැයිස්තුගත කළ සුරැකුම්පත් වෙළඳාම් කිරීම හෝ අන් ආකාරයකින් ගනු දෙනු කිරීම හෝ කරනු නොලැබිය යුතුය;

(ආ) ලැයිස්තුගත කළ සුරැකුම්පත් නිෂ්කාෂනය කිරීමට, ගෙවීමට සහ භාර දීමට අදාළව කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබන රීති උල්ලංඝනය වන ආකාරයකට ලැයිස්තුගත කළ සුරැකුම්පත් වෙළඳාම් කරනු නොලැබිය යුතුය;

(ඇ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය තමා සාමාජිකයකුව සිටින බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය විසින් දක්වා ඇති නියමයන්ට පටහැනි වන ආකාරයට ආන්තික ගිණුමක ගනුදෙනු කිසිවක් කරනු නොලැබිය යුතුය;

(ඈ) ලැයිස්තුගත කළ සුරැකුම්පත් කිසිවක් මිලට ගැනීමට හෝ විකිණීමට හෝ පෙළඹවීම පිණිස හෝ පෙළඹවීමට තැත් කිරීම පිණිස කිසියම් උපක්‍රමශීලී, මුලාකාරී හෝ වෙනත් වංචාකාරී ක්‍රමයක් නැතහොත් ප්‍රයෝගයක් මගින්, කිසියම් ගනුදෙනුවක් කරනු නොලැබිය යුතුය.";

**22**. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ව්‍යාපාර වස්තු "විනිමය ස්ථානයක් වශයෙන්" යන වචන වෙනුවට "ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන වගන්තියේ "වරදකට වරදකරු වන අතර, යන වචන වෙනුවට "වරදකට වරදකරු වන අතර" මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු" යන වචන ආදේශ කිරීමෙන්.

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම කොටස ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ කොටස ලෙස ක්‍රියාත්මක විය යුතුය:-

## "IIIඅ කොටස

## ඒකක භාරයකට බලපත්‍ර ප්‍රදානය කිරීම

31අ. ඒකක භාරයක් පවත්වාගෙන යාමට අදහස් කරන කළමනාකරණ සමාගමක් විසින් එවැනි ඒකක භාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කරනු

ලැබීම පිණිස නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රයක්, නියමිත ගාස්තුවද සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු.ය. එවැනි සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම, විනිමය ලේඛන අමුණා තිබිය යුතුය.

31ආ. ඒකක භාරයක් මෙහි උපලේඛනයේ IV වන කොටසෙහි ඇති නියම සහ කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, ඒකක භාරයක් පවත්වාගෙන යාම සඳහා මේ කොටස යටතේ කිසිම බලපත්‍රයක් ප්‍රධානය කරනු නොලැබිය යුතුය.

31ඇ. 31අ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, කොමිෂන් සභාව විසින්, එහි සඳහන් විස්තර සහ ඉල්ලුම් පත්‍රය සමග එවන ලද ලේඛන සලකා බලා, අවශ්‍ය යයි සලකන අවස්ථාවල, පෞද්ගලිකව ම හෝ නියෝජිතයකු මගින් හෝ ඉල්ලුම්කරුට සවන්දීමේ අවස්ථාවක් ඉල්ලුම්කරු වෙත සැලසිය යුතු අතර ඔහුට බලපත්‍රයක් ප්‍රදානය කරන්නේ ද නැද්ද යන වග ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලුම්කරු වෙත දන්වනු ලැබිය යුතුය..

31ඇ. (1) ඒකක භාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද බලපත්‍රයක්–

(අ) එම ඒකක භාරයේ භාරකරු හෝ කළමනාකරණ සමාගම විසින් මෙම පනතේ විධිවිධාන කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද රීති නැතහොත් නියෝග කිසිවක් උල්ලංඝනය වන ආකාරයට ක්‍රියා කර ඇති බවට ; හෝ

(ආ) එම ඒකක භාරයේ භාරකරු හෝ කළමනාකරණ සමාගම යහපත් ආර්ථික ස්ථාවරයක් දැරීම නතර වී ඇති බවට ; හෝ

(ඇ) බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීමෙන් පසුව, කළමනාකරණ සමාගම, බලපත්‍රය ප්‍රදානය කරනු ලැබීම සඳහා නුසුදුසු වී ඇති බවට ; හෝ

(ඈ) එම ඒකක භාරයේ භාරකරු හෝ කළමනාකරණ සමාගම එහි කටයුතු කළමනාකරණය කිරීමේ දී, අයථා ක්‍රියා හෝ අක්‍රමිකතා හෝ සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට ; හෝ

(ඉ) ඒ බලපත්‍රලත් ඒකක භාරයේ භාරකරු විසින් ඒ බලපත්‍රලත් ඒකක භාරයේ කළමනාකරණ සමාගම අස්කර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එම බලපත්‍රය අවලංගු කතිරීම හෝ අත්හිටුවීම හෝ කරනු ලැබිය හැකිය.

(2) ඉහත සඳහන් උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඒකක භාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමට පෙර, ඒ බලපත්‍රය අවලංගු නොකල යුත්තේ මන්ද යන්න පිළිබඳව හේතු දැක්වීමට අවස්ථාවක් බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබිය යුතුය.

(3) ඒකක භාරයක් වෙනුවෙන් ප්‍රදානය කරන ලද බලපත්‍රය, අවලංගු කරනු ලැබූ අවස්ථාවක, තම බලපත්‍රය නොපමාවම කොමිෂන් සභාව වෙත භාරදීම බලපත්‍රලාභියාගේ යුතුකම විය යුතුය.

(4) ඒකක භාරයක භාරකරු හෝ කළමනාකරණ සමාගම විසින් (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) හෝ (ඇ) හෝ (ඈ) ඡේදවල විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට සහ එම උල්ලංඝනය කිරම් බලපතල ස්වභාවයේ උල්ලංඝනය කිරීම් නොවන බවට කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් (1) වන උප වගන්තිය යටතේ ක්‍රියා කිරීම වෙනුවට:–

(අ) එම උල්ලංඝනය කිරීමේ ප්‍රතිඵලයෙන් ඇති වූ තත්වය නිවැරදි කිරීම හෝ හරි ගැස්සීම සඳහා ; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන අනුව හෝ මේ පනත යටතේ සාදන ලද කිසියම් රීතියක් හෝ නියෝගයතක් අනුව ක්‍රියා කිරීම සඳහා නැතහොත් එම උල්ලංඝනය කිරීම තව සරටත් කරගෙන යාමෙන් වැළකී සිටීම සඳහා

සුදුසුයැයි කොමිෂන් සභාව සලකන යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස එම භාරකරුට හෝ කළමනාකරණ සමාගමට හෝ විධාන කරනු ලැබිය හැකිය.

(5) භාරකරුවකු හෝ කළමනාකරණ සමාගමක වෙත, කොමිෂන් සභාව විසින් (4) වන උපවගන්තිය යටතේ විධානයක් කරනු ලැබීම හේතුකොට ගෙන, එම භාරකරුට හෝ කළමනාකරණ සමාගමට එරෙහිව මේ පනත යටතේ වරදක් සඳහා නඩු පැරීමක් හෝ නඩුවක් පවත්වාගෙන යාමක් කෙරෙහි බලපෑමක් හෝ ඊට අගතියක් සිදු නොවන්නේය.

31ඉ. (1) කොමිෂන් සභාව විසින්,-

(අ) 31අ වගන්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට;

(ආ) 31ඇ. වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමට නැතහොත් අත්හිටුවීමට

ගන්නා ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි එම පදතික්ෂේප කිරීමට, අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට විරුද්ධව අභියාචනයක් එම තීරණය එම තැනැත්තා වෙත දන්වන් ලැබූ දිනයෙහි සිට මාස තුනක් ඇතුළත දී, අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(2) අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා විසින්, තමා සෑහීමට පත්වන පරිදි, කොමිෂන් සබාවේ තීරණයට හේතු ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව වෙත නියම කරනු ලැබිය හැකි අතර ඒ ලේකම්වරයා විසින් අභියාචනය ලැබී මාස තුනක් ඇතුළත ද ඔහුගේ තීරණය, අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තා වෙත දන්වනු ලැබිය යුතුය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් ඉල්ලුම් කරුවකු විසින් එම තීරණය තමා වෙත දන්වනු ලැබූ දිනයෙහි සිට දින දහ හතරක් ඇතුළත දී, එම තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(4) මේ වගන්තිය යටතේ වූ අභියාචනවලට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තුරු, අභියාචනාධිකරණය වෙත කරනු ලබන ප්‍රතිශෝධන ඉල්ලීම්වලට අදාළව ඒ ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබූ රීති, මේ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ කරනු ලබන සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, අදාළ විය යුතුය

(5) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත කරන ලද අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා කළ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිශෝධන කිරීම, වෙනස් කිරීම හෝ ඉවත ලෑම කරනු ලැබිය හැකි අතර, යුක්තිය ඉටුකිරීම පිණිස අවශ්‍යවන ආඥාවක් කරනු ලැබිය හැකිය.

31ඊ. (1) කොමිෂන් සභාවේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතිය නොමැතිව බලපත්‍රලත් ඒකක භාරයක භාර ඔප්පුව සංශෝධනය කරනු නොලැබිය යුතුය.

(2) බලපත්‍රලත් ඒකක භාරයක භාරකරු විසින් එම ඒකක භාරයේ භාර ඔප්පුව සංශෝධනය කිරීමට අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් එම යෝජිත සංශෝධන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යෝජිත සංශෝධන ලැබී දින විසි එකක් ඇතුළත දී, කොමිෂන් සභාව විසින්, භාර ඔප්පුවලට යෝජිත සංශෝධනවලට ඉඩදෙනු ලැබේද නැද්ද යන වග සඳහන් කරමින් ලියවිල්ලකින් වූ දැන්වීමක්, කළමනාකරණ සමාගම සහ භාරකරු වෙත දෙනු ලැබිය යුතුය.

එවැනි සංශෝධනවලට ඉඩ දෙනු නොලබන අවස්ථාවල, එසේ ඉඩ නොදීමට හේතු කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබිය යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ දැන්වීම ලැබුණු විට භාරකරු, වහා එම දැන්වීමට අනුව ක්‍රියා කළ යුතුය.

31උ. 31අ. වගන්තිය යටතේ බලපත්‍රලත් තැනැත්තකු බලපත්‍රයක් සඳහා වූ තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විස්තර කිසිවක් වෙනස් කිරීමට අදහස් කරන්නා වූ හෝ 31අ වගන්තිය යටඑතේ බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති තත්වයෙහි වෙනසකට පත්වන්නා වූ හෝ එසේ වෙනස් වීමට අදහස් කරන්නා වූ හෝ අවස්ථාවක එවැනි වෙනසක් කිරීමට පෙර, කොමිෂන් සභාව වෙත ඒ බව දන්වා එහි පූර්ව කැමැත්ත ලබා ගැනීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතුය.

31ඌ. කිසිම තැනැත්තකු විසින් ඔහුට 31අ වගන්තිය යටතේ ඒකක භාරයක් පවත්වාගෙන යෑමට අවසර ලැබී ඇත්නම් මිස "ඒකක භාරය" හෝ "බලපත්‍ර ලත් ඒකක භාරය" යන වචන භාවිත කරනු නොලැබිය යුතුය.

31එ. කිසිම තැනැත්තකු විසින් බලපත්‍රලත් ඒකක භාරයක ඒකකවල ආයෝජන කරන ලෙස මහජනතාවට ආරාධනය කරමින් (කොමිෂන් සභාව විසින් රීති මගින් අත්හරින ලද දැන්වීම් නොවන) සංස්ථා ප්‍රකාශයක් හෝ දැන්වීමක් අවස්ථාවෝචිත පරිදි එම සංස්ථා පත්‍රයෙහි අඩංගු කරුණු හෝ දැන්වීමෙහි සඳහන් පෙළ හෝ නිකුත් කිරීම සඳහා නැතහොත් පළ කිරීම සඳහා ලියවිල්ලකින් වූ පූර්ව අනුමැතිය කොමිෂන් සභාවෙන් ලබාගෙන ඇත්නම් මිස, නිකුත් කිරීම හෝ පළ කිරීම කරනු නොලැබිය යුතුය

31ඒ. (1) භාර ආඥාපනතෙහි හෝ වෙනත් යම් නීතියකහෝ කුමක් සඳහන් ව ඇත ද, බලපත්‍රලත් ඒකක භාරයක කළමනාකරණ සමාගම විසින් කරනු ලැබූ යම් ක්‍රියාවකින් උද්ගත වන භාරය සම්බන්ධයෙන් වූ කිසියම් කඩ කිරීමක්–

(අ) එම භාරකරුගේ එකඟත්වය ලබානොගෙන එම ක්‍රියාව කර ඇත්නම්;

(ආ) එම භාරකරුගේ එකඟත්වය ලබාගෙන එම ක්‍රියාව කර ඇත්නම් සහ එම එකඟත්වය අවස්ථාවෝචිත පරිදි, භාර දේපළවලට අදාළ වූ යම් කරුණක් සම්

බන්ධයෙන් එම කළමනාකරණ සමාගම විසින් එම භාරකරු වෙත සපයන ලද කිසියම් ලිඛිත ප්‍රකාශයක් හෝ කරුණු දැන්වීමක් කෙරෙහි විශ්වාසය තබමින් හෝ එම භාරකරුගෙන් ස්වාධීනව කළමනාකරණ සමාගම විසින් ලබා ගන්නා ලද කිසියම් වෘතීය උපදෙස් කෙරෙහි විශ්වාසය තබමින් සද්භාවයෙන් දී ඇත්නම්, ඒ සඳහා ඒ ඒකක භාරයෙහි භාරකරු වගකිවයුතු නොවන්නේ ය

(2) වංචාව හෝ නොසැලකිල්ල නිසා භාරයක් සම්බන්ධයෙන් සිදු වූ කඩ කිරීමක් සඳහා උද්ගතවන වගකීමෙන්, මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් කිසිවක් නිසා භාරකරු නිදහස් කරනු ලබන්නේ යැයි නොසැලකිය යුතු ය.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) "(8) වන උපවගන්තියේ, යන වචන සහ "දැනුවත්ව සම්බන්ධයක් ඇත්තාවූ" යන වචන වෙනුවට පිළිවෙළින් "(8) වන සහ (9) වන උපවගන්තිවල" සහ "සම්බන්ධයක් ඇත්තා වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ, "තොරතුරු ලෙස ඔහු දන්නා වූ" යන වදන වෙනුවට "තොරතුරු ලෙස ඔහු දන්නවා ඇතැයි සාධාරණව බලාපොරොත්තු විය හැකි වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) "දැනුවත්ව සම්බන්ධයක් ඇත්තා වූ" සහ දැනුවත්ව සම්බන්ධයක් තිබුණා වූ" යන වචන වෙනුවට පිළිවෙළින් "සම්බන්ධයක් ඇත්තා වූ" සහ "සම්පන්ධයක් තිබුණා වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "සඳහා හැර" අනාවරණය නොකළ යුතුයයි, යන වචන වෙනුවට "සඳහා හැර අනාවරණය නොකළ යුතුයයි යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "තොරතුරු යැයි ඔහු දරන්නා වූ" යන වචන වෙනුවට "තොරතුරු යැයි ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි වූ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "කෙලින්ම හෝ අන්‍යාකාරයකින් දැනුවත්ව ම ලබාගන්නා ලද තොරතුරක් ඇත්තා වූ හෝ යන වචන වෙනුවට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ලබා ගන්නා ලද හෝ ලබාගෙන ඇතැයි විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇති තොරතුරක් ඇත්තා වූ, යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ "තොරතුරක් බව ඔහු දන්නේ නම්, යන වචන වෙනුවට "තොරතුරක් බව ඔහු දන්නවා ඇතැයි යුක්තිසහගතව බලාපොරොත්තු විය හැකි නම්, යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනු ඡේදයේ "තොරතුරක් බව ඔහු දන්නේ නම්" යන වචන වෙනුවට "තොරතුරක් බව ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම්" යන වචන ආදේශ කිරීමෙන්, සහ "සම්බන්ධ බව ඔහු දන්නේ නම්" යන වචන වෙනුවට "සම්බන්ධ බව ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "තොරතුරක් යැයි ඒ පුද්ගලයා දන්නේ නම්, යන වචන වෙනුවට "තොරතුරක් යැයි ඒ පුද්ගලයා දන්නේ නම්" යන වචන වෙනුවට "තොරතුරක් යැයි ඒ පුද්ගලයා දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

" (5) (8) වන සහ (9) වන උපවගන්තිවල විධිවිධාන වලට යටත්ව යම් පුද්ගලයකු විසින් (4) වන උපවගතතියේ විධිවිධාන අදාළ වන්නා වූ පුද්ගලයකුගෙන්, (4) වන උපවගන්තියේ සඳහන් අර්පණය ගැන කල්පනා කරනු ලබන බවට හෝ තවදුරටත් ඒ බව කල්පනා නොකරන බවට තොරතුරක් ලබාගෙන ඇති හෝ ලබාගෙන ඇතැයි විශ්වාස කිරීමට යුක්තිසහගත හේතු ඇති අවස්ථාවක, ඒ තොරතුරු ඒ සමාගමේ ලැයිස්තු ගත සුරැකුම්පත්වලට අදාළ පළ නොකළ මිල පිළිබඳ සංවේදී තොරතුරක්

බව ඔහු දන්නවා ඇතැයි යුක්ති සහගතව බලාපොරොත්තු වය හැකි නම පළමු සඳහන් පුද්ගලයා විසින් ම ඒ සමාගමේ ලැයිස්තුගත සුරැකුම්පත් වෙළඳාම් කිරීම නොකළ යුතුය."

(6) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (1) වන අනු ඡේදයේ "තොරතුරු ලබාගත්තා ලද්දේ නම් ; සහ" යන වචන වෙනුවට

"තොරතුරු ලබාගත්තා ලද්දේ නම්; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(7) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ "ගනුදෙනුවසම්පූර්ණ කිරීම" යන වචන වෙනුවට "ගනුදෙනුව සම් පූර්ණ කිරීම" ආදේශ කිරීමෙන්.

**25**. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදයේ "සංවේදී තොරතුරක් බව එය දරන පුද්ගලයා දන්නා වූ යම් තොරතුරක්" යන වචන වෙනුවට "සංවේදී තොරතුරක්" යන වචන ආදේශ කිරීමෙන් :-

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ඇ) (2) වන වගන්තියේ සඳහන් පරිදි ඔහු දැන සිටි හෝ ඔහු විසින් ලබාගත්තා ලද තොරතුර වෙනත් යම් තැනැත්තකුට දැන්ම් දීම, ඒ තොරතුර ඒ තැනැත්තා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඒ අදාළ සුරැකුම්පත් වෙළඳාම් කිරීමට වෙනත් යම් තැනැත්තකුට උපදෙස් දීමේ හෝ සැලැස්වීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන බව දන්නේ නම් හෝ ඒ බව විශ්වාස කිරීමට යුක්තිසහගත හේතු ඇත්නම් හෝ, නොකළ යුතුය."

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ආ" 14 වන වගන්තියේඛ (අ) ඡේදය යටතේ සියලු පරීක්ෂණ පැවැත්වීමෙහි ලා දරන ලද ගාස්තු වශයෙන් නියම කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් හෝ 15 වන වගන්තිය, 20 වන වගන්තිය සහ 31අ වගන්තිය යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබූ සියලු මුදල් ප්‍රමාණයන්;"

**27**. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි (2) වන උප වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (2) වන්දි අරමුදල-

(අ) අරමුදලේ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණවලින් ;

(ආ) 51අ වගන්තිය යටතේ අරමුදලට බැරකරනු ලබන මුදල් ප්‍රමාණවලින් සමන්විත

විය යුතුය."

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "සියලු කාර්ය සඳහා" යන වචන වෙනුවට "මේ පනතේ කාර්ය සඳහා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "අමාත්‍යවරයා විසින් සභාවේ අදහස් විමසා" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන්;".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "අධ්‍යක්ෂ ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර" යන වචන වෙනුවට, අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ නිර්දේශය මත ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර" යන වචන ආදේශ කිරීමෙන්

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි (1), (2) සහ (3) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට, මෙහි පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) (අ) යම් බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ, ඒ විනිමය ස්ථානයේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුගේ නැතහොත් ව්‍යාපාර වස්තු වෙළෙන්දකුගේ හෝ යම් ලැයිස්තුගත සමාගමක හෝ බලපත්‍රලත් යම් ඒකක භාරයක කළමනාකාර සමාගමක, වෘත්තීය පැවැත්ම පිළිබඳව හෝ කටයුතු පිළිබඳව, ලැයිස්තුගත පොදු සමාගමක කොටස් හිමියන් හෝ බලපත්‍රලත් ඒකක භාරයක ඒකක හිමියන් විසින් කරනු ලබන පැමිණිලි ;

(ආ) යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින්, ඒ ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දා සමාජිකයකු වන බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක වෘත්තීය පැවැත්ම හෝ කටයුතු පිළිබඳව, කරන පැමිණිලි

විභාග කර තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ සමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත කමිටුවක් පිහිටුවනු ලැබිය හැකිය.

(2) යම් කොටස් හිමියකු හෝ ඒකක හිමියකු හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් ලැබුණු විට, ඒ පැමිණිල්ල සනාථ කිරීම සඳහා යම් ලියවිලි හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම්, ඒවා පරීක්ෂාකර බලා, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ලැයිස්තුගත සමාගමක හෝ ඒ බලපත්‍ර ලත් ඒකක භාරයේ කළමනාකාර සමාගමක හෝ විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ උල්ලංඝනය කර තිබේද යන වග හෝ ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ ඒ කමිටුව විසින් තීරණය කළහැකිය. කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට හෝ තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ලැයිස්තුගත සමාගමට හෝ කළමනාකාර සමාගමට හෝ නොදී, එවැනි

තීරණයක්නොකළ යුතුය.

(3) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකු හෝ ලැයිස්තුගත සමාගමක් හෝ යම් බලපත්‍රලත් ඒකකභාරයක කළමනාකාර සමාගමක හෝ විසින් මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ උල්ලංඝනය කර ඇති බව හෝ ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තුවිනිමය ස්ථානයේ රීතියක් උල්ලංඝනය කර ඇති බව කමිටුව විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයට හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දාට හෝ ලැයිස්තුගත සමාගමට හෝ කළමනාකාර සමාගමට හෝ විරුද්ධව ගතයුතු ක්‍රියා මාර්ගයේ ස්වභාවය කමිටුව විසින් කොමිෂන් සභාවට නිර්දේශ කළ යුතුය. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හෝ වැඩිදුර විමර්ෂණය සඳහා එම කාරණය තියි බලධරයා වෙත යොමු කිරීම හෝ අරහයා ස්වකීය අභිමතය පරිදි ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේය."

**31**. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන කරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයෙහි, "පනත යටතේ සාදන යම් නියෝගයක" යන වචන වෙනුවට "පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදයෙහි "අසත්‍ය හෝ සාවද්‍ය යම් තොරතුරක්" යන වචන වෙනුවට "අසත්‍ය හෝ සාවද්‍ය හෝ මූලාකරන සුළු යම් තොරතුරක්" යන වචනද "අසත්‍ය හෝ සාවද්‍ය කරුණු" යන වචන වෙනුවට "අසත්‍ය හෝ සාවද්‍ය හෝ, මූලාකරන සුළු කරුණු" යන වචනද ආදේශ කිරීමෙන්;

(ඇ) (ඇ) ඡෙදයෙහි "සභාවේ නිලධරයකුට හෝ සෙවකයකුට මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටුකිරීමේදී" යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ නිලධරයකුට හෝ සේවකයකුට හෝ, 23අ වගන්තියේ (2) වන වගන්තිය යටතේ කොමිෂන් සභාව යම් තැනැත්තකු සමග ගිවිසුමකට ඇතුළත් වී ඇද්ද ඒ යම් තැනැත්තකුට හෝ මේ පනත යටතේ ඔහුගේ කාර්ය ඉටුකිරීමේදී" යන වචන ආදේශ කිරීමෙන්

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට" යන වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට" යන වචන ආදේශ කිරීමෙන්.

**32**. මෙහි පහත දැක්වෙන අලුත් වගතිතිය ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිවම

"තිවම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය:-

51අ මේ පනත යටතේ වූ වරදක් සිදුකර ඇත්තේ කිනම් අවස්ථාගත තත්ත්වයකදී ද යන කාරණය සැලකිල්ලට ගෙන, කොමිෂන් සභාව විසින්, ඒ වරද සම්බන්ධයෙන්

නියම කළ හැකි උපරිම දඩයෙන් තුනෙන් එකක් නොයික්ම වන මුදල් ප්‍රමාණයකට සීමාකොට ඒ වරද සමථයට පත් කළ හැකි අතර, මේ වගන්තිය යටතේ වැරදි සමතයට පත්පත් කිරීමෙහිදී කොමිෂන් සභාවට ලැබෙන සියලුදු මුදල් ප්‍රමාණයන්, 38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි අරමුදලට බැර කරනු ලැබිය යුතුය.˝

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන්;

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයෙහි ˝ වෙළෙන්දන් විසින් කොටස් ගනු දෙනු සම්බන්ධයෙන්˝ යන වචන වෙනුවට ˝බල පත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් සහ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් කොටස් ගනු දෙනු සම්බන්දයෙන් හා බලපත්‍රලත් ඒකක භාරයක ඒකකවලට අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් යන වචන ආදේශ කිරීමෙන්.

(ආ) (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

˝ (ඇ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු නැතහොත් වෙළෙන්දකු විසින් හෝ බලපත්‍රලත් ඒකක භාරයක කළමනාකාර සමාගම විසින් හෝ පොත් වාර්ථා ගිණුම් හා විගණන තිසි ලෙස පවත්වාගෙන යාම සහ එම බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරු විසින් නැතහොත් වෙළෙන්දා විසින් හෝ කළමනාකාර සමාගම විසින් හෝ ස්වකීය කටයුතු පිළිබඳව කොමිෂන් සභාව වෙත නිතිපතා වාර්තා කිරීම;˝.

(ඇ) (ඇ) ඡේදයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :-

(ඈ) බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හා ව්‍යාපාර වස්තු වෙළෙන්දකු සහ බලපත්‍රලත් ඒකක භාරයක කළමනාකාර සමාගම විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් වාර්ථා සහ ගිණුම් පිළිබඳ වාර්ෂික විගණනය හා මුදල් ප්‍රකාශය පිළියෙල කිරීම;

(ඉ) අත්කර ගැනීම් හෝ ඒකාබද්ධ වීම් ලැයිස්තුගත සමාගම් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් අතර සිදුවන නැතහොත් එවැනි අත්කර ගැනිමක හෝ ඒකාබද්ධ වීමක යටත් පිරිසෙයින් එක් පාර්ශ්වයක් ලැයිස්තුගත සමාගමක් වන අවස්ථාවක, එම අත්කර ගැනීම් හෝ ඒකාබද්ධවීම් විධිමත් කිරීම.

(ඊ) බලපත්‍රලත් ඒකක භාරයක භාරකරු සහ කළමනාකාර සමාගම විසින් පිළිපැදිය යුතු චර්යා ධර්ම සංග්‍රහයක්;

(උ) රීති සෑදීමට මේ පනතින් නියමිත කාරණා.˝;

(3) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ එහි නිශ්චිතව

සඳහන් වන වෙනත් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය."

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ආයෝජක" යන්නෙහි අර්ථනථනයට පෙරාතුව ම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"සම්බන්ධිත තැනැත්තා" යන්න ඒකක භාරයක භාර කරු හෝ කළමනාකාර සමාගම සම්බන්ධයෙන් යෙදෙන විට, එයින්-

(අ) භාර සමාගමේ හෝ කළමනාකාර සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් අයත්ව සිටින හෝ, භාර සමාගමේ හෝ කළමනාකාර සමාගමේ සම්පූර්ණ ඡන්ද සංඛ්‍යාවෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් හෝ ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ඇති තැනැත්තෙක් ;

(ආ) භාර සමාගම සහ කළමනාකාර සමාගම විසින් එක්ව කෙලින්ම හෝ අන්‍යාකාරයකින් යම් සමාගමක සාමාන්‍ය ප්‍රාග්ධනයෙන් යම් නියමිත ප්‍රතිශතයක හෝ ඊට වැඩි ප්‍රමාණයක අයිතිය දරන්නේ ද නැතහොත් භාර සමාගම යම් සමාගමක මුළු ඡන්ද සංඛ්‍යාවෙන් යම් නියමිත ප්‍රතිශතයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක කෙලින්ම හෝ අන්‍යාකාරයකින් දරන්නේ ද එවැනි යම් සමාගමක්

(ඇ) භාර සමාගමෙහි, කළමනාකාර සමාගමෙහි හෝ (ආ) ඡේදයේ සඳහන් සමාගමක අධ්‍යක්ෂවරයෙක් හෝ නිලධරයෙක් අදහස් වේ.;

(2) "ලැයිස්තුගත සුරැකුම්පත්" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"කළමනාකාර සමාගම" යන්න බලපත්‍රලත් ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, එයින් සමාගම සංස්ථාගත කිරීම සඳහා තත්කාලයෙහි බලපවත්නා නීතිය යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වන්නා වූ හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ පිහිටුවන ලද යම් සංස්ථාවක් වන්නා වූ ද ඒ ඒකක භාරයේ භාරකරු විසින් දරනු ලබන දේපළ ඒ ඒකක භාරයේ ඒකක හිමියන්ගේ අර්ථ ලාභය සඳහා කළමනාකරණය කරන්නා වූ ද සමාගමක් අදහස් වේ. "

(3) "සුරැකුම්පත්" යන්නෙහි අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:-

"සුරැකුම්පත්" යන්නෙන්, යම් ආණ්ඩුවක් විසින් හෝ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් මණ්ඩලයක් විසින් හෝ නිකුත් කරන ලද නැතහොත් නිකුත් කිරීමට යෝජිත යම් අයිතිවාසි කමක්, විකල්පයක් හෝ (ඒකක වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ විස්තර කරන ලද්දේ වුවද) එහි හෝ ඒ පිළිබඳ සම්බන්ධතාවක් ද ඇතුළුව, ඩිබෙන්චරයක්, ව්‍යාපාර වස්තුවක්, කොටසක්, අරමුදල් හෝ නෝට්ටුවක් හෝ සුරැකුම්පත් යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන වෙනත් යම් සාධන පත්‍රයක් අදහස් වන අතර, විනිමය බිල් පත්‍රයක් හෝ බැංකුවක් විසින් නිකුත් කරන ලද පොරොන්දු නෝට්ටුවක් හෝ තැන්පතු සහතිකයක් ඊට ඇතුළත් නොවේ.

(4) ඒ වගන්තිය අගට මෙහි පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන්:-

"භාරකරු" යන්න බලපත්‍රලත් ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඒකක

භාරය පිහිටුවනු ලැබූ සාධන පත්‍රයෙහි භාරකරු වශයෙන් පත්කර ඇති තැනැත්තා අදහස් වේ.

"ඒකක හිමියා" යන්න ඒකක භාරයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඒකක භාරය යටතේ ඒකක භාරයක හිමියකු ලෙස එම භාරය විසින් තත් කාළයෙහි ලියාපදිංචි කර සිටින තැනැත්තා අදහස් වේ.

"ඒකක භාරය" යන්නෙන් යම් භාරයක ලාභ හෝ ආදායම් සහ ඒ භාරයේ භාරකරුවන් වෙත සතු වී තිබෙන සුරැකුම් පත් හෝ වෙනත් යම් දේපළ අත්කර ගැනීමෙන්, දැරීමෙන්, කළමනාකරණයෙන් හෝ බැහැර කිරීමෙන් උපදින ප්‍රාග්ධන ලාභවලට, භාරය යටතේ අර්ථලාභීන් වශයෙන් තැනැත්තන්ට සහභාගකරුවන් වීම සඳහා විධිවිධාන සැළැස්වීමේ කාර්යය සඳහා සකස් කරන ලද නැතහොත් ඒ ප්‍රතිඵලය ඇති වන වැඩ පිළිවෙලක් අදහස් වේ.

**35**. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය, එහි 1 වන කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ කොටසෙහි (උ) විෂයය වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් :-

" (උ) ඉල්ලුම්කාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතු බව සහ ඔවුනක් අතුරෙන් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් පුද්ගලිකවම ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් වන තැනැත්තන් අතුරෙන් සාමාජිකයන්ගේ මහා මණ්ඩලය විසින් තෝරා පත්කර ගනු ලැබිය යුතු අතර හතර දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු බව;";

(2) එම කොටසේ (එ) විෂයයෙහි "මුදල් තත්ත්වය සතුටුදායක බව" යන වචන වෙනුවට මුදල් තත්ත්වය සතුටුදායක බව යන වචන ආදේශ කිරීමෙන්

(3) එම කොටස් (එ) (ii) විෂයයෙහි "අවංකභාවයකින් යුක්ත නොවන අය" යන වචන වෙනුවට අවංකභාවයකින් යුක්ත නොවන අය" යන වචන ආදේශ කිරීමෙන්

(4) එම කොටසේ (ඒ) (viii) විෂයයෙහි "තතුදත් ආයෝජන" යන වචන වෙනුවට "තතුදත් ආයෝජන"යන වචන ආදේශ කිරීමෙන් ;

(5) එම කොටසේ (ඒ) (ix) විෂයයෙහි "වරප්‍රසාදවත් තොරතුරු ඇතැම් පුද්ගලයන්ගේ විනය" යන වචන වෙනුවට "වරප්‍රසාද ලත් තොරතුරු ඇතැම් පුද්ගලයන් විසින්" යන වචන ආදේශ කිරීමෙන්

(6) එම කොටසේ (ඒ) (xi) විෂයයෙහි "ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගේ මුදල් ගනුදෙනු" යන වචන වෙනුවට "ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ගේ හා ව්‍යාපාර වස්තු වෙළෙන්දන්ගේ මුදල් ගනුදෙනු" යන වචන ආදේශ කිරීමෙන්.

(7) එම කොටසේ (ඒ) (xiii) සහ (xiv) යන විෂයයන් වෙනුවට මෙහි පහත දැක්වෙන විෂයයන් ආදේශ කිරීමෙන්-

" (xiii) ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් විසින් සුරැකුම්පත් වෙළඳාම් කිරීම සහ එම ගනුදෙනු සම්බන්ධ තොරතුරු ලබාගත යුතු ආකාරය සම්බන්ධයෙන්,

(xiv) සුරැකුම්පත් තැරැව්කරුවන්ගේ හෝ වෙළෙන්දන්ගේ අනෙකුත් ව්‍යාපාරවලින්, ගනුදෙනුකරුවන්ගේ අරමුදල් සහ සුරැකුම්පත් වෙන්ව තබාගන්නා බවට වගබලා ගැනීම සඳහා"

(8) එම කොටසේ (ඒ) (xiv) විෂයයට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් විෂයය එකතු කිරීමෙන්-

"(xv) කමිටුවේ සාමාජිකයන්ගෙන් බහුතරය කවර හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකු හෝ ව්‍යාපාර වස්තු වෙලෙන්දකු සමග සම්බන්ධයක් නොමැති තැනැත්තන්ගෙන් සමන්විත වන විනය කමිටුවක් පත් කිරීම සඳහා"

(9) එම කොටසේ (ඒ) විෂයයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් විෂයය එකතු කිරීමෙන්-

"(ඔ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයකින් පමණක් ව්‍යාපාර වස්තු විනිමය පාලන නිලධරයන් ඉවත් කළ යුතු බවට ඉල්ලුම්කාර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි විධිවිධාන සැලසෙන බව".

(10) ඒ උපලේඛනයේ අගට, එහි IV වන කොටස වශයෙන් බලපැවැත්විය යුතු, මෙහි පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

## "IV වන කොටස

ඒකක භාරයක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා පිළිපැදිය යුතු නියමයන් හා කොන්දේසි මෙසේය:-

(අ) ඉල්ලීම කරනු ලබන්නේ යම් ඒකක භාරයක් සම්බන්ධයෙන්ද ඒ ඒකක බාරයේ භාරකරු සහ කළමනාකාර සමාගම වෙන වෙනම පුද්ගලයන් විය යුතුය.

(ආ) භාරකරු කළමනාකාර සමාගමේ සම්බන්ධිත තැන්පත්තකු නොවිය යුතුය

(ඇ) එම භාරය ඇති කරනු ලබන්නේ යම් භාර ඔප්පුවකින් ද ඒ භාර ඔප්පුවෙන් හෝ භාරකරු සහ කළමනාකාර සමාගම අතර ගිවිසුමෙන්:

(i) භාර දේපළ ආයෝජනය පිළිබඳ සීමාකිරීම් දැක්විය යුතුය.

(ii) එම භාර ඔප්පුවෙහි දැක්වෙන යම් අවස්ථාගත තත්ත්වයක් වේ නම්, ඒ තත්ත්වය යටතේ හැර ඒකක හිමියන් විසින් වැඩිපුර ගෙවීමක් නොකස යුතු බවට හෝ වැඩිපුර වගකීමක් භාර නොගත යුතු බවට විධිවිධාන සැළසිය යුතුය.

(iii) ඒකකවල අර්පණ මිල සහ බේරුම් මිල ආගණනය කරන ක්‍රමය දැක්විය යුතුය

(iv) ඒකක බේරුම් කිරීම අත්හිටුවන අවස්ථාගත තත්ත්වයක් කවරේදැයි දැක්විය යුතුය;

(v) ඒකක හිමියන්ගේ ලේඛනයන් පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්විය යුතුය

(vi) භාරයේ යම් රැස්වීමක දී තමාගේ වැදගත් සම්බන්ධතාවක් තිබෙන ව්‍යාපාරික කටයුත්තක් සාකච්ඡා කරන විටක දී, " තමන්ගේ සම්බන්ධතාව හෙළිදරව් කිරීමට භාරකරුවන්ට" කළමනාකාර සමාගමට සහ ඒවායේ සම්බන්ධිත තැනැත්තන්ට නියම කෙරෙන විධිවිධාන අන්තර්ගත විය යුතුය.

(vii) ඒකක භාරයේ විගණකවරුන් වශයෙන් කොමිෂන් සභාවේ රීතිවල නිශ්චය කොට දැක්වෙන සුදුසුකම් ඇති තැනැත්තන් පත්කිරීම සඳහා විධිවිධාන සැලසීම සහ ඒ විගණකවරුන් ඒ සුදුස්කම් දැරීම නතරවූ විට ඔවුන් ඉවත් කරන ලෙස නියම කිරීමට කොමිෂන් සභාවට බලය දීම කරනු ලැබිය යුතුය.

(viii) කළමනාකාර සමාගම (ස්වේච්ඡාවෙන් ඈවර කිරීම හැර) ඈවර කරනු ලැබීමේ දී හෝ කළමනාකාර සමාගමේ යම් වත්කම් සම්පබන්ධයෙන් ප්‍රතිග්‍රාහකයකු පත් කරනු ලැබූ විට හෝ ඒකක හිමියන්ගේ යහපත පිණිස කළමනාකාර සමාගම වෙනස් කිරීම යෝග්‍ය බවට භාරකරු සෑහීමට පත්වීමේ දී හෝ නිකුත් කරන ලද ඒකකවලින් යටත් පිරිසෙයින් සියයට හැත්තෑපහක් දරන තැනැත්තන් විසින් කළඳනාකාර සමාගම පහ කිරීමට භාකරුවන්ට බලය දී තිබිය යුතුය.

(ix) කළමනාකාර සමාගම පහ කළ වහාම බාරකරු විසින් අනුප්‍රාප්තිකයකු පත් කරනු ලැබීම සඳහා විධිවිධාන සැලැස්විය යුතුය.

(xi) භාරය වෙනුවෙන්, භාරකරුගේ සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව හැර, කළමනාකාර සමාගම විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුමකට හෝ උප ආරක්ෂණ ගිවිසුමකට හෝ ඇතුළත් වීම තහනම් කරනු ලැබිය යුතුය.

(xii) භාරකරුගේ එකහත්වය ඇතිව හැර, භාර දේපළ වලින් ණය දීම හෝ ප්‍රදානය කිරීම තහනම් කරනු ලැබිය යුතුය.

(xiii) කළමනාකාර සමාගම හෝ කළමනාකාර සමාගමේ යම් සම්බන්ධන තැනැත්තකු සහ භාරය අතර යම් ගනුදෙනුවක් සඳහා භාරකරුගේ ලිඛිතඅනුමතය ලබාගත යුතු බවට විධිවිධාන සැලැස්විය යුතය.

(xiv) කළමනාකාර සමාගම වෙත නීතියෙන් පැනවී තිබෙන යම් වගකීමකින් සමාගම නිදහස් කිරීමක් හෝ ඒකක හිමියන්ගේ අවාසියට එවැනි වගකීමකින් සමාගම ආරක්ෂාකිරීමක් නොකළ යුතුය;

(xv) අලුතෙන් ඇතිකරන ලද ඒකක වෙනුවෙන් ගෙවන ප්‍රතිෂ්ඨාව භාරකරු වෙත ලැබුණු වහාම ඒ ප්‍රතිෂ්ඨාව (රඳවාගැනීමට කළමනාකාර සමාගමට හිමිකම තිබෙන යම් අයකිරීම් අඩුකොට) භාරයට යටත් වන බවට විධිවිධාන සැලැස්විය යුතුය.;

(xvi) ඒකක හා සම්බන්ධයෙන් වූ සහතිකයක් තුන්වන පාර්ශවයකට භාර දිය යුත්තේ, ඒ ඒකක සඳහා ගෙවන ලද ප්‍රතිශ්ඨාව (කළමනාකාර සමාගම විසින් රඳවා තබාගත හැකි අය කිරීම් අඩු කොට) භාරකරු වෙත සතුවී ඇති බවට හෝ සතුවන බවට භාරකරු සෑහීමට පත් වූ විටදී පමණක් බවට විධාන සැලැස්විය යුතුය;

(xvii) යම් භාර දේපළක්, භාරය විසින් ලබාගන්නා ලද ණය මුදලක් වෙනුවෙන් ඇප වශයෙන් ණය දෙන්නාගේ නමින් ලියාපදිංචිකර තිබෙන අවස්ථාවක, ඒ දේපළ සම්බන්ධයෙන් ණය දෙන්නාගේ හෝ ඔහුගේ අනුයෝජිතයාගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ගැන භාරකරු වගකිව යුතු බවට විධිවිධාන සැලැස්විය යුතුය.;

(xviii) කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව හැර අලුතින් භාරකරුවකු පත් කිරීම තහනම් කළ යුතුය.;

(xix) ඒකකවල ආයෝජනය කිරීමට අවසර ඇති අවම ආරම්භක ආයෝජනය නිශ්චය කොට දැක්විය යුතුය;

(xx) ඒකක මිලදී ගැනීම් වලින් අය කළ හැකි උපරිම ආරම්භක අයකිරීම නිශ්චය කොට දැක්විය යුතුය;

(xxi) භාරකරුගේ විෂමාචාරය හෝ නොසැලකිලිමත්කම හේතු කොටගෙන සිදුවන අලාභ වෙනුවෙන් ඇප වශයෙන්, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබූ විට, භාරකරු විසින් ඇප තැන්පත් කළයුතු බවට විධිවිධාන සැලැස්විය යුතුය.

**36.** සැක දුරු කිරීම පිණිස මෙසේ ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේදී සුරැකුම්පත් ධුර දැරූ සාමාජිකයන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජික-යන් වන්නාක් සේ සැලකිය යුතු අතර, ඒ සුරැකුම්පත් සභාවේ ඒ දිනයෙහි ධුර දැරූ පත් කළ සමාජිකයන් අතුරෙන්-

(i) 4 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, අමාත්‍යවරයා විසින් තෝරාගන්නා ලද සමාජිකයන් දෙදෙනෙකු ඔවුන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබූ දින සිට, අවුරුදු හතරක කාලසීමාවක් ධුර දැරිය යුතුය; තවද

(ii) 4 වන වගන්තියේ කවර විධිවිධානයක් තිබුණද අමාත්‍යවරයා විසින් තෝරාගන්නා ලද සාමාජිකයන් දෙදෙනෙකු, ඔවුන් සභාවේ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලසීමාවක් ධුර දැරිය යුතුය;

(ආ) සුරැකුම්පත් සභාව විසින් යම් ව්‍යාපාර වස්තු තැරැව්කරුවකුට හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දකුට නිකුත් කරන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම බලාත්මකව පැවති සෑම බලපත්‍රයක්ම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් වූවාක් සේ සැලකිය යුතුය.

(ඇ) සුරැකුම් සභාව විසින් සාදන ලදුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේ බලාත්මකව පැවති සියලු නීති රීති හා නියෝග ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාදන ලද රීති හා නියෝග වූවාක් සේ සැලකිය යුතුය;

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේ පැවති සුරැකුම්පත් සභාවේ සියලුම ගිවිසුම්, එකඟවීම සහ වෙනත් සාධන පත්‍ර, ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඇතුළත් වී තිබෙන ගිවිසුම් එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර වූවාක් සේ සැලකිය යුතුය;

(ඉ) සුරැකුම්පත් සභාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලදුව, මේ පනත ක්‍රියාත්මක විමට පෙරාතුවම දිනය වනවිට අවසන් නොවී පැවති සියලු සිවිල් නඩු, නඩුකර සහ වෙනත් නඩු කටයුතු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය

කොමිෂන් සභාව විසින් හෝ එයට විරුද්ධව හෝ පවරන ලද සිවිල් නඩු, නඩුකර සහ වෙනත් නඩු කටයුතු වූවාක් සේ සැලකිය යුතුය.

**37.** ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයකට නිකුත් කරනු ලදුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව වූ දිනයේ බලාත්මකව පැවතිබලපත්‍රයක වලංගු කාලය ප්‍රධාන ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට දවස් අනූවක කාල සීමාවක් ඉකුත්වීමේ දී, අවසන් වූවාක් සේ සැලකිය යුතුය.

**38.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**1991 අංක 27 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1991 ජූලි මස 05 වන දින]

**1982 අංක 43 දරන මුද්දර ගාස්තු සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1991 අංක 27 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1988 අංක 71 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (ඈ) ඡේදයේ "සෑම සාධන පත්‍රයක්ම" යන වචන වෙනුවට "සෑම සාධන පත්‍රයක්ම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයට ඉත්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :–

" (ඉ) මුදල් ආපසු ගැනීම හෝ මාරු කිරීම සඳහා යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ තිබෙන යම් බැංකුවක් සමග ඇතුළත් වන යම් ගනුදෙනුවකට අදාළ සෑම ලේඛනයක්ම.".

**3.** 1988 අංක 71 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (8) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය අතුළත් කිරීමෙන් :–

" (8අ) යම් බැංකුවක යම් තැනැත්තකුගේ නමින් ඇති ගිණුමකින් ඒ බැංකුවේ එම තැනැත්තාගේම නමින් වූ වෙනත් ගිණුමකට මුදල් මාරු කිරීම සඳහා ඒ බැංකුව සමග ඇතුළත් වූ ගණුදෙනුවකට අදාළ ලේඛනයක්;"

(2) ඒ වගන්තියේ (9) වන ඡේදයේ ඇති" ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව සඳහා හෝ වෙනුවෙන්" යන වචන වෙනුවට "කිසිඳු ප්‍රතිෂ්ඨාවක් නොලබා ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව සඳහා හෝ වෙනුවෙන් " යන වචන ආදේශ කිරීමෙන්;

(3)ඒ වගන්තියේ (20) වන ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුලත් කිරීමෙන්:–

"(20අ) යම් තිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද කොටස් සහතිකය;

(20ආ) යම් තිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද සාධන පත්‍රය;"

**4.** 1988 අංක 71 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.:-

"(1) කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රක්ෂණ ඔප්පු නිකුත් කරන යම් තැනැත්තකුට;

(ආ) මුදල් නිකුත් කිරීමක් වශයෙන් හෝ වැඩිකරනු ලැබූ නිකුත් කිරීමක් වශයෙන් හෝ ඍණ ස්කන්ධ ඇති කිරීමක් වශයෙන් හෝ කොටස් නිකුත් කරන යම් සමාගමකට;

(ඇ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කරන යම් බැංකුවකට;

(ඈ) යම් සේවා යෝජකයකු විසින් සේවා නියුක්තයන්ට කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් සේවා නියුක්තයන් විසින් මුද්දර ගසන ලද කුවිතාන්සි දිය යුතු වන විටක, ඒ සේවා යෝජකයාට;

(ඉ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ, දිසා අධිකරණයක හෝ නීති මගින් ඇති කරන ලද හෝ පිහිටුවන ලද වෙනත් යම් අධිකරණයක තිලධරයකුට;

(ඊ) යම් හිමිකම් පෑමක්, ඉල්ලීමක් හෝ අයදුමක් ඉදිරිපත් කිරීමේදී ගෙවීම් කරනු ලබන යම් ණය පත් සමාගමකට;

(උ) සංචාරක චෙක්පත් මුදල් කරන යම් ආයතනයකට;

(ඌ) යම් වර්ගයක සාධන පත්‍රවලට මේ පනතින් නියම කරන ලද වේලාවේදී හෝ ආකාරයෙන් මුද්දර ගැසීම කළ නොහැකි විට හෝ යෝග්‍ය නොවීම සැලකිල්ලට ගෙන, ඒ වර්ගයේ සාධන පත්‍ර නිකුත් කරන වෙනත් යම් තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි, ඒතැනැත්තා විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු වෙනුවෙන් හෝ ඒ සමාගම විසින් නිකු-ත් කරනු ලබන කොටස් හෝ ඍණ ස්කන්ධ වෙනුවෙන් හෝ බැංකුව විසින් සපයන ලද චෙක් ආකෘති මත හෝ මුදල් ආපසු ගැනීම හෝ මාරුකිරීම සඳහා යම් තැනැත්තකු විසින් ඒ බැංකුව සමග ඇතුලත් වන යම් ගනුදෙනුවකට අදාළ ලේඛන මත හෝ ඒ සේවා නියුක්තයන් විසින් ඒ සේවා යෝජකට දෙනු ලබන කුවිතාන්සි මත හෝ එවැනි අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අද්මිරාල්තී නඩු කටයුතු වලදී ඉදිරිපත් කරනු ලබන හෝ ගොනු කරනු ලබන ලේඛන වෙනුවෙන් හෝ ඒ ණය පත් සමාගම වෙත ඉදිරිපත් කරන ලද යම් හිමිකම් පෑමක් ඉල්ලීමක් හෝ අයදුමක් වෙනුවෙන් හෝ ඒ ආයතනය විසින් මුදල් කරන ලද සංචාරක චෙක්පත් වෙනුවෙන් හෝ වෙනත් තැනැත්තා විසින් නිකුත් කරනු ලබන සාධක පත්‍ර වෙනුවෙන් හෝ ගෙවිය යුතු මුද්දර ගාස්තුව පහත දැක්වෙන සියලුම කොන්දේසි හෝ ඉන් යම් කොන්දේසියක් මත හෝ එකතුකර ගෙවීමට බලය දෙනු ලැබිය හැකියඃ-

(1) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා සමාගම, බැංකුව, සේවායෝජකයා, තිලධරයා, ණය පත් සමාගම, ආයතනය හෝ වෙනත් තැනැත්තා කොමසාරිස් ජනරාල්වරයා සමග නියමිත ආකෘතියේ සාරානුකූලවබැඳුම්කරයකට ඇතුළත්වීම;

(ii) අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු පිළිබඳ හෝ ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ ණය ස්කන්ධ පිළිබඳ හෝ ඒ බැංකුව විසින් සපයනු ලබන චෙක් ආකෘති පිළිබඳ හෝ මුදල් ආපසු ගැනීම හෝ මාරු කිරීම සඳහා යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ තිබෙන යම් බැංකුවක් සමග ඇතුලත් වන යම් ගණුදෙනු වලට අදාළ වූ ලේඛන මත හෝ ඒ සේවා නියුක්තයන් විසින් දෙන ලද කුවිතාන්සි පිළිබඳ හෝ ඒ අධිකරණයකදී පවරන ලද සිවිල් හෝ අද්මිරාල්ති නඩු කටයුතු වලදී ඉදිරිපත්කරනු ලබන හෝ ගොනු කරනු ලබන ලේඛන පිළිබඳ හෝ ඒ ණය පත් සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන හිමිකම්පෑම්, ඉල්ලීම් හෝ ඇයැදීම් පිළිබඳ හෝ ඒ ආයතනය විසින් මුදල් කරනු ලබන සංචාරක චෙක්පත් පිළිබඳ හෝ ඒ වෙනත් තැනැත්තා විසින් නිකුත් කරනු ලබන සාධන පත්‍ර පිළිබඳ වාර්තා සටහන්, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා, සමාගම බැංකුව, සේවා යෝජකයා, නිලධරයා , ණයපත් සමාගම, ආයතනය හෝ වෙනත් තැනැත්තා විසින් පවත්වාගෙන යාම.

(iii) කොමසාරිස් ජනරාල් වරයා විසින් නියම කරනු ලබන යම් කාලසීමාවක් අවසානයේ දී ඒ ඒ කාලසීමාවන් තුළ-

(අ) ඒතැනැත්තා විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු ;

(ආ) ඒ සමාගම විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ ණය ස්කන්ධ

(ඇ) ඒ බැංකුව විසින් සපයනු ලබන චෙක් ආකෘති හෝ මුදල් ආපසු ගැනීම හෝ මාරුකිරීම සඳහා යම් තැනැත්තකු යම් බැංකුවක් සමග ඇතුළත් වන යම් ගනුදෙනුවලට අදාල වූ ලේඛන;

(ඇ) ඒ සේවා නියුක්තයන් විසින් දෙනු ලබන කුවිතාන්සි;

(ඉ) ඒ නිලධරයා පත්කරනු ලැබුවේ යම් අධිකරණයකටද ඒ අධිකරණයෙහි පවරන ලද සිවිල් හෝ අද්මිරාල්ති නඩු කටයුතු වලදී ඉදිරිපත් කරනු ලබන හෝ ගොනු කරනු ලබන ලේඛන හෝ

(ඊ) ඒ ණය පත් සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑම්, ඉල්ලීම් හෝ ඇයදීම, හෝ

(උ) ඒ ආයතනය විසින් මුදල් කරනු ලබන සංචාරක චෙක්පත් හෝ

(ඌ) ඒ වෙනත් තැනැත්තා විසින් ඒ කාලය තුළ නිකුත් කරනු ලබන සාධන පත්‍ර වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුද්දර ගාස්තුව අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා සමාගම, බැංකුව, සේවා යෝජකය, නිලධරයා, ණය පත් සමාගමආයතනය හෝ වෙනත් තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීම.

මේ උපවගන්තියේ කාර්යය සඳහා "ආයතනය" යන්නෙන් මුදල් නීතිපතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංචාරක චෙක්පත් මුදල් කිරීම සඳහා බලය දෙන ලද තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

**5** ප්‍රධාන ප්‍රඥප්තියේ' 54 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (ඇ) ඡේදයේ "මුද්දරයක් පාවිච් කර ඇති අවස්ථාවක" යන වචන වෙනුවට, "මුද්දරයක් පාවිච්චි කර ඇති අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන් ;සහ

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ඉ) යම් ණයවර ලිපියක් සඳහා කරන ලද යථා පරිදි මුද්දර ගැසූ ඉල්ලීමකට අනුව නිකුත් කරන ලද ණයවර ලිපියක් කිසිම ආකාරයකින් පාවිච්චි නොකරන ලද අවස්ථාවක."

**6.** 1988 අංක 71 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) "බලය ලත් නියෝජිතයා " යන අර්ථකථනයෙහි (2) වන ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(2) මේ පනතේ කාර්ය සඳහා බලය දෙන ලියවිල්ලේ සඳහන් කරුණු සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූද-

(i) සමාගම් ( විගණකවරයන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි පුද්ගලයකු වන්නා වූද. කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලද්දා වූ ද යම් පුද්ගලයෙක්, නැතහොත්

(ii) ඒ සඳහා සාදන ලද නියෝග යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද්දා වූ ද යම් පුද්ගලයෙක් අදහස් වේ."

(2) "සමර්පනය කිරීම" යන අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :- "ණය පත" යන්නෙන්, යම් වෙළෙන්දකුගෙන් බඩු හෝ සේවා කිසිවක් ණය මත මිලට ගැනීම සඳහා යම් ණය පත් සමාගමක් විසින් යම් තැනැත්තකු වෙත ප්‍රධානය කරන ලද බලය පැවරීමක් අදහස් වේ.

"ණය පත් සමාගම" යන්නෙන්, යම් සමාගමක් තමන් විසින් නිකුත් කරන ලද යම් ණය පතක් දරන්නකු වෙත සහ ඒ ණය පතේ බලය මත යම් වෙළෙන්දකු විසින් ණයට සපයනු ලබන බඩු හෝ සේවා සඳහා ගෙවීම් කරනු ලබන්නේද එම සමාගම අදහස් වේ."

(3)"ලේඛනය" යන අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් "ලේඛන යන්නෙන්"-

(අ) යම් අධිකරණයක නඩු කටයුතු සම්බන්ධයෙන් යෙදෙන විට, නීතිඥවරයකු පත්කිරීම, පැමිණිල්ල, උත්තරය, ප්‍රතිඋත්තරය, හෝ වෙනත් උත්තර වාදයක්, පෙත්සමක්, ඉල්ලීමක් දිවුරුම් පත්‍රයක්, පත් කිරීමක්, සිතාසියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, යම් ආකාරයක ආඥාවක්, ප්‍රදානයක් රිට් ආඥාවක්, වරෙන්තුවක් ඉන්වෙන්ටරියක්, ගිණුමක්, අධිකරණ විධානයක්, බැඳුම්කරයක්, ඇපකරයක්, කැඳවීම් නියෝගයක් සහ මෝසමක් නොවන වෙනත් ඉල්ලීමක්., ප්‍රශ්න මාලාවක්, ප්‍රශ්න මාලාවට උත්තර, අභියාචන පිළිබඳ දැන්වීමක්, ගාස්තු බිල්පත්‍රයක්, කොමිෂන් බලයක්, ඉන්ජන්ෂන් තහනමක් හෝ දැන්වීමක් අදහස් වේනම් ; තවද

(ආ) මුදල් ආපසු ගැනීම හෝ මාරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යම් බැංකුවක් සමග යම් තැනැත්තකු ඇතුළත් වන යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යෙදෙන විට, එම බැංකුව වෙත දෙනු ලබන්නා වූද සහ එම බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන්නා වූද එම තැනැත්තා විසින් එම බැංකුවෙන් පවත්වාගන යන්නා වූ යම් ගිණුමක් මත නිකුත් කරනු ලැබිය හැක චෙක්පතක භාවිතය බැහැර කරනු ලබන්නාවූද, සෑම උපදෙසක් අණක් හෝ නියමයක් (එම උපදෙස අණ හෝ නියමය ලියා ඇත්තේ කඩදාසි, චුම්බක, ඉලෙක්ට්‍රොනික, හෝ වෙනත් මාධ්‍යයක වුවද) අදහස් වේ.".

(4) "රාජ්‍ය සංස්ථාව" යන අර්ථකථනයට ඉක්බිවම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්:-

"තිල ලැයිස්තු ගත පොදු සමාගම" යන්නෙන් සිය ලියාපදිංචි හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාව තුල ඇත්තා වූ හෝ එම ව්‍යාපාරික කටයුතු පාලනය හා කළමණාකරණය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන්නා වූ ද සහ 1987 අංක 36 දරන සුරැකුම්පත් සභා පනත යටතේ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් මගින් පළකරන ලද යම් තිල ලැයිස්තුවක ස්වකීය කොටස් මිල ලැයිස්තු ගත කර ඇත්තා වූද කවර වූ හෝ සමාගමක් අදහස් වේ.

(5) " ලිවීම " යන අර්ථ කථනයෙහි "ඉලක්කම් යොදානු ලබනලැබිය හැකි" යන වචන වෙනුවට "ඉලක්කම් සංග්‍රහගතව හෝ වෙනත් ආකෘතියකින් යොදනු ලැබිය හැකි " යන වචන ආදේශ කිරීමෙන්.

7. "1" මේ පනතේ 3 (3) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් මස 15 වන දින බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(2) මේ පනතේ 5 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියට කරන ලද සංශෝධනය 1986 නොවැම්බර් මස 12 වන දින බලාත්මකවූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර 54 වන වගන්තිය යටතේ දීමනාවක් සඳහා ඉල්ලීමක් කිරීමට හිමිකම ලැබූ සෑම තැනැත්තකුම, ඔහු මේ පනත ආරම්භ වූ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුලත ඉල්ලීමක් කරතොත් ඒ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව කටයුතු කරන ලෙස සලකනු ලැබිය යුතුය.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුව හොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1991 අංක 33 දරන සමාගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කලේ 1991 අගෝස්තු මස 21 වන දින]

## 1982 අංක 17 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1.** මේ පනත 1991 අංක 33 දරන සමාගම් ( සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන 1982 අංක 17 දරන සමාගම් පනතේ 74 වන වගන්තිය, එහි (2) වන උප වගන්තියේ "ඊට උචිත අංකය මගින් වෙන් වෙන් වශයෙන් දක්වනු ලැබිය යුතුය.;

එසේ වවද ඒ සමාගමේ සියලුම කොටස් හෝ ඒ සමාගමේ යම් නිශ්චිත වර්ගයකට අයත් සියලුම කොටස් සම්පූර්ණයෙන් ගෙවා නිමි සහ එකිනෙකට සමාන තත්වයක් දරන කොටස් වන්නා වූ අවස්ථාවක, මේ උපවගන්තිය අදාළ නොවිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3** "ප්‍රධාන ප්‍රඥප්තියේ 108 වන වගන්තිය" එහි (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ "එක් එක් කොටස එහි අංකය මගින් වෙන් වෙන්ව දක්වමින්" යන වචන වෙනුවට "74 වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන මගින් නියම කර ඇති අවස්ථාවක, එක් එක් කොටස එහි අංකය මගින් වෙන් වෙන්ව දක්වමින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව මෙහි පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) (1) වන උපවගන්තියේ සඳහන් සුචියක, 114 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් සඳහන් වන සමාගමක නම ඇතුලත්ව ඇති අවස්ථාවක, ඒ සමාගම නමින් ලියාපදිංචිකර තිබෙන කොටස් ඒ සමාගම විසින් භාරයක් වශයෙන් දරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය පිණිසද ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ සමාගම විසින් දෙන ලද සියලු ලිඛිත නිවේදන ඒ සුචියට අමුණා තිබිය යුතුය.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) බලපත්‍රයේ ඇතුළත් කරනු ලැබූ කොටස් සම්බන්ධයෙන්, 74 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන මගින් නියම කර ඇති අවස්ථාවක ඒ එක් එක් කොටස් එහි අංකය මගින් වෙන් වෙන් වශයෙන් දක්වමින්, ඒ කොටස් පිළිබඳ ප්‍රකාශයක් ; සහ."

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) ඒ, වගන්තියේ නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියේ " 55 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදයේ යන වචන වෙනුවට, "55 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "ආ" ඡේදයේ සහ මේ වගන්තියේ (2) වන උපවගන්තියේ යන වචන ආදේශ කිරීමෙන් ;

(3) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) ප්‍රකාශිතවම වූ ව්‍යාංගික වූ හෝ අනුමිත වූ යම් භාරයක් පිළිබඳ දැන්වීමක් යම් සමාගමක් විසින් දෙන ලද්දේද ඒ සමාගම-

(අ) 1987 අංක දරන සුරැකුම්පත් සභා පනත යටතේ බලපත්‍ර දෙනු ලැබූ ස්කන්ධ විනිමය ස්ථානයක් වෙනුවෙන් තැන්පතු භාරගන්නා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම මූලික පරමාර්ථය කරගෙන ඇත්තා වූද,

(ආ) එකී පනත යටතේ පිහිටුවනු ලැබූ සුරැකුම්පත් සභාව විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ සමාගමක් වන්නා වූද,

අවස්ථාවක ඒ භාරයක් පිළිබඳ දැන්වීම (1) වන උපවගන්තියේ විධිවිධාන ගැන නොතකා ඒ සමාගම විසින් ස්වකීය ලියාපදිංචිකිරීමේ ලේඛනයේ ඇතුලත් කළ යුතු අතර, භාරය පිළිබඳ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා විසින් භාරගනු ලැබිය යුතුය.

(3) ප්‍රකාශිතවම වූ, ව්‍යාංගික වූ හෝ අනුමිත වූ භාරයක් පිළිබඳ දැන්වීම, (2) වන උපවගන්තිය යටතේ යම් සමාගමක ලියාපදිංචි කිරීමේ ලේඛනයේ ඇතුළත් කරනු ලැබූ විටක ඒ සමාගමේ කොටස් කිසිවක් යම් තැනැත්තකු ගේ ප්‍රතිලාභය සඳහා භාරයක් වශයෙන් දරනු ලැබේද ඒ තැනැත්තා විසින් මේ පනතේ පටහැනිව කුමක් සඳහන්වී ඇතද ඒ නොතකා එකී කොටස් සම්බන්ධයෙන් සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද භුක්ති විඳිය යුතු අතර, මේ පනත යටතේ ඒ කොටස් සම්බන්ධයෙන් ලියාපදිංචි වූ කොටස් හිමියෙකුට හිමිකම් ඇති හෝ එවැනි කොටස් හිමියකු යටත්විය යුතු සියලු යුතුකම්වලට සහ බැඳීම්වලට ඔහු යටත්විය යුතුය.

**7**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1991 අංක 49 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 21 වන දින]

### 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

**1**. මේ පනත 1991 අංක 49 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2**. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (Lviii) වන අනු ඡේදයේ "රතු කුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව, සහ" යන වචන වෙනුවට "රතු කුරුස සංගමයේ අන්තර් ජාතික කමිටුව" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (Lix) වන අනු ඡේදයේ "1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය" යන ඉලකක්කම් හා වචන වෙනුවට "1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (Lix) වන අනු ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :-

" (Lx) 1991 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය ; සහ

(Lxi) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රබර් පර්යේෂණ ආඥාපනත යටතේ පිහිටුවන ලද රබර් පර්යේෂණ මණ්ඩලය." තව ද

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (iv) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

" (iv) විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක අක් වෙරළෙහි සියලු ගනුදෙනුවලින් උද්ගත වන ලාභ සහ ආදායම.

මේ අනුඡේදයේ කාර්ය සඳහා යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් විසින් වෙනත් යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක් සමග 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඇතුළත් වන යම් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවක් අක් වෙරළ ගනුදෙනුවක් ලෙස සලකනු ලැබිය යුතු ය;"

(ආ) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(v) යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක රටට උපචිත වීමට ඉඩ ඇති විදේශ විනිමය ප්‍රතිලාභ කෙරෙහි සැළකිල්ල ඇතිව අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙරළබඩ විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනුවලින් 1991 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර උද්ගත වන, එම විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක ලාභ සහ ආදායම;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(iiiඅ) යම් පළාත් සභාවක සේවා නියුක්තයකුගේ හෝ පළාත් සභා රජයේ සේවයේ නිලධරයකුගේ;";

(ආ) ඒ ඡේදයේ (ix) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන්:-

"(x) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පත්කරන ලද අණ්ඩුකාරවරයාගේ ;

(xi) යම් පළාත් සභාවක යම් මන්ත්‍රීවරයකුගේ ";

(ඇ) ඒ ඡේදයේ "(i) වන. (ii) වන. (iii)වන, (iv)වන, (v) වන, (vi) වන, (vii) වන, (viii) වන හෝ (ix) වන විෂයයන් හී සඳහන් " යන ඉලක්කම් සහ වචන වෙනුවට ""(i) වන. (ii) වන, (iii)වන, (iiiඅ)වන, (iv)වන, (v) වන, (vi) වන, (vii) වන, (viii) වන, (ix) වන, (x) වන හෝ (xi) වන විෂයයන්හි සඳහන් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උප වගන්තියේ (ඕ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

" (ඕ) යම් පුද්ගලයකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායම-

(i) (අ) 1979 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසුව එහෙත් 1986 අප්‍රේල් මස 1 දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයකදී රුපියල් තිස් දහසක් ;

(ආ) 1986 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හතලිස් දෙදහසක් ;

(ඇ) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1991 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හතලිස් පන්දහසක්; සහ

(ඈ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක්

නොඉක්මවන්නා වූ සේවා නියුක්තියෙන් ලබන ලාභ වලින් හා ආදායමෙන්; සහ

(ii) සේවා නියුත්තිය හැර වෙනත් සියලු ප්‍රභවයන්ගෙන් ලබන ලාභ සහ ආදායම-

(අ) 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක්දහස් දෙසියයක් නොඉක්මවන්නා වූ ලාභ වලින් සහ ආදායමෙන් පමණක් ; සහ

(ආ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දෙදහස් හාරසියයක් නොඉක්මවන්නා වූ ලාභවලින් සහ ආදායමෙන් පමණක්

සමන්විත වන්නේ නම්, ඒ පුද්ගලයාට, හෝ ඒ පුද්ගලයාගේ ආදායම සමග ස්වකීය මුළු ව්‍යවස්ථාපිත ආදායම එකතු කරනු ලැබූ යම් දරුවකුට ව්‍යුත්පන්නවූ, උද්ගත වන්නා වූ හෝ උපචිත වන්නාවූ, ඒ තක්සේරු වර්ෂය සඳහා වූ සේවා නියුක්තිය හැර වෙනත් සියළු ප්‍රභවයන්ගෙන් එකතුව–

(අ) 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක්දහස් දෙසියයක් ; සහ

(ආ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් දෙදහස් හාරසියයක්

නොඉක්මවන්නා වූ ලාභ සහ ආදායම.

තවද ඒ අනුව මේ ඡේදයම යටතේ හෝ නිදහස් කරන ලද යම් ලාභ සහ ආදායම සම්බන්ධයෙන් යම් තක්සේරු වර්ෂයකදී ඒ පුද්ගලයා විසින් අඩු කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් යම් ආදායම් බද්දක් ගෙවා ඇති අවස්ථාවක, ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ තුනක් ඇතුළත ඒ පුද්ගලයා විසින්, තත් කාර්ය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඒ බද්ද ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතුය.".

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (අ) ඡේදයේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන වෙනුවට "1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–(අ) ඒ ඡේදයේ (xvii) (ආ) අනුඡේදයේ "17ඉ වගන්තියේ සඳහන්" යන ඉලක්කම් සහ වචන වෙනුවට "17ඊ වගන්තියේ සඳහන් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ ඡේදයේ (xix) වන අනුඡේදයේ "22ඈඈඈ වගන්තියේ සඳහන් "යන ඉලක්කම් යන වචන වෙනුවට "22 ඈඈඈඈ වගන්තියේ සඳහන් " යන ඉලක්කම් යන වචන ආදේශ කිරීමෙන්

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ වගන්තියේ (ඈඈඈ) ඡේදයේ අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:–

" මේ ඡේදයේ කාර්ය සඳහා "රක්ෂාව" යන්නෙන් සාහිත්‍යය හෝ ලලිත කලා ක්ෂේත්‍රයෙහි වූ රක්ෂාවක් අදහස් වේ.";

(2) ඒ වගන්තියේ (න) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්:-

"(ප) යම් තිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් යම් තැනැත්තකු විසින් අත්කර ගැනීමේ දින සිට එක් වර්ෂයකට පසුව, එහෙත් 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර විකිණීමෙන් ඒ තැනැත්තාට ව්‍යුත්පන්න වූ හෝ උපචිත වන 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල යම් ලාභ සහ ආදායම".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඇ වගන්තියේ (2) වන උප වගන්තියේ (ඈ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (I) වන අනු ඡේදයේ "කාර්මික ව්‍යවසායක් හෝ" යන වචන වෙනුවට "කාර්මික ව්‍යවසායයක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "සැලසීම සඳහා වූ ව්‍යවසායක්" යන වචන වෙනුවට " සැලසීම සඳහා වූ ව්‍යවසායක් හෝ යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ ඡේදයේ (ii) වන අනු ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුලත් කිරීමෙන් :-

"(iii) ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවා සංවර්ධනය කිරීම සහ සැලසීම සඳහා කොම්පියුටර් තාක්ෂණ විද්‍යාව පදනම් කරගනු ලැබූ පුරෝගාමී ස්වභාවයකින් වූ ව්‍යවසායක්.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඊ වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "මේ වගන්තියේ කාර්ය සඳහා සහ යම් කාර්මික ව්‍යවසායක් සම්බන්ධයෙන්-" යන වචන වෙනුවට "මේ වගන්තියේ කාර්ය සඳහා :" යන වචන ආදේශ කිරීමෙන් ;සහ

(2) ඒ උපවගන්තියේ (ඈ) අනුඡේදයේ "නොවනසේ සැළකිය යුතුය" යන වචන වෙනුවට නොවන සේ සැළකිය යුතුය;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :-

"(ඇ) "බඩු හෝ වෙළඳ ද්‍රව්‍ය නිශ්පාදනය හෝ සෑදීම" යන යෙදුමෙහි පළතුරු, එළවළු, මල් හෝ විසිතුරු පැලැටි වගාකිරීම ඇතුළත් වේ."

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17උ වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

17උ. (1) මගීන් ප්‍රවාහනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභවලින් සහ ආදායමෙහි යම් නිශ්චිත බස් රථයක් ධාවනයෙහි යෙදීමෙන් ලබන ලාභ වලින් සහ ආදායමෙන් සමන් විත වන යම් කොටසක්, මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ බස්රථය පළමුවරට ලියාපදිංචි කිරීමේ දින සිට වර්ෂ තුනක කාළසීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා-

(i) "නිශ්චිත බස්රථය" යන්නෙන් -

(අ) අලුත්වන්නා වූ ;

(ආ) 1990 ජනවාරි මස 1වන දින හෝ ඉන්පසු එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව මෝටර්වාහන රෙජිස්ට්‍රාර්වරයා විසින් පළමුවරට ලියාපදිංචි කර ඇත්තා වූ, සහ

(ඇ) රියැදුරු හැර තැනැත්තන් තිස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් සඳහා ආසන ධාරිතාවක් ඇත්තාවූ යම් බස් රථයක් අදහස් වේ; තවද,

(ii) මගී ප්‍රවාහනය සඳහා වන යම් ව්‍යවසායක් සම්බන්ධයෙන් සහ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට, "යම් නිශ්චිත බස් රථයක් ධාවනය කිරීමෙන් ලබන ලාභ සහ ආදායම යන්නෙන් මගීන් ප්‍රවාහනය කිරීමෙන් එම ව්‍යවසායඑම තක්සේරු වර්ෂය තුලදීලබන එකතු වූ දළ ලැබීම්වලට, මගීන් ප්‍රවාහනය කිරීමෙන් එම ව්‍යවසාය ලබන (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලබන යම් ලාභ හා ආදායම් හැර) ලාභ සහ ආදායම් දරන අනුපාතයම වන්නා වූ අනුපාතයක්, එම බස්රථයෙන් මගීන් ප්‍රවාහනය කිරීමෙන් එම තක්සේරු වර්ෂය තුලදී ලබන (යම් මගීන් කණ්ඩායමක සෑම සාමාජිකයකුට විනෝදය, දර්ශන නැරඹීම, ආගමික හෝ වෙනත් වතාවත් ඉටුකරනු සඳහා එම කණ්ඩායම විසින් තීරණය කරනු ලැබූ හෝ නොලැබූ පොදු ගමනාන්තයකට හෝ ගමනාන්ත වලට ප්‍රවාහනය කිරීමෙන්, ලබන ලැබීම් හැර) දළ ලැබීම්වලට, යම් මුදල් ප්‍රමාණයක් දරන්නේ ද, එම මුදල් ප්‍රමාණය අදහස් වේ".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17උ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 17ඌ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය.:-

17ඌ. (1) (2) වන උපවගන්තියේ සඳහන් යම් අළුත් හෝ පුනරුත්ථාපනය කරනු ලැබූ සිනමා ශාලාවක යම් සිනමා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමෙන් (2) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබෙන ලාභ සහ ආදායම් නොවන) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල ලාභ සහ ආදායමට, ඒ සිනමා ශාලාවේ සිනමා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ව්‍යාපාරය ආරම්භවන දින සිට ගණන් ගනු ලබන වර්ෂ තුනක කාළ සීමාවක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන-

(අ) (i) 1991 ජනවාරි මස 1වන දින හෝ ඉන් පසුව ඉදි කිරීම ආරම්භ කරනු ලැබුවා වූ ; හෝ

(ii) කැරැල්ලකින්හෝ මහජන කැළඹීමකින් 1983 ජූලි මස 23 වන දින හෝ ඉන්පසු විනාශ කරනු ලැබූ බවට පුනරුත්ථාපනය, නැවත ඉදිකිරීම සහ සමාජ සුභ සාධනය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සහතික කරනු ලැබුවා වූ සහ 1991 ජනවාරි මස1වන දින හෝ ඉන් පසුව එහෙත් 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර පුනරුත්ථාපනය කිරීම හෝ නැවත ඉදිකිරීම ආරම්භ කරනු ලැබුවා වූ සිනමා ශාලාවක සිනමා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ ව්‍යාපාරය 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ කරන්නා වූ; සහ

ආ) මේ වගන්තිය අදාලවන ව්‍යාවසායක් බවට 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ යම් ව්‍යාවසායකට අදාළ විය යුතුය".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඈඈඈ වගන්තියේ (2) වන උපවගන්තියේ "ගැසට්පත්‍රයේ පළකරනු ලබන දැන්වීමකින් අමාත්‍යවරයාවිසින් මේ වගන්තියේ කාර්යය සඳහා අනුමත කරනු ලැබුවා වූ ද" යන වචන වෙනුවට "1990 ජනවාරි මස 1වන දින හෝ ඉන්පසු ව්‍යාපාරය කරගෙන යාම ආරම්භ කරනු ලැබුවා වූ සහ 1992 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන" දැන්වීමකින් අමාත්‍යවරයා විසින්මේ වගන්තියේ කාර්ය සඳහා අනුමත කරනු ලැබුවා වූද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඉ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ " 20 වන වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් සමාගමක් හෝ යම් ව්‍යවසායක් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට කිසියම් පියවරක් ගෙන නොමැති බවට; හෝ" යන ඉලක්කම් සහ වචන වෙනුවට " 17අ වගන්තිය හෝ 17ඇ වගන්තිය හෝ 17ඈ වගන්තිය හෝ 20 වන වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය හෝ 22ඈඈඈවගන්තිය හෝ 22ඈඈඈ ඈ වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් සමාගමක් හෝ යම් ව්‍යවසායක් විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට කිසියම් පියවරක් ගෙන නොමැති බවට හෝ 17ඊ වගන්තිය යටතේ අනුමත කරන ලද යම් ව්‍යවසායක් විසින් ස්වකීය නිශ්පාදන ධාරිතාව ව්‍යාප්ත කිරීමට කිසියම් පියවරක් ගෙන නොමැති බවට; හෝ" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ පාර්ශව සටහනෙහි "16 වන, 16අ, 16ආ, 20 වන, 22අ, 22ආ, 22ඇ හෝ 22ඈ වගන්ති යටතේ " යන ඉලක්කම් සහ වචන වෙනුවට "16 වන , 16අ, 16ආ, 17අ, 17ඇ, 17ඈ, 20 වන, 22අ, 22ආ, 22ඇ, 22ඈ, 22ඈඈඈ හෝ 22ඈඈඈඈ වගන්ති යටතේ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් .

13 ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඔ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ඔ) යම්-

(i) 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ගෙවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බද්දක්;

(ii) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 47 වන වගන්තිය හෝ 48 වන වගන්තිය යටතේ ඉඩදෙනු ලබන යම් අඩු කිරීමක් අඩු කිරීමෙන් පසුව ඒ පනත යටතේ ගෙවිය යුතු පිරිවැටුම් බද්දක්; හෝ

(iii) පිළිවෙලින් (i) වන හෝ (ii) වන අනුඡේදයන් හී සඳහන් කරනු ලැබ ඇති ව්‍යාපාර පිරිවැටුම් බද්දට හෝ පිරිවැටුම් බද්දට අනුරූප වන්නා වූ ද යම් පළාත් සභාවක් විසින් පනවනු ලැබූ යම් ප්‍රඥාප්තියක් යටතේ 1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසු ගෙවිය යුතු වූද බද්දක් !

එසේ වුවද, එසේ ගෙවිය යුතු යම් බද්දක් ගෙවා නොමැති බව යම් තක්සේරුවක් කරන අවස්ථාවේ දී තක්සේරු කරුවකුට පෙනී යන අවස්ථාවක, ඒ බද්ද සම්බන්ධයෙන් යම් අඩු කිරීමකට ඉඩ දීම ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය:

එසේම තව දුරටත් අඩු කිරීමක් ප්‍රතිකිෂේප කරනු ලැබ ඇත්තේ යම් බද්දක් සම්බන්ධයෙන්ද ඒ බද්ද තක්සේරුව අදාළවන ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට වර්ෂ හයක කාලසීමාවක් ඇතුළත ගෙවා ඇති බව තක්සේරු කරුට පෙනී යන අවස්ථාවක, ඒ ගෙවීම කිරීමෙන් පසුව මාස 12ක් ඇතුලත ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමක් මත සහ ඒ ගෙවිම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරනු ලබන පරිදි යම් ඔප්පු කිරීමෙක් සැපයීම මත, 123 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, ඒ අඩු කිරීමට ඉඩ දෙමින් ඔහු විසින් සංශෝධිත තක්සේරුවක් කළ යුතුය. තවද 149 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද එම සංශෝධිත තක්සේරුවේ ප්‍රතිඵලයක් වශයෙන් අතිරික්ත වශයෙන් ගෙවා ඇතැයි සොයාගනු ලබන යම් බද්දක්, ආපසු ගෙවනු ලැබිය යුතුය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

"(ඬ) යම් අවදානම් ප්‍රාග්ධන සමාගමක්, යම් ඒකක භාරයක් හෝ යම් අන්‍යොන්‍ය අරමුදලක් නොවන්නා වූ ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් කළමනාකරණය සඳහා ප්‍රතිෂ්ඨාව වශයෙන්, ඒ තැනැත්තා විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු යම් මුදලක,-

(i) රුපියල් දස ලක්ෂයක්, හෝ ලාභ සහ ආදායම නිශ්චය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාළ සීමාව තුල එම වෙළඳාමෙන් ව්‍යාපාරයෙන්, වෘත්තියෙන් හෝරක්ෂාවෙන් ලබන පිරිවැටුමෙන් සියයට එකක් යන දෙකින් කවර හෝ අඩු මුදල ; හෝ

(ii) ඒ ප්‍රතිෂ්ඨාව වශයෙන් සියළු අවස්ථාගත කරුණු කෙරෙහි සැලකිල්ල ඇතිව සාධාරණ සහ වාණිජ වශයෙන් යුක්තිසහගත යයි කොමසාරිස් ජනරාල් වරයා විසින් තීරණය කරනු ලබන යම් මුදලක් යන දෙකින් කවර හෝ වැඩි මුදල මේ ඡේදයේ කාර්ය සඳහා යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් සහ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් "පිරිවැටුම" යන යෙදුමෙන් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් හැර ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යාමෙහි ලා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ කාලසීමාව තුළ ඇතුළත්වූ ගණුදෙනුවලින් හෝ ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල අදහස් වේ.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ඔහුට සිදුවන ප්‍රාග්ධන අලාභයක් හෝ 7 වන උපවගන්තියෙහි සඳහන් අලාභයක් හෝ නොවන අලාභයක් වන්නාවූද" යන වචන ඉලක්කම් වෙනුවට "ඔහුට සිදුවන ප්‍රාග්ධන අලාභයක්, (7) වන උපවගන්තියෙහි සඳහන් අලාභයක් හෝ (7අ) උපවගන්තියෙහි සඳහන් අලාභයක් නොවන අලාභයක් වන්නාවූ ද," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "17අ වගන්තිය හෝ 22අ වගන්තිය හෝ 22ආ වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය හෝ 22ඈඈ වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "17අ වගන්තිය හෝ 17ආ වගන්තිය හෝ 17ඇ වගන්තිය හෝ 17ඈ වගන්තිය හෝ 17ළ වගන්තිය හෝ 17ළු වගන්තිය හෝ 22අ වගන්තිය හෝ 22ආ වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය හෝ 22ඈඈ වගන්තිය හෝ 22ඈඈඈ වගන්තිය හෝ 22ඈඈඈඈ වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(7අ) 1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක යම් තැනැත්තකුගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි, යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක වෙරළබඩ විදේශීය මුදල් ගනුදෙනුවලින් උද්ගත වන්නා වූ ද මේ පනත යටතේ ආදායම් බද්දෙන් නිදහස් නොවන්නා වූ ද ලාභ සහ ආදායම් අඩංගු වන අවස්ථාවක, 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා එම විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකය විසින් වෙරළබඩ විදේශීය මුදල් ගණුදෙනුවලදී දරනු ලැබුවා වූ ද, යම් ලෙසකින් එය ලාභයක් වූයේ නම් එම ලාභය මේ පනත යටතේ තක්සේරු කරනු ලැබිය හැකි වූ ද,' පූර්ව වර්ෂයක් සඳහා මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු නොලැබුවා වූ ද, යම් අලාභයක් අඩු කළ යුතුය;

එසේ වුවද කිසිම අවස්ථාවක ඒ අඩු කිරීම එකී මුළු ව්‍යවස්ථාපිත ආදායමෙහි ඇතුළත් ඒ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයේ ලාභවල සහ ආදායමෙහි මුදල නොඉක්මවිය යුතු අතර පාඩුව සිදුවූයේ යම් තක්සේරු වර්ෂයක දී ද ඒ තක්සේරු වර්ෂයට පසුව එලඹෙන පළමුවන තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් හැකිතාක් දුරට අඩු කරනු ලැබිය යුතුය. තවද, එසේ කරනු ලැබිය නොහැකි ප්‍රමාණය, ඊලඟ අනුප්‍රාප්තික තක්සේරු වර්ෂයේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් යනාදී වශයෙන් අඩු කරනු ලැබිය යුතුය.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(viii) පළාත් සභාවක් විසින් පිහිටුවනු ලැබ, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අරමුදලකට"; සහ

(2) ඒ උපවගන්තියේ (ඔ) ඡේදයෙහි (x) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :-

"(xi) 1988 අංක 77 දරන ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය පනතින් පිහිටුවන ලද ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයට ;".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(ආ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂිකය වශයෙන් ලැබුණා වූ මුදලක්, එහෙත් ඒ මුදලෙහි රුපියල් පහළොස් ලක්ෂය ඉක්මවන්නා වූ යම් කොටසක් හැර යම්, මුදලක්; හෝ" සහ

(2) ඒ වගන්තියේ (3ආආ) උපවගන්තියේ -

(i) "යම් තැනැත්තකු විසින් යම් තිල ලැයිස්තුගත පොදු සමාගමක යම් කොටසක් අත්කර ගැනීමේ දිනයට පසු එක් අවුරුද්දක කාලසීමාවක් ඇතුළත ඒ කොටසෙහි අයිතිය වෙනස්වීමෙන් උද්ගත වන යම් ප්‍රාග්ධන ලාභයක් ඒ තැනැත්තාගේ බදු අයකළ හැකි ආදායමෙහි, ඇතුලත් වන්නා වූ" යන වචන වෙනුවට "යම් තැනැත්තකුගේ බදු අයකළ හැකි ආදායමෙහි යම් තිල ලැයිස්තුගත පොදු සමාගමක කොටසක් වන්නා වූ ද අත්කර ගැනීමේ දින සිට එක් වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් ඒ තැනැත්තා විසින් දරා ඇත්තා වූ ද යම් කොටසක.

(අ) අයිතිය වෙනස්වීමෙන් උද්ගතවන යම් ප්‍රාග්ධන ලාභයක්, හෝ

(ආ) 1994 අප්‍රේල් මස 1 වන දිනට පෙර විකිණීමෙන් උද්ගතවන 3 වන වගන්තියේ (අ) ඡේදයෙහි අර්ථානුකූල ලාභ සහ ආදායම ඇතුළත් වන්නා වූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;සහ

(ii) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ II අනු ඡේදයේ "අදාළ වන පරිදි සියයට දහයට ඉහල යම් අනු ප්‍රමාණයක් අනුව" යන වචන වෙනුවට "අදාළ වන පරිදි සියයට විස්සට ඉහල යම් අනු ප්‍රමාණයක් අනුව" යන වචන ආදේශ කිරීමෙන් .

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 32ඇඇ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය.:-

32ඇඇ යම් වෙරළබඩ විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනුවලින් 1991 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසු උද්ගතවන යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බද්දකට යටත් වන්නේය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉ වගන්තියේ "1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන ඉලක්කම් සහ වචන ඒ වගන්තියෙහි යෙදෙන කවර හෝ විටෙක, ඒ වෙනුවට "1990 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 32ඉඉ වගන්තිය වශයෙන් බල සහිත විය යුතුය:-

32ඉඉ. 67 වන වගන්තියෙහි (7) වන උපවගන්තිය අදාළ නොවන්නා වූ යම් පුද්ගලයකුගේ 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරු කළ හැකි ආදායමෙහි සේවා නියුක්තියෙන් ලබන ලාභ ඇතුළත් වන අවස්ථාවක,

රුපියල් එක්දහස් පන්සියයක් "සමාන මුදල් ප්‍රමාණයක් හෝ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභයට ආරෝපනය කරනු ලැබිය හැකිආදායම් බද්දට සමාන මුදල් ප්‍රමාණයක් හෝ යන මේ දෙකින් කවර වූ හෝ අඩු මුදල් ප්‍රමාණය ඒ පුද්ගලයා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු වන අදායමේ බද්දෙන් අඩු කරනු ලැබිය යුතුය.

මේ වගන්තියේ කාර්ය සඳහා යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුගේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභයට ආරෝපනය කරනු ලැබිය හැකි ආදායම් බදු මුදල, එම තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායම (එහෙත් එම තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයාගේ තක්සේරු කළ හැකි ආදායමෙහි 32(2) වන වගන්තියෙහි සඳහන් යම් මුදලකින් සමන්විත වන්නා වූ කොටස හැර) එම තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයා සේවා නියුක්තියෙන් ලබන ආදායමට (එහෙත් එම තක්සේරු වර්ෂය සඳහා එම පුද්ගලයා සේවා නියුක්තියෙන් ලැබුවා වූද, 32(2) වන වගන්තියෙහි සඳහන් යම් මුදලකින් සමන්විත වන්නා වූ ද යම් මුදල් ප්‍රමාණයක් හැර) දරන අනුපාතයම වන අනුපාතයක්, ඒ පුද්ගලයා විසින් ඒ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු වන ආදායම් බද්දට (එහෙත් මේ පනතෙහි පළමුවන උපලේඛනයෙහි IV වන කොටසේ සඳහන් යම් උචිත අනුප්‍රමාණ අනුව පනවනු ලැබූ යම් බදු මුදලක් හැර), යම් මුදල් ප්‍රමාණයක් දරන්නේ ද, එම මුදල් ප්‍රමාණය විය යුතුය.".

**21**. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1ඇ) උපවගන්තියේ "32 වන වගන්තියේ (3අ) වන සහ (3ආ) වන වගන්තවල විධිවිධාන යන ඉලක්කම් සහ වචන වෙනුවට" 32 වගන්තියේ (3අ), (3ආ) සහ (3ආආ) උපවගන්තිවල විධිවිධාන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

**22**. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:–

(1) ඒ වගන්තියේ (න) ඡේදයේ "යම් ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල් ;" යන වචන වෙනුවට "යම් ගිණුමක ඔහුගේ බැරට ඇති මුදල්;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (න) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :–

"(ප) යම් තිල ලැයිස්තුගත පොදු සමාගමක ඒ තැනැත්තා විසින් දරනු ලබන යම් කොටසක් ."..

**23**. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "කොමසාරිස් ජනරාල්වරයා විසින්" යන වචන සිට "ඒ තක්සේරු වර්ෂය සඳහා දිය යුතුය;" යන වචන දක්වා වූ වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයක වූ දැන්වීමක් හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල් කරු විසින්, හෝ සක්‍රීය හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ වාසිකව නොසිටින අවස්ථාවක ඒ හවුල් ව්‍යාපාරයේ ශ්‍රී ලංකාවේ අනුයෝජිතයා විසින්:–

(අ) 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වූ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝම්බර් සහ ජනවාරි වන මාසවල තිස්එක්වන දින හෝ ඊට පෙර සහ ඒ තක්සේරු වර්ෂයේ අවසානයට ඉක්බිතිවම එළඹෙන සැප්තැම්බර් මාසයේ තිස් වන දින හෝ ඊට පෙර එම හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරුට නිකුත් කළ යුතුය.; තවද

(ආ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ ජූලි, ඔක්තෝම්බර් සහ ජනවාරි යන මාසවල තිස් එක් වන දින හෝ ඊට පෙර සහ ඒ තක්සේරු වර්ෂයේ අවසානයට ඉක්බිතිවම එළඹෙන අප්‍රේල් මාසයේ තිස් වන දින හෝ ඉන්පෙර ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල් කරුට තිකුත් කළ යුතුය.;".

**24.** ප්‍රධාන ප්‍රධාන පඥප්තියේ 73 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "නිර්වාසික තැනැත්තකුට ලැබෙන යම් මුදල්" යන වචන වෙනුවට "1990 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී නිර්වාසිකව තැනැත්තකුට ලැබෙන යම් මුදල් " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර,එය ඒ ප්‍රඥප්තියේ 84අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතුය

84අ. (1) (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු හෝ යම් හවුල් ව්‍යාපාරයක හවුල් කරුවකු විසින්, 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඔහු විසින් (2) වන වගන්තියෙහි සඳහන් තම ආදායම සම්බන්ධයෙන් ශ්‍ර ලංකාවෙහි ආදායම් බදු සහ අනුරූප කාලසීමාව සඳහා වෙනත් යම් රටකදී ආදායම් බදු ගෙවන ලද බවට හෝ ගෙවීමට ඉඩ ඇති බවටකොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක, එවිට (මේ වගන්තිය යටතේ යම් සහනයක් ප්‍රදානය කරනු ලැබීමට පෙර )එම වෙනත් යම් රටේදී ඔහුගේ එම ආදායම් සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද ඉක්මවා ශ්‍රී ලංකාවේදී ඔහු විසින් එම ආදායම සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවිය යුතු ආදායම් බද්දක් වෙතොත්, එම අතිරික්තයට සමාන මුදලකින් ශ්‍රී ලංකාවේ දී ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සහන ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේය.

(2) (1) උපවගන්තියේ සඳහන් විධිවිධාන -

(අ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ක්ෂේත්‍රයන්හී ශ්‍රී ලංකාවේ දී කළමනාකරණ උපදේශක සේවාවන් සලකනු ලබන්නා වූ යම් නිර්වාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි යම් හවුල් ව්‍යාපාරයක යම් හවුල් කරුවකුට; සහ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කළමනාකරණ උපදේශක සේවාවන් සැලසීමෙන් 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවේදී උද්ගත වූ හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වූ ලාබ සහ ආදායම් සම්බන්ධයෙන් අදාළ විය යුතුය

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා (2) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක යම් හවුල් කරුවකු විසින් හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් තම ලාභ සහ ආදායම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේදී හෝ වෙනත් යම් රටක දීගෙවිය යුතු ආදායම් බද්ද, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේදී හෝ ඒ වෙනත් රටෙහිදී (මේ වගන්තිය යටතේ යම් සහනයක් ප්‍රධානය කිරීමට පෙර) ඒ තැනැත්තා විසින් හෝ ඒ හවුල් කරු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, අවස්ථාවෝචිත පරිදි, ශ්‍රී ලංකාවේ දී හෝ ඒ වෙනත් රටෙහිදී ආදායම් බද්ද සම්බන්ධයෙන් වූ කාර්යය සඳහා නිශ්චය කරනු ලැබූ ඔහුගේ බදු අය කළ හැකි ආදායමෙන් බෙදීමෙන් ලබාගත් ලබ්ධියට සමාන අනුප්‍රමාණයක් අනුව ආගණනය කරනු ලැබිය යුතුය.".

**26**. ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ වගන්තියේ "20 (1) වන වගන්තියේ හෝ 20අ (1) වන වගන්තියේ සඳහන්" යන ඉලක්කම් සහ වචන සිට " අඩු කිරීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතුය" යන වචන දක්වා වූ සියළු ඉලක්කම් සහ වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"20 (1) වන වගන්තියේ හෝ 20අ (1) වන වගන්තියේ සඳහන් ව්‍යවසායක අපනයන පිරිවැටුමෙන් යම් තැනැත්තකුගේ ශුද්ධ විදේශ විනිමය ඉපයීම එකී වගන්තිවල විධිවිධාන යටතේ ඒ තැනැත්තාගේ ලාභය සහ ආදායම මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආදායම් බද්දෙන් නිදහස්වන අන්තිම වර්ෂයේ අවසානයට ඉක්බිතිවම එළඹෙන -

1987 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට වර්ෂ දහයක කාළසීමාව තුළ, හෝ

1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට වර්ෂ පහක කාළසීමාව තුළ

එක් එක් වර්ෂයේ (නැව් ගාස්තු හා රක්ෂණ ගාස්තු අය කිරීමට පෙර) ඒ අපනයන වල වටිනාකමින් -

(අ) (i) 1987 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට සියයට හැත්තෑපහක් හෝ ඊට වැඩි බවට, සහ

(ii) 1987 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු එහෙත් 1991 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට සියයට පනහක් හෝ ඊට වැඩි බව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කරනු ලබන්නා වූ; හෝ

(ආ) 1991 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට සියයට විසිපහක් හෝ ඊට වැඩිවන්නාවූ අවස්ථාවක

ඉහත සඳහන් වර්ෂ දහයේ හෝ පහේ කාළසීමාව තුළ වූ කවර හෝ තක්සේරු වර්ෂයක් සඳහා වන අපනයන ලාභය සහ ආදායම සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු වන ආදායම් බද්දෙන් , නිශ්චිත මුදලින් සියයට පනහකට සමාන මුදලක් අඩු කිරීමට ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතුය.;

එසේ වුවද 1991 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 20 (1) වන වගන්තියෙහි හෝ 20අ (1) වගන්තියෙහි සඳහන් යම් ව්‍යවසායක අපනයන පිරිවැටුමෙන් යම් තැනැත්තකුගේ ශුද්ධ විදේශ විනිමය ඉපැයීම ආගණනය කළයුතු ආකාරය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කළ හැකිය

**27**. ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන වචන සිට "ලිඛිත දැන්වීමක් කරනු ලැබිය හැකිය" දක්වා වූ සියළු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"යම් තක්සේරු වර්ෂයක් සඳහා ගිණුම් ප්‍රකාශයක් සහ ඒ තක්සේරු වර්ෂය සඳහා හෝ ඒ තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායම් ආගණනය කරනු ලබන්නේ යම්

කාලයක් සම්බන්ධයෙන්ද ඒ කාලය සඳහා යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් පිළිබඳව, දැන්වීමෙහි සඳහන් කරනු ලබන විස්තර ඇතුළත් උපලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත සැපයීමට නියම කරමින් හවුල් ව්‍යාපාරයක් හවුල් කරුවකුට හෝ ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ තක්සේරු කරුවකු විසින් ලිඛිත දැන්වීමක් කරනු ලැබිය හැකිය.;

එසේ වුවද, ඒ වෙළඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේ හෝ රක්ෂාවේපිරිවැටුම 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ ඒ වෙළඳාමේ, ව්‍යාපාරයේ, වෘත්තියේහෝ රක්ෂාවේ ව්‍යවස්ථාපිත ආදායම ආගණනය කරනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහාද ඒ කාලසීමාව සඳහා රුපියල් පනස් ලක්ෂයක් ඉක්මවන අවස්ථාවක, මේ වගන්තිය යටතේ දැන්වීමක් ඒ හවුල්කරුට හෝ ඒ තැනැත්තාට දනු නොලැබුවද ඔහු විසින් ඒ තක්සේරු වර්ෂය හෝ කාලසීමාව සම්බන්ධයෙන් හෝ එම ගිණුම් ප්‍රකාශයක් සහ එම උපලේඛන සැපයිය යුතුය.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ඉදිරිපත් කරනු ලැබිය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"ඉදිරිපත් කරනු ලැබිය යුතුය:

එසේ වුවද 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා හෝ ඒතක්සේරු වර්ෂය සඳහා ඒ වෙළඳ මේ, ව්‍යාපාරයේ වෘත්තියේ හෝ රක්ෂාවේ ව්‍යවස්ථාපිත ආදායම ගණන් බලනු ලබන්නේ යම් කාලසීමාවක් සඳහා ද එම කාලසීමාව සඳහා එම වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව සම්බන්ධයෙන් වූ පිරිවැටුම රුපියල් පනස්ලක්ෂයක් ඉක්ම වන්නා වූ, අවස්ථාවක, ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යන තැනැත්තා විසින්, ඒ තකසේරු වර්ෂය හෝ ඒ කාලසීමාව සඳහා සපයන ලද ගිණුම් ප්‍රකාශයක් අනුමත ගණකාධිකාරවරයකු විසින් පිළියෙල කරනු ලැබ තිබිය යුතුය.".

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා-

(i) "අනුමත ගණකාධිකාරිවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ සාමාජිකයකු වන ගණකාධිකාරිවරයෙක් ;

(ආ) "බලයලත් නියෝජිතයා" යන්නෙහි අර්ථකථනයේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ගණකාධිකාරිවරයෙක් ; හෝ

(ඇ) සමාගම් (විගණකවරයන්) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබ බලයලත් නියෝජිතයා " යන්නෙහි අර්ථකථනයේ කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් පුද්ගලයෙක් අදහස්වේ; තවද

(ii) යම් වෙළඳාමක් ව්‍යාපාරයක් වෘත්තියක් හෝ රක්ෂාවක් සහ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වන විට "පිරිවැටුම" යන්නෙන් (ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් හැර) ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව

කරගෙන යාමේදී හෝ ක්‍රියාත්මක කිරීමේදී ඒ කාලසීමාව තුළ ඇතුළත් වූ ගණුදෙනුවලින් හෝ ඉටු කරන ලද සේවාවන් සඳහා හෝ ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල් ප්‍රමාණය අදහස් වේ.".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

"(1) (අ) මාසයකට රුපියල් තුන්දහස් පන්සියයකට හෝ වර්ෂයකට රුපියල් හතලිස් දෙදහසකට වැඩි පාරිශ්‍රමිකයක් ලබන යම් පුද්ගලයකු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අදූපහකට හෝ වර්ෂයටරුපියල් එක්දහසකට වැඩි පාරිශ්‍රමිකයන් ලබන යම් නිර්වාසික පුද්ගලයකු සේවයෙහි නියුක්ත කරන්නා වූද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107ඇ (1) වන වගන්තිය යටතේ හෝ මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීමක් කර නොමැත්තා වූද සෑම සේවා යෝජකයකු විසින්ම (මේ පරිච්ඡේදයේ මින්මතු "නියමිත සේවා නියුක්තයා" යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් පුද්ගලයකු තම සේවයෙහි සිටින බව 1992 මාර්තු මස 15 වන දින නොඉක්මවා කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දීමක් කළ යුතුය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 109 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

"(2අ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් ඇතුළත උද්ගතවන යම් ගෙවීම් කාළසීමාවක් සඳහා තක්සේරුවක මුදලට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම සේවායෝජකයකු විසින්ම (ඒ සේවායෝජකයා විසින් දැනටමත් එලෙස කර නොමැති නම්) ඒ ගෙවීම් කාලසීමාව සම්බන්ධයෙන් තම සේවා නියුතක්තයන්ට ගෙවන ලද පාරිශ්‍රමිකයෙන් මේ පරිච්ඡේදය මේ විධිවිධාන යටතේ අඩු කිරීමට හා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ඒ සේවායෝජකට නියම කරනු ලැබූ එහෙත් එසේ ප්‍රේෂණය කරනු නොලැබූ සම්පූර්ණ ආදායම් බද්ද හෝ එහි යම් කොටසක්, ඒ තක්සේරුව සම්බන්ධයෙන් වූ දැන්වීමේ දිනය දක්වා 110 වන වගන්තිය යටතේ ඒ මත උපචිත වූ යම් දණ්ඩනයක් සමග, කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. තවද එසේ ප්‍රේෂණය කරන ලද බව ඔප්පු කෙරෙන කුවිතාන්සියක් අභියාචන පෙත්සමට ඇමිණිය යුතුය.

(2ආ) (2) වන සහ (2අ) උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන්නා වූ අභියාචන පෙත්සමක් වලංගු නොවිය යුතුය.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 113 උ වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය අතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

"(2අ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා වූ තක්සේරුවක මුදලට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම බැංකුවක් හෝ මුදල් ආයතනයක්ම, (ඒ බැංකුව හෝ මුදල් ආයතනය විසින් දැනටමත් එලෙස කර ඇත්නම් මිස) ඒ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ බැකුව විසින් හෝ ඒ මුදල් ආයතනය විසින් ගෙවන ලද පොළියෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ අඩු කිරීමට හා කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට ඒ බැංකුවට හෝ මුදල් ආයතනයට නියම කරනු ලැබූ එහෙත් ප්‍රේෂණය කරනු නොලැබූ සම්පූර්ණ ආදායම් බද්ද හෝ ඉන් යම් කොටසක් ඒ

තක්සේරුව සම්බන්ධයෙන් වූ දැන්වීමේ දිනය දක්වා 113උඉ වගන්තිය යටතේ ඒ මත උපචිත යම් දණ්ඩනයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. තවද , ඒ ප්‍රේෂණය ඔප්පු කිරීමෙහිලා කුවිතාන්සියක් අභියාචන පෙත්සමට ඇමිණිය යුතුය.

(2ආ) (2) වන සහ (2අ) උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන්නා වූ අභියාචන පෙත්සමක් වලංගු නොවිය යුතුය.".

**31**. ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා තක්සේරුවක් සම්බන්ධයෙන් වූ මුදලට විරුද්ධව (1) වන උප වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකුම, ( ඒ තැනැත්තා විසින් දැනට මත් එලෙස කර ඇත්නම් මිස) ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා විසින් සපයන ලද වාර්තාවේ පදනම මත ඔහු විසින් ගෙවිය යුතු බදු මුදල තක්සේරුව සම්බන්ධයෙන් වූ ද ඒ දැන්වීමේ දිනය දක්වා ඒ මත උපචිත යම් දණ්ඩනයක් සමග කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතුය; එසේ වුවද තක්සේරුව සම්බන්ධයෙන් ඒ දැන්වීමේ කාලයේදී හෝ ඊට ආසන්න කාලයක දී අභියාචක විසින් විඳින ලද බරපතල මුදල් දුෂ්කරතා නිසා නැතහොත් වෙනත් යම් යුක්තිසහගත හේතුවක් නිසා ඒ බද්ද සහ ඒ දණ්ඩනය ගෙවීමෙන් අභියාචක වලක්වනු ලැබූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වුවහොත් ඒ බද්ද සහ ගෙවීමේ දිනය දක්වා ඒ මත උපචිත දණ්ඩනය ගෙවීම සඳහා කාලය දීර්ඝ කිරීමක් දෙනු ලැබිය හැකිය. තවද, ඒ අනුව ඒ බද්ද සහ ගෙවීමේ දිනය දක්වා ඒ මත උපචිත දණ්ඩනය ගෙවීම ඔප්පු කිරීමෙහිලා ඒ දීර්ඝ කරනු ලැබූ කාලය ඇතුළත ඉදිරිපත් කරන ලද කුවිතාන්සියක් මේ වගන්තියේ කාර්ය සඳහා අභියාචන පෙත්සමට අමුණනු ලැබූ ලෙස සැළකිය යුතුය.".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "(2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන" යන ඉලක්කම් සහ වචන වෙනුවට "(2) වන, (3) වන සහ (3අ) උපවගන්තිවලට අනුකූල නොවන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්;

**32**. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ (ii) වන ඡේදයේ "ඒ ත්‍රෛමාසික බදු වාරික ලැබිය යුතු වූ තක්සේරු වර්ෂයේ " යන වචන සිට ""දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතුය." යන වචන දක්වා වූ වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

"ඒ ත්‍රෛමාසික බදු වාරික ලැබිය යුතු වූ -

(අ) ඒ තක්සේරු වර්ෂය 1991 මාර්තු මස 31 වන දින හෝ ඉන් පෙර අවසන් වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක නොවැම්බර් මස තිස්වන දින තෙක්; සහ

(ආ) ඒ තක්සේරු වර්ෂය 1991 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන තක්සේරු වර්ෂයයක් වන අවස්ථාවක, සැප්තැම්බර් මස තිස් වන දින තෙක් මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසියම් දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතුය.".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.:-

(1) ඒ උපවගන්තියේ (අ) වන ඡේදයේ "92 වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ 93 වන වගන්තිය" යන ඉලක්කම් සහ වචන වෙනුවට "92 වන වගන්තියේ (5) වන උපවගන්තිය, 92අ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ 93 වන වගන්තිය" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උප වගන්තියේ (ඇ) ඡේදයේ "92 වන වගන්තියේ (1) වන වගන්තියේ හෝ 92අඅ වගන්තියේ " යන ඉලක්කම් සහ වචන වෙනුවට "92 වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 92අඅ වගන්තියේ " යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්,

**34** ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" (අඅ) යම් පළාත් සභාවක් පිහිටුවා ඇත්තේ යම් පළාතක් සඳහාද ඒ පළාත ඇතුලත යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ කරගෙන යනු ලබන යම් තොග හෝ සිල්ලර වෙළඳාමක් හෝ ව්‍යාපරයක් සම්බන්ධයෙන් 1991 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා පිරිවැටුමට අදාල කාරණයක් සම්බන්ධයෙන් ඒ පිරිවැටුම නිශ්වය කිරීමට පළාත් සභා ආදායම් කොමසාරිස්වරයාට හැකි කිරීම පිණිස අවශ්‍ය යැයි කොමසාරිස් ජනරාල්වරයා සලකන ප්‍රමාණයට ඒ කොමසාරිස්වරයාට.

මේ ඡේදයේ කාර්ය සඳහා පිරිවැටුම යන යෙදුමෙහි 24 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ණ) ඡේදයෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේය.".

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 161අ වගන්තිය වශයෙන් බල සහිත විය යුතුය:-

161අ. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් විසින් හෝ තත්කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමෙන්තුවේ වෙනත් යම් නිළධරයකු විසින් හෝ පහත දැක්වෙන සියළු ක්‍රියා හෝ ඉන් කිසිවක් කළ හැකිය.

(අ) යම් තැනැත්තකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ යම් වෙළඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝරක්ෂාවක් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට මේ පනතේ කාර්ය සඳහා ඇතුළු වී පරීක්ෂා කිරීම;

(ආ) යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක් වාර්තාවක් හෝ වෙනත් යම් ලේඛනයක් එහි තිබී සොයාගත හැකි යම් බඩුනක් විවෘත කොට පරීක්ෂා කිරීම සහ එහි සොයාගනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ටරියක් සෑදීම;

(ඇ) ඒ ස්ථානයේදී හෝ ගොඩනැගිල්ලෙහි දී සොයාගනු ලැබූ යම් ගිණුම් පොතක් රෙජිස්ටරයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලේඛනයක් පරීක්ෂා කිරීම සහ ඉන් පිටපත් හෝ උධෘත ගැනීම;

(ඇ) එවැනි යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක් වාර්තාවක් හෝවෙනත් ලේඛණයක් සන්තකයට ගැනීම හෝ ඒ මත හඳුනා ගැනීමේ සලකුණු තැබීම;.

(ඉ) ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලෙහි සොයාගනු ලැබූ මුදල් වහාම ගණන් කිරීම සහ ඒ පිළිබඳ වාර්තාවක් සකස් කිරීම

(ඊ) එවැනි යම් ස්ථානයකදීහෝ ගොඩනැගිල්ලක දී ඔහු විසින් සොයාගනු ලබන යම් තැනැත්තකුට මේ පනත යටතේ යම් කාරණයක් සම්බන්ධයෙන් තම බලය ඇතුළත වූ යම් තොරතුරක් දීමට තියම කිරීම;

(උ) මේ පනත යටතේ වූ යම් කාරණයක් පිළිබඳව යම් ස්ථානයක හෝ ගොඩනැගිල්ලක ඔහු විසින් සොයාගනු ලබන යම් තැනැත්තකු සුදුසු යයි තමා අදහස් කරන පරිදි තනිවම හෝ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හෝ පරීක්ෂා කිරීම

(2) (1) වන උප වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් යම් ගිණුම් පොතක්, රෙජිස්ටරයක් වාර්තාවක් හෝ වෙනත් ලේඛනයක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත රෙජිස්ටර වාර්තාව හෝ වෙනත් ලේඛනය සඳහන් කෙරෙන සටහන් පත්‍රයක් අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නිකුත් කළ යුතුය.

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක් රෙජිස්ටරයක් වාර්තාවක් හෝ වෙනත් ලේඛනය ඒ පොත රෙජිස්ටරය වාර්තාව හෝ වෙනත් ලේඛනය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන තාක් කල් හෝ ඒ පොත රෙජිස්ටරය වාර්තාව හෝ වෙනත් ලේඛනය අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා ඒ නිලධරයාගේ සන්තකයෙහි රඳවාගනු ලැබිය හැකිය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "භාණ්ඩ" යන්නෙහි 161 වන වගන්තියෙන් ඊට දී ඇති අර්ථයම ඇත්තේය".

**36**. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ "දේපළ" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"පළාත් සභාව යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව යටතේ පළාතක් සඳහා පිහිටුවන ලද යම් පළාත් සභාවක් අදහස් වේ.

**37**. (1) මේ පනතේ 3(1) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට කරන ලද සංශෝධනය 1987 නොවැම්බර් මස 14 වන දින සිට බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(2) මේ පනතේ 5 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 (අ) වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් මස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(3) මේ පනතේ 6 (2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් මස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(4) මේ පනතේ පිළිවෙළින් 8 වන වගන්තියෙන් සහ 9 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 17ඊ වගන්තියට හා 17උ වගන්තියට කරන ලද සංශෝධන 1990 නොවැම්බර්මස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(5)මේ පනතේ 17 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 32 (3ආආ) වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් ඔස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සළකනු ලැබිය යුතුය.

(6) මෙ පනතේ 21 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 (1ඇ) වගන්තියට කරන ලද සංශෝධනය 1990 නොවැම්බර් ඔස 29 වන දින සිට බලාත්මක වූ ලෙස සියළු කාර්ය සඳහා සළකනු ලැබිය යුතුය.

**38.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනු කූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## 1991 අංක 52 දරන ආරක්‍ෂක බදු පනත

[සහතිකය සටහන් කළේ 1991 දෙසැම්බර් මස 21 වන දින]

1992 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භවන වර්ෂය සඳහා ආරක්ෂක බද්දක් පැනවීම සඳහා ද, ඒ බද්ධ අයකර ගැනීම සම්බන්ධයෙන් 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ විධිවිධාන අදාළ කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැළැස්වීම සඳහා වූ පනතකි.

**1.** මේ පනත 1991 අංක 52 දරන ආරක්ෂක බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) මේ පනත-

(අ) යම් භාණ්ඩයක් සාදන්නකුගේ ව්‍යාපාරය කරගෙන යන;

(ආ)ශ්‍රී ලංකාවෙන් පිටත සැදනු ලැබූ යම් භාණ්ඩයක් ආනයනය කරන ; හෝ

(ඇ)රක්ෂණ හෝ බැංකු ව්‍යාපාර හෝ මුදල් කටයුතු කරගෙන යන;

සෑම තැනැත්තකුටම අදාල වන්නේය

(2) (1) වන උපයවගන්තියෙහි සඳහන් සෑම තැනැත්තකුම, මේ පනතෙහි මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**3**. (1) මේ පනතේ පසුව එලඹෙන විධිවිධාවලට යටත්ව, මේ පනත අදාල වන සෑම තැනැතකුගෙන්ම (මේ පනතේ මින් මතු "අදාල කාර්තුවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) 1992 ජනවාරි මස 1වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා පිරිවැටුම් බදු පනතේ 5 වන වගන්තියේ අර්ථානුකූලව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුපෙන් සියයට එකකට සමාන (මේ පනතේ මින් මතු "බද්ධ" යනවෙන් සඳහන් කරනු ලබන) ආරක්ෂක බද්ධක් අය කරනු ලැබිය යුතුය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, මේ පනතේ කාර්ය සඳහා මේ පනත අදාල වන තැනැත්තකුගේ පිරිවැටුමට-

(අ) ඒ තැනැත්තා විසින් සාදන ලද යම් භාණ්ඩයක් ඒ තැනැත්තා විසින් අපනයනය කිරීමෙන් ලැබෙන මුදල

(ආ) අපනයන කිරීම සඳහා යම් භාණ්ඩයක් සෑදීමෙහිලා ඒ තැනැත්තා විසින් පාවිච්චි කිරීම සඳහා පමණක්' ඒ තැනැත්තා විසින් ආනයනය කරනු ලැබූ පිරියත යන්ත්‍රෝපකරණ හෝ තිරවුරු නොවන යම් භාණ්ඩයක වටිනාකම සහ

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත දී සාදන ලද යම් භාණ්ඩයක්, ඒ භාණ්ඩය ආනයනය කරන තැනැත්තා විසින් විකිණීමෙන් ලැබෙන මුදල

ඇතුළත් වනතේ යයි සලකනු නොලැබිය යුතුය.

**4.** 5 6 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනත අදාල වන සෑම තැනැත්තකු විසින්ම තමා සම්බන්ධයෙන් කිසීම තක්සේරුවක් කර නොමැති වුවද, යම් අදාළ කාර්තුවක් සඳහා ඔහු විසින් ගෙවිය යුතු බදු මුදල පහත දැක්වෙන ආකාරයෙන් වාරික තුනකින් කොමසාරිස් ජනරාල් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(අ) ඒ කාර්තුවේ දෙවන මාසයේ පසළෝස්වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුපෙන් සියයට එකකට සමාන මුදලක්

(ආ) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පසලොස්වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ දෙවක මාසය සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුපෙන් සියයට එකකට සමාන මුදලක්; සහ

(ඇ) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිවම එලඹෙන මාසයේ පහළොස්වන දින හෝ එදිනට පෙර, (අ) ඡේදයේ සහ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් ගෙවන ලද මුදල්වල එකතුව, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලෙන් අඩු කරනු ලැබූ මුදල.

**5.** (1) සෑම බැංකුවක් විසින්ම–

(අ) භාණ්ඩයක් ආනයනකරුවකු වන්නා වූ. මේ එනත අදාළවන යම් තැනැත්තකු විසින්, තත්කාර්යය සඳහාකරනු ලබන ඉල්ලීමක්මත අදාල කාර්තුවක යම් මාසයකදී බැංකුව ණයවර ලිපියක් විවෘත කැරන අවස්ථාවේ දී, ඒ ණයවර ලිපියෙහි වටිනාකමින් ස්යයට එකකට සමාන මුදලක් ඒ තැනැත්තාගෙන් එකතු කරනු ලැබිය යුතුය.

(ආ) එසේ එකතු කරන ලද මුදල, ඒ මුදල් එකතු කරනු ලැබුවේ යම් මාසයකදීද ඒ මාසයට ඉක්බිතිවම එලඹෙන මාසයේ පසලොස්වන දිනට හෝ එදිනට පෙරකොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක එසේ නියම කරනු ලබන යම් විස්තර ඇතුළත් ප්‍රකාශයක්ද සමග, නොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රෙෂනය කරනු ලැබිය යුතුය.

(ආ) එසේ එකතු කරන ලද මුදල, ඒ මුදල් එකතු කරනු ලැබුවේ යම් මාසයකදීද ඒ මාසයට ඉක්බිතිවමඑලඹෙන මාසයේ පසලොස්වන දිනට හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන යම් ආකෘතියක එසේ නියම කරනු ලබන යම් විස්තර ඇතුළත් ප්‍රකාශයක්ද සමග, තොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රෙෂනය කරනු ලැබිය යුතුය.

(2) 61) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව යම මුදලක් එකතු කරන සෑම බැංකුවක් විසින් ම, ඒ මුදල එකතු කරනු ලැබුවේ යම් ණයවර ලිපියක් සම්බන්ධයෙන්ද, ඒ ණයවර ලිපියට අදාල ආනයන ඉන්යෙවායිස් පත්‍රය මත, එසේ එකතු කරන ලද මුදල සඳහන් කරමින් පිටසනක් කළ යුතුය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, මේ පනත අදාළ වන යම් තැනැත්තකුගෙන් යම් බැංකුවක් විසින් එකතු කරනු ලැබූ යම් මුදලක්, ඒ මුදල බැංකුව විසින් එකතු කරනු ලැබූ දිනයෙහි ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතරඒ මුදලඒ තැනැත්තා විසින් ගෙවනු

ලැබුයේ යැයි සලකනු ලැබුයේ අදාල කාර්තුවක් සඳහාද ඒ අදාළ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්දට ප්‍රතිපක්ෂව හිලව් කරනු ලැබිය යුතුය.

(4) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානප යටතේ යම් බැංකුවක් විසින් එකතු කරනු ලැබූ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීම සහා වී බැංකුව විසින් දරනු ලබන යම් මුදලක්, ඒ බැංකුව වස්තු භංගත්වයට පත්වීමේ දී ඈවර කිරීමේ දී, හෝ විසුරුවා හැරීමේ දී ක්‍රියාවේ යොදනු ලැබීමට හෝ අද්මිනිස්ත්‍රාසි කරනු ලැබීමට හෝ ණය හිමියන්ගේ ප්‍රතිලාභය සඳහා පවරනු ලැබීමට යටත් ඒ බැංකුවේ දේපළ නොවන ලෙස සලකනු ලැබිය යුතුය. තවද ඒ මුදල, ඒ බැංකුව වස්තුභංගත්වයට පත් වීමේදී ඈවර කිරීමේ දී හෝ පැවරීමේ දී බූදලයෙන් වෙන්ව තිබිය යුතු අතර, ඒ බූදලයේ කොසක් වශයෙන් සංයුක්ත නොවිය යුතුය.

(5) මේපනත අදාළ වන යම් තැනැත්තකුගෙන් මේ වගන්තිය යටතේ ඒ ගැනැත්තාගෙන් එකතුකරනු ලැබීමට නියම කරනු ලැබූ යම් මුදලක් එකතු කිරීම යම් බැංකුවක් විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, හෝ යම් බැංකුවක් විසින් ඒ යම් බැංකවක් විසින් ඒ මුදල එකතු කරනු ලැබ, එසේ එකතු කරනු ලැබූ මුදල, ඒ මුදල එකතු කරනු ලැබුවේ යම් මාසයකදීද ඒ මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පසළොස්වන දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොමැති අවස්ථාවක, මේ වගන්තියේ විධිවිධාන යටතේ එකතු කිරීමට ඒ බැංකුවට නියම කරනු ලැබුවා වූ එහෙත් එකතු කරනු නොලැබුවාවූ මුදලට නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, එකතුකරනු ලැබ කොමසාරිස් ජනරාල්වරයාවෙත ප්‍රේෂණය කරනු නොලැබූ මුදලට හෝ එහි කොටසට ඒ බැංකුව යටත් විය යුතුය. තවද අවස්ථාවෝචිත පරිදි එකතුකරනු නොලැබූ හෝ එකතුකරනු ලැබ ප්‍රේෂනය කරනු නොලැබූ යම් මුදලක් ඒ මුදල කොමසාරිස්ජනරාල් වරයා වෙත ප්‍රේෂණය කරනු ලැබීමට නියම කරනු ලැබුයේ යම් දිනයකද ඒ දිනයට පසු වවූ දින සිටගෙවීම පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතරඒ දින සිට ඒ බැංකුවගෙවීම් පැහැර හරිනු ලැබුවකු ලෙසසලකනු ලැබිය යුතුය.

**6.** යම් භාණ්ඩයක් සැදීමේ ව්‍යාපාරය කරගෙන යන තැනැතතකු වන්නා වූ මේ පනත අදාළ වන යම් තැනැත්තකු විසින් ( යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක් හෝ තිරවුරු හැර) යම් භාණ්ඩයක් ආනයනය කිරීම සම්බන්ධයෙන් වූ බද්ද යම් කාර්තුවකදී ගෙවා ඇති අවස්ථාවකසාදන්නා හෝ ඒ ස්ථානය හෝ සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්දෙන් එසේ ගෙවන ලද බද්දේ ප්‍රමාණය අඩු කිරීමට ඔහුට හිමිකම ඇත්තේය!

**7.** (1) මේ පනත අදාළ වන තැනැත්තකු විසින් යම් අදාළ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්ද, ඒ බද්ද හෝ එහි යම් කොටසක් ගෙවීම සඳහා 4 වන වගන්තියෙහි සඳහන් වන දින හෝ එදිනට පෙර ගෙවා නොමැති අවස්ථාවක බදු මුදල් හෝ එහි කොටස ඒ දින සිට ගෙවීම පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ මුදල ගෙවිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ ඒ මුදල එක් තැනැත්තකුට වැඩි ගණනක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු- අවස්ථාවක, ඒ එක් එක් තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ පනතේ කාරර්ය සඳහා ඒ දින සිට ගෙවීම පැහැර හරිනු ලැබුවකු ලෙස සලකනු ලැබිය යුතුය.

(2) 5 වන වගන්තිය හෝ මේ වගන්තිය ක්‍රියාත්මක වීමෙ හේතුවෙන් යම් බද්දක් හෝ එහි කොටසක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති බද්දට හෝ එහි කොටසට අතිරේකව-

(අ) ගෙවීම පැර හරිනු ලැබූ බද්දෙන් හෝ එහි කොටසින් සියට දහයකට සමාන මුදලක්; සහ

(ආ) ගෙවීම පැහැර ඇති යම් බද්දක් හෝ එහි කොටස, ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයකදී ද ඒ මසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පසළොස්වන දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක, ගෙවීම පැහැර හැර  තිබෙන කාලසීමාවේ එක් එක් පසුව එළඹෙන මාසයේ හෝ එහි කොටසෙහි පසලොස්වන දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව සම්බන්ධයෙන් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන මුදලක් දණ්ඩනයක් වශයෙන් ගෙවනු ලැබිය යුතුය;.

එසේ වුවද, මේ උපවගන්තිය යටතේ දණ්ඩනයක් වශයෙන් ගෙවිය යුතු මුළු, මුදල ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් හෝ එහි කොටසින් සියයට පනහක් කිසිම අවස්ථාවකදී නොයුක්ම විය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදුවූ යම් විශේෂ අවස්ථාගත කරුණු හේතු කොටගෙන ඒ මුදල අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ හා සාධාරණීය බවට කොමසාරිස් ජනරාල්වරයා  සෑහීමට පත්වන්නේ නම්, එවැනි යම් මුදලක් අත් හැරීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකිය.

**8**. වාර්තා සැපයීමට, තක්සේරු කිරීමට, තක්සේරු කිරීමට විරුද්ධව කරනු ලබන අභියාචන, තක්සේරුවල නිශ්චිත භාවය සහ වැරදි වාර්තා සඳහා දඩුවම්, පිරිවැටුම් බදු අයකර ගැනීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන් අදාළ පිරිවැටුම් බදු පනතේ ඪ වන VIII වන, IX වන, ඩ වන සහ XII වන පරිච්ඡේදවල විධිවිධාන, පිරිවැටුම්බදු පනත යටතේ විශේෂ අවස්ථා විවිධ කරුණු සහ වැරදි හා දණ්ඩන සම්බන්ධයෙන් අදාල  ඩෂ වන පරිඡ්ඡේදනෙය්, (44 වන සහ 45 වන වගන්තිවල විධිවිධාන හැර), XIII වන පරිච්ඡේදයේ සහ XVI පරිච්ඡේදයේ විධිවිධාන  සහ පිරිවැටුම් බදු පනත පරිපාළනය කිරීමට අදාළ XVIII වන පරිඡ්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වාර්තා සැපයීම, තක්සේරුකිරීම,තක්සේරු කිරීමට විරුද්ධව කරනු ලබන අභියාචන, තක්සේරුවල නිශ්චිතභාවය සහ වරදි වාර්තා සඳහා දඩුවම, බද්ද අයකර ගැනීම සහ ආපසු ගෙවීම සහ විශේෂ අවස්ථා, විවිධ කරුණු , වැරදි සහ දණ්ඩන සම්බන්ධයෙන් පහත දැක්වෙන සුළු වශයෙන් වූ වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ විය යුතු ය.;

(අ) මේ පනත අදාළ  වන තැනැත්තකු වෙත, සෑම අදාළ කාර්තුවක් සඳහා මේ පනත යටතේ ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු  බද්ද සම්බන්ධයෙන් පිරිවැටුම පිළිබඳ වාර්තාවක් සැපයීමට මේ පනතින් පනවන ලද නියමය, ඒ කාරතුව සඳහා ඒ තැනැත්තාගේ පිරිවැටුම රුපියල් විසි පන්දහසක අඩු වුවද, අදාළ විය යුතු ය.

(ආ) (අ) ඡේදයෙහි සඳහන් යම් කාර්තුවක් සඳහා පිරිවැටුම් බදු පනත යටතේ යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම සම්බන්ධයෙන්, මේ පනත අදාළ වන යම් තැනැත්තකු මත තක්සේරුවක් හෝ අතිරේක තක්සෙරුවක් තක්සේරු කරුවකු විස්න කරනු ලබන අවස්ථාවක, ඒ තක්සේරු කරු විසින් ඒ අවස්ථාවේ දී ම හා ඒ අකෘතියෙහිම මේ පනත යටතේ ඒ වර්ෂය  සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බද්ද සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලැබිය හැකිය. අවස්ථාවෝචිත පරිදි තක්සේරුකිරීම් හෝ අතිරේක තක්සේරු කිරීම් ඒ ඒ පනත් යටතේ නිකුකරන ලද වෙන වෙනම වූ තක්සෙරු කිරීම් ලෙස සලකණු ලැබිය යුතුය;

එසේ වුවද, පිරිවැටුම් බදු පනත යටතේ යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවක් හෝ ඩඅතිරේක තක්සේරුවක් ඒ අවස්ථාවේදීම නොකර, තක්සේරුකරුවකු විසින්, මේ පනත අදාළ වන යම් තැනැත්තකු වෙත, ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ යම් අදාළ කාර්තුවක් සඳහා ගෙවිය යුතු බද්ද සම්බන්ධයෙන් යම් තක්සේරුකිරීමක් හෝ අතිරේක තක්සේරු කිරීමක් කරනු ලැබිය හැකිය ; තවද

(ඇ) පිරිවැටුම් බදු පනතේ VII වන පරිච්ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ හෝ යම් තැනැත්තකු වෙත දැන්වීමක්, ප්‍රකාශයක් හෝ සහතිකයක් නිකුත් කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ දැන්වීමෙහි, ප්‍රකාශයෙහි හෝ සහතිකයෙහි, මේ පනත යටතේ පැහැර හැර ඇති යම් බද්දක් වේතොත් ඒ බද්ද සම්බන්ධයෙන් විස්තරද ඇතුළත් කරනු ලැබිය හැකිය. ඒ දැන්වීම්, ප්‍රකාශ හෝ සහතික ඒ ඒ පනත යටතේ නිකුකරන ලද වෙන වෙනම වූ දැන්වීම්, ප්‍රකාශ හෝ සහතික ලෙස සලකනු ලැබිය යුතු ය.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"භාණ්ඩය", "තක්සේරුකරු", "ව්‍යාපාරය", "කොමසාරිස් ජනරාල්වරයා", "තැනැත්තා" සහ "කාර්තුව" යන යෙදුම්වල, පිරිවැටුම් බදු පනතේ ඒවාට පිළිවෙලින් දී ඇති අර්ථම ඇත්තේය;

"බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍ර ලත් වාණිජ බැංකුවක් අදහස් වේ;

"බැංකුකරු" යන්නෙන් , බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"ආනයනකළ" යන්නෙහි පිරිවැටුම් බදු පනතේ "සාදන්නා" යන අර්ථකථනයේ ("ඊ") යන ("උ") ඡේදවල ඊට දී ඇති අර්ථය ඇත්තේයත

"සාදන්නා" යන්නෙහි, පිරිවැටුම් බදු පනතේ "සාදන්නා" යන අර්ථකථනයේ (අ), (ආ), (ඇ),

(ඈ) සහ (ඉ) ඡේදවල ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය;

"පිරිවැටුම් බදු පනත" යන්නෙන් 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත අදහස් වේ.

## 1991 අංක 53 දරන විසර්ජන පනත

[සහතික සටහන් කළේ 1991 දෙසැම්බර් මස 21 වන දින]

"1992 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද ඒ සේවා කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුල හෝ ඉන් බැහැර හෝ ණය ලබාගැනීමට බලය දීම සඳහාද., ඒ මුදල් වර්ෂය තුල ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුල වියදම් සඳහා අවශ්‍යවන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුනු සඳහා ද, විධිවිධාන සැලසීමක් සඳහා දවු පනතකි

1. මේ පනත 1991 අංක 53 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) යම් වියදමකට බලය දෙන්නා වූ වෙනයම් නීතියකට හානියක් නොමැතිව මේ පනතෙහි "1992 මුදල්වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1992 ජනවාරි මස01 වන දිනයෙන් ආරම්භ වී 1992 දෙසැම්බර් මස 31 වනදිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යැයි ඇස්තමේන්තු කර ඇති රුපියල් දහදහස් දෙසීය පනස් පත්කෝටි දහතුන් ලක්ෂ හැටදහස් දහයක් විය යුතු ආණ්ඩුවේ වියදම්

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම්වලින්; හා

(ආ) ණය වශයෙන් ලබාගන්නා මුදල්වල සමස්ථය රුපියල් හයදහස් නවසිය විසිනමකෝටි පනස් ලක්ෂ දහයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින් පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් දසදහස් දෙසීය පනස්පත් කෝටි දහතුන් ලක්ෂ හැටදහස්දහයක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැයකළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබාගැනීමට බලය දෙනු ලබන වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතුය.

**3.** 1992 මුදල් වර්ෂය තුලදී මේපනතෙහි දෙවන උප ලේඛණයේ 1 වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් ඒ කටයුත්තේ ගිණුමට බැරකළ යුතු අතර එසේ බැර කරනු ලැබූ ලැබීම් වල එකතුව ඒ උපලේඛනයේ III වන තිරයේ අනුරූපී සටහනෙහි දැක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම් එය 1992 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශුද්ධ අතිරික්තය නිශ්චය කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ගෙවීම්, එනම් :-

(අ) යම් කටයුත්තක ආදායමට අය විය යුතුව, නිසිඅයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ හෝ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන සහ වෙනත් වියදම් ; සහ

(ආ) යම් කටයුත්තක චංචල හා නිශ්චල දේපළ ක්ෂය වීම ආවරණය සඳහා ප්‍රතිපාදන ඒ එක් එක් කටයුත්තේ ආදායමින් අඩුකළ යුතුය.

ලියාපදිංචි වූ කොටස් හිමියකුට හිමිකම් ඇති හෝ එවැනි කොටස් හිමියකු යටත් වියයුතු සියලු යුතුකම්වලට සහ බැඳීම්වලට ඔහු යටත් විය යුතුය."

මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(3) මේ පනතේ දෙවන උප ලේඛනයේ 1 වන තිරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1992 මුදල් වර්ෂය තුල ආණ්ඩුව විසින් දරනු ලබන වියදම, ඒ මුදල් වර්ෂය තුලදී ඒ කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතුය.එහෙත් ඒ වියදම් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(4) මේ පනතේ දෙවන උප ලේඛනයේ 1 වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තක්සම්බන්ධයෙන් 1992 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය ඒ උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොයික්ම විය යුතුය.තවද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී ඒකටයුත්තේ මුළු බැරකම් ඒ උපලේඛනයේ V වන තීරයෙහි අනුරූපී සටහනේ දැක්වෙන උපරිම සීමාව නොයික්මවිය යුතුය.

**4.** 1992 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහ දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුව ලබන ලැබීම්, ඒකටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේනම්, ඒ වියදම් පියවීම සඳහා අවශ්‍ය යැයිඅමාත්‍යවරයා සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවේ සුදුස්සක් කළහැකි හෝවෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යැයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එසේ වුවද, එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල් වල එකතුව ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූපී සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය ඒකටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

**5.** (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට ඒ උපලේඛනයේ විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද මුදල් කිසිවක්, ඒ වැඩ සටහනේම මූලධන වියදමේ මුදල් වෙන් කිරීමකට ඒ ශීර්ෂයේම වෙනයම් වැඩසටහනක් යටතේ පුනරාවර්තන වියදම් හෝ මූලධන වියදම් හෝ මුදල් වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම වැඩසටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරනලද කිසිම මුදලක් ඒ මුදල් වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම බලාපොරොත්තු වූ මුදල් වලට වඩා අඩු විය හැකි බවට හෝ

(2) යම් විශේෂ කාර්යයක් සඳහා හෝ කාර්ය සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරිනලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝඉවත්කර ගැනීම, අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමැතිය ඇතිව කරනු ලැබිය හැකිය.

**7.** අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව-

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තිරයෙහි IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දැක්වෙන උපරිම සීමා අතුරින් කිසිවක්

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දැක්වෙන අවම සීමා,

නියමයක් මගින් 1993 මැයිමස 31 වන දින හෝ එදිනට පෙර වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් එය අනුමත කර ඇත්නම් මිස, බල නොපැවත්විය යුතුය.එවැනි යම් නියමයක් කරනු ලබන්නේ යම් දිනයකද, ඒ දිනයට පෙරාතුව වූ දිනයක සිට එය බලාත්මක විය යුතු යැයි එහි ප්‍රකාශිතවම සඳහන් වන්නේ නම් එසේ ප්‍රකාශිතව සඳහන් වන දින සිට එය බලාත්මක වූ ලෙස සැළකිය යුතුය.

**8.** පාර්ලිමේන්තුව විසින්, යෝජනා සම්මතයක් මගින් මේ පනතෙහි දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ-

(අ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක්

(ආ) ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළහැකිය.

**9.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## නියෝගය

**1. මේ නියෝග 1991 අංක 2 දරණ හදිසි අවස්ථා (බැංකු විශේෂ විධිවිධාන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.**

2. ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද්දාවූ බලපත්‍රලාභී යම් වාණිජ බැංකුවකට ශ්‍රී ලංකාව තුල ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට නොහැකි යයි හෝ (මෙහි මින්මතු "පැහැර හැරි බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රලාභී ඒ වාණිජ බැංකුව සමග ගනුදෙනු කලා වූද, කරන්නාවූද එහි තැන්පත් කරුවන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ ඉල්ලීම් ඉටුකරලීමට නොහැකි යයි එහි ව්‍යාපාරික කටයුතු නොකඩවා කරගෙන යාමේදී දරුණු ආර්ථිකයට හානිකර අන්දමින් බලපාන්නේ යයිද, ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් කරන ලබන වාර්තාවක් මත, (මෙහි මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සෑහීමට පත් වූ විට, වෙනත් යම් නීතියක විධිවිධාන වල පටහැනිව කුමක් සඳහන් වුවද, මණ්ඩලය විසින් ඒ පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටයුතු ඒ පිළිබඳ කැමැත්තක් දක්වන (මෙහි මින්මතු "අත්කර ගැනීමේ බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍ර ලාභී වෙනත් වාණිජ බැංකුවක් වෙත පැවරීම, ගැසට් පත්‍රයේ පලකරනු ලබන ආඥාවක් මගින් කරනු ලැබිය හැකිය.

3. (1) මණ්ඩලය විසින්,

(අ) පැහැර හැරි බැංකුවේ තැන්පත් කරුවන් සහ ණය හිමියන් සම්බන්ධයෙන් වූ බැරකම් පියවීමෙන් එහි ව්‍යාපාරික කටයුතු නිසි ආකාරයෙන් කරගෙන යෑමේ හැකියාව යෝජිත අත්කර ගැනීමේ බැංකුවට ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වෙනොත්,

(ආ) පැහැර හැරි බැංකුවේ පවත්නා වත්කම් භාවිත කළ යුතු සහ පැහැර හැරි බැංකුවේ පවත්නා බැරකම් පිරිමැසිය යුතු ආකාරයට අදාලව මණ්ඩලය විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට යෝජිත අත්කර ගැනිමේ බැංකුව ලියවිල්ලක් මගින් එකග වෙනොත්

මිස, 2වන වගන්තිය යටතේ වූ කිසිම නියමයක් කරනු නොලැබිය යුතුය. මණ්ඩලය විසින්, වෙනත් දේ අතර, ස්වෛරී ආණ්ඩුවකට පැහැර හැරි බැංකුව විසින් කල යුතු ගෙවීම් කිරීමේ ආකාරය සහ පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටුයුතු අත්කර ගැනීමේ බැංකුව වෙත පැවරීම නිසා ගෙවිය යුතු යම් වන්දියක් වෙනොත්, එය ගෙවීමේ ආකාරය පිළිබඳ එම නියම හා කොන්දේසි ද සඳහන් කරනු ලැබිය හැකිය.

(2) 2වන නියෝගය යටතේ යම් නියමයක් කරනු ලැබූ විට -

(අ) මෙම නියෝගයේ (1) වන ජේදය යටතේ මණ්ඩලය විසින් සඳහන් කරනු ලැබිය හැකි නියම හා කොන්දේසි වලට සහ මණ්ඩලය විසින් නීත්‍යානුකූලව දෙනු ලැබිය හැකි වෙනත් යම් විධාන වලට අනුකූලව අත්කර ගැනීමේ බැංකුව විසින් කටයුතු කරනු ලැබිය යුතුය.

(ආ) පැහැර හැරි බැංකුව විසින් ශ්‍රී ලංකාව තුල ව්‍යාපාරික කටයුතු කරගෙන යාම නතර කරනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකාව තුල ව්‍යාපාරික කටයුතු කරගෙන යාම සඳහා යම් නීතියක් යටතේ එයට අවසර දෙමින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් නියමයේ දින පටන් අවලංගු වූ ලෙස සළකනු ලැබිය යුතුය.

4 2 වන නියෝගය යටතේ යම් නියමයක් කරනු ලැබූවිට, පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටයුතු අත්කර ගැනීමේ බැංකුව වෙත සතුවන අතර පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටයුතු වල නීතිඥානුකූල පාලනය හා සන්තකය ඒ සතු වීමේ දින සිට සහ ඉන් පසුව අත් කර ගැනීමේ බැංකුව සතුවිය යුතු අතර ඒ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් අත්කර ගැනීමේ බැංකුව පැහැර හැරි බැංකුවේ පැවැරුම්ලාභියා විය යුතුය.

5. යම් නීතියක හෝ මේ යටතේ වූ වෙනත් යම් නියෝගයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, පැහැර හැරි බැංකුවේ යම් විදේශ ව්‍යවහාර මුදල් තැන්පත් කරුවෙකුගේ ඉල්ලීම පියවීමට අත්කර ගන්නා බැංකුවේ ඇති බැඳීම, අත්කර ගන්නා බැංකුවට එම ව්‍යවහාර මුදල් තැන්පතු ලබාදී නොමැති අවස්ථාවකදී එම තැන්පත් කරුවන්ට සහන සැලසීම සඳහා, පැහැර හැරි බැංකුවේ ව්‍යාපාර කටයුතු සමාලෝචනය කර මණ්ඩලය විසින් සකස් කරනු ලැබිය හැකි. යම් වැඩ පිළිවෙලක නියමයන් හා කොන්දේසි පිළිගැනීමට එකග වන තැන්පත් කරුවන් සම්බන්ධයෙන් පමණක් අදාල විය යුතුය.

6. පැවරීමේ දිනට පෙරතුවුම පැවතිය වූ හෝ බලාත්මක වූද, පැහැර හැරි බැංකුව පාර්ශව කරුවෙකු වූ හෝ පැහැර හැරි බැංකුවේ වාසියට ඇත්තාවූද, පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටයුතු වලට සම්බන්ධ වන්නාවූ හෝ අදාල වන්නා වූ පැහැර හැරි බැංකුව විසින් නිශ්චල දේපල පිළිබඳ අයිතිය අත්කර ගනු ලබන සාධන පත්‍ර නොවන, සියලු කොන්ත්‍රාත්තු, ඔප්පු, බැඳුම් කර, ගිවිසුම්, ඇටෝනි බලතල, නීතිනියෝජන කවර වූ හෝ ස්වභාවයේ වෙනත් සාධන පත්‍ර අත් කර ගැනීමේ බැංකුවට එරෙහිව හෝ එහි වාසියට පූර්ණ බලයක් ඇතිව, බලාත්මක වියයුතු අතර, ඒවා පැහැර හැරි බැංකුව වෙනුවට අත්කර ගැනීමේ බැංකුව පාර්ශවයක් වූ ලෙස හෝ අත්කර ගැනීමේ බැංකුවේ වාසියට නිකුත් කරන ලද ලෙස හෝ සලකා පූර්ණ හෝ බලාත්මක ආකාරයෙන් බලාත්මක කල යුතුය, නැතහොත් ක්‍රියාත්මක කළ යුතුය.

7. 2 වන නියෝගය යටතේ කරන ලද යම් නියමයන් මගින් පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටයුතු අත්කර ගැනීමේ බැංකුවට පැවරූ දින, පැහැර හැරි බැංකුවේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් පැහැර හැරි බැංකුව විසින් හෝ ඊට එරෙහිව පවරන ලද කවර ස්වභාවයේ හෝ යම් නඩුවක් හෝ අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක් විනිශ්චයට භාජනව ඇති අවස්ථාවක ඒ පැවරීමේ හේතුවෙන් එය නතර කිරීම, අත්හිටුවීම හෝ යම් ආකාරයක හානිකර බලපෑමක් ඇතිකිරීම නොකල යුතුය. එහෙත්, ව්‍යාපාරික කටයුතු පැවරීමේ දින පටන් ඒ නඩුව අභියාචනය හෝ වෙනත් නඩු කටයුත්ත අත්කර ගැනීමේ බැංකුව විසින් හෝ ඊට එරෙහිව නොකඩවා පවත්නා ගෙන යාම, පැවරීම සහ බලාත්මක කිරීම කරනු ලැබිය යුතුය.

8. පැහැර හැරි බැංකුව සම්බන්ධයෙන් යම් නීතියක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව ආරම්භ කරන ලද යම් ඇවර කිරීමේ හෝ ගණන් බේරා වසා දැමීමේ නීති කෘත්‍යවල පටහැනිව කුමක් සඳහන් වුවද, ශ්‍රී ලංකාව තුල ඒ පැහැර හැරි බැංකුවට අයත් යම් තිශ්චල දේපලක හිමිකම් අයිතිය අත්සතු කිරිම හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීම ශ්‍රී ලංකාවෙන් බැහැර ඇත්තාවූද 2 වන නියෝගය යටතේ කරන ලද නියමයන් ප්‍රකාර අත්කර ගැනීමේ බැංකුව වෙත පවරන ලද්දාවූද වත්කම්, පැහැර හැරි බැංකුව විසින් අත්කර ගැනීමේ බැංකුව වෙත ලබාදෙන තුරු ඒ පැහැර හැරි බැංකුවට තහනම් කරනු ලැබිය යුතුය.

9. මෙම නියෝග වල කාර්ය සඳහා -

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, පැහැර හැරි බැංකුවට අදාළව

"ව්‍යාපාරික කටයුතු" යන්නෙන්, පැහැර හැරි බැංකුවේ අක්වෙරළ බැංකු ව්‍යාපාරික කටයුතු නොමැතිව, ශ්‍රී ලංකාවේ පැහැර හැරි බැංකුව සතු ව්‍යාපාරය අදහස් වන අතර, -

(i) පැහැර හැරි බැංකුවේ මෙරට බැංකු ව්‍යාපාර කටයුතු:

(ii) පවරනු ලැබූ දිනට පෙරාතුවම වූ දින පැහැර හැරි බැංකුවට අයත් වූද ශ්‍රී ලංකාව තුල ඇති ඒ ව්‍යාපාරයේ කාර්ය (මුදල් ශේෂය සංචිත අරමුදල්, ආයෝජන සහ තැන්පතු ඇතුළුව) සඳහා භාවිතා කරන ලැබූවාවූද (නිශ්චල දේපළ නොවන) සියළු දේපළ

(iii) (උකස් කර යටතේ වූ බඳු අයිතිවාසිකම් කුලී නිවැසි අයිතිවාසිකම් ඇතුළුව, එහෙත් නිශ්චල දේපළ වල හිමිකම් වලින් ඇතිවිය හැකි අයිතිවාසිකම් නොමැතිව) පැවරීමේ දිනට පෙරතුවම වූ දින පැහැර හැරි බැංකුවකට අයත් වූ යම් චංචල හෝ නිශ්චල දේපළකින් හෝ දෙපළක් නිසා ඇතිවන සියළුම අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර සහ සම්බන්ධතා:

(iv) 5වන නියෝගයට යටත්ව ශ්‍රී ලංකාව තුල ඇති පැහැර හැරි බැංකුවේ සියළු බැරකම්: සහ

(v) ශ්‍රී ලංකාව තුල ඇති ඒ ව්‍යාපාරයට අදාල හෝ සම්බන්ධ සියළු පොත්, ගිනුම් සහ ලේඛනද

ඊට ඇතුලත් වේ.

"මෙරට බැංකු ව්‍යාපාර කටයුතු" යන්නෙන්, පැහැර හැරි බැංකුවක් සම්බන්ධයෙන් වන විට, ඒ බැංකුවේ අක්වෙරළ ඒකකයේ ව්‍යාපාරික කටයුතු නොවන එහි ව්‍යාපාරික කටයුතු අදහස් වේ.: "බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට, 1988 අංක 30 දරන බැංකු පනතේදී ඇති අර්ථයම ඇත්තේය:

"අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු" යන්නෙන්, පැහැර හැරි බැංකුවක් සම්බන්ධයෙන් වන විට, 1988 අංක 30 දරන බැංකු පනතේ iv වන කොටස ප්‍රකාර, අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යන ඒ බැංකුවේ අක්වෙරළ ඒකකයේ ව්‍යාපරික කටයුතු අදහස් වේ.